

# ඉස්ලාම්

## ආධුනික මුස්ලිම්වරුන් උදෙසා

### සංෂිප්ත මාර්ගෝපදේශයක්


مركز أصول
Osoul Center
www.osoulcenter.com
Rabwah

# ඉස්ලාම්

## ආධුනික මුස්ලිම්වරුන් උදෙසා

## සංෂිප්ත මාර්ගෝපදේශයක්

Osoul Center
www.osoulcenter.com

ⓒ جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة ، 1446 هـ

أصول ، مركز
الوجيـز: تعليـم صفـي للمسـلم الجديـد باللغـة السـنهالية. / مركـز أصـول - ط 1. .- الريـاض ، 1446 هـ

124 ص ؛ 21 x 29.7 سم

رقم الإيداع: 1446/10340
ردمك: 978-603-8438-79-4

مركز أصول
Osoul Center
www.osoulcenter.com

- මෙම අනුවාදය උක්ත මධ්‍යස්ථානය විසින් සකස් කර නිර්මාණය කරන ලදී.
- මෙම මධ්‍යස්ථානය පිළිබඳ සඳහන් කර පාඨය වෙනස් නොකර ඕනෑම ආකාරයකින් මෙම සංස්කරණය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට උක්ත මධ්‍යස්ථානයේ අනුමැතිය හිමි වේ.
- මුද්‍රණය කිරීමේදී, උසූල් මධ්‍යස්ථානය විසින් අනුමත කරන ලද තත්ත්ව ප්‍රමිතීන් පිළිපැදිය යුතුය.

بسم الله الرحمن الرحيم

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත උත්තරීතර
අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමයෙන්

# පෙරවදන

අපට ඉස්ලාමය වෙත මඟපෙන්වූ ද, සාමයේ මංමාවත් විවර කර දුන්නා වූ ද, මැවීම් අතුරින් ශ්‍රේෂ්ඨතම මැවීම වන දේව දූත මුහම්මද්තුමාණන් (එතුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් අල්ලාහ් දෙවිඳුන්ගේ ශාන්තිය හා සමාදානය අත් වේවා!) අප වෙත යැව්වා වූ ද අති උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ට ම සියලු පැසසුම් හිමි ය. ඉස්ලාමීය ඉගැන්වීම් අවබෝධ කරගැනීමටත් ප්‍රයෝගික ව පිළිපැදීමටත් රුකුලක් වශයෙන්, සත්‍ය දහම වන ඉස්ලාමය පිළිබඳ හඳුන්වා දෙන්නා වූ හා එහි මූලික ඉගැන්වීම් හා ප්‍රයෝගික කරුණු පහදා දෙන්නා වූ මෙම විෂය නිර්දේශය ඔබ වෙත ඉතා සතුටින් පිළිගන්වන්නෙමු. මෙම විෂය නිර්දේෂයෙහි පහත කරුණු ඇතුළත් වේ:

1. ඉස්ලාමය හා එහි ප්‍රධාන මාතෘකා පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.
2. උතුම් අල් කුර්ආනයේ සමහර කෙටි සූරාවන් පිළිබඳ අර්ථ විවරණය හා පොදුවේ උතුම් අල් කුර්ආනය පිළිබඳ දළ සමාලෝචනය.
3. අනිවාර්ය නැමඳුම්වලට අදාළ නීතිරීති පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.
4. ඉස්ලාමයේ සාරධර්ම, චාරිත්‍ර වාරිත්‍ර හා ගනුදෙනුවලට අදාළ නීතිරීති පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.

පාඨමාලා ඒකක අධ්‍යාපන සැලැස්මකට අනුව බෙදා ඇති අතර එහි එක් එක් ඒකකයේ පාඩම් දින හයක් පුරා බෙදා හැර එක් එක් පාඩමේ කාලසීමාව නියම කර ඇත. නවක මුස්ලිම්වරුන්ට නව තොරතුරු කටපාඩම් කිරීමට සහ අවබෝධ කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සහ අභ්‍යාස ගණනාවක් ඇතුළත් අධ්‍යාපනික ආකාරයෙන් පාඨමාලාව සැලසුම් කර ඇත, ඊට අමතරව එක් එක් ඒකකය අවසානයේ ඇගයුම් ප්‍රශ්නවලට අමතරව ඉගෙන ගන්නන්ට ඔවුන්ගේ පාඨමාලාව පිළිබඳ අවබෝධයේ මට්ටම තක්සේරු කළ හැකිය. නව මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට දායක වීමට සහ පාඨමාලාව අවබෝධ කර ගැනීමට ඔවුන්ට උපකාර කිරීමට අදහස් කරන චිත්‍ර කිහිපයක් මෙම පාඨමාලාවට ඇතුළත් වේ. ඒවා පහත පරිදි වේ.

මෙම වර්ණය මෙම තොරතුරු කොටසෙහි වැදගත්කම සහ පාඩම අවසානයේ එයට සම්බන්ධ ප්‍රශ්නයක් ඇතිවීමේ හැකියාව පෙන්නුම් කරයි.

මෙම සටහන පෙළෙහි වචනයක් හෝ වාක්‍ය ඛණ්ඩයක් අර්ථ දැක්වීමක් සහ පැහැදිලි කිරීමක් අදහස් කරයි.

**සාකච්ඡා කරන්න**

මෙය ගුරුවරයා සහ සිසුන් අතර සාකච්ඡා මාතෘකාවක් වන අතර, එහි මාතෘකාව සිසුන්ගේ චින්තනය සහ තර්ක කිරීමේ කුසලතා වර්ධනය කිරීම අරමුණු කරයි.

**අමතර කියවීම**

පාඩමෙහි මාතෘකාවට අදාළව උසූල් මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරන ලද ඉගෙනුම් ආධාරක.

**අභ්‍යාස**

මෙය සිතීම, නිගමනය හා කටපාඩම් කිරීම මත පදනම් වූ පුහුණු ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ.

**මෙම උද්යෝගිමත් අධ්‍යාපනික ගමනට සාදරයෙන් පිළිගනිමු.**

# අධ්‍යාපන සැලසුම

| සැසිය | විෂය අන්තර්ගතය | වේලාව |
|---|---|---|
| **පළමු දිනය** | | |
| පළමු සැසිය | **ආරම්භය:**<br>1. හඳුනාගැනීම හා ඇගවීම්<br>2. පැවැත්ම හා සම්බන්ධ ප්‍රශ්න: අපි කව්ද? අප යන්නේ කොහේ ද?<br>3. හිදායත් (නිවැරදි මඟපෙන්වීම) නැමැති දායාදය | මිනිත්තු 10 |
| | **ඉස්ලාමය:**<br>1. ඉස්ලාමය යනු කුමක් ද?<br>2. මා ඉස්ලාමය වැළඳගත යුත්තේ මන් ද?<br>3. ඉස්ලාමයේ ගෝලීයකරණය<br>4. ඉස්ලාමය පෙර පව් කමා කරයි<br>5. ඉස්ලාමය අවසන් දහම ය<br>6. මුහම්මද්තුමාණන්ගේ වක්‍යත්වය<br>7. ඉස්ලාමයේ ශ්‍රේෂ්ඨත්වයට අදාළ නිර්ණායකය<br>8. දහම ඉගෙන ගැනීම: ඉස්ලාමයේ මූලිකාංග | මිනිත්තු 30 |
| | **ඉස්ලාමය වැළඳගන්නේ කෙසේ ද?**<br>1. ෂහාදා හෙවත් ඉස්ලාමීය විශ්වාසය හා බැඳුණු සාක්ෂි දැරීම් දෙක<br>2. එම සාක්ෂි දැරීම් දෙකෙහි අර්ථය<br>3. එම සාක්ෂි දැරීම් දෙක සඳහා අවශ්‍ය දෑ | මිනිත්තු 20 |
| **විවේකය** | | |
| දෙවන සැසිය | වුළූ කරන්නේ කෙසේ ද? (ප්‍රායෝගික) | මිනිත්තු 20 |
| | සලාතය හෙවත් නැමඳුම ඉටු කරන්නේ කෙසේ ද? (ප්‍රායෝගික) | මිනිත්තු 20 |
| | සූරා අල් ෆාතිහාව කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | මිනිත්තු 20 |

පළමු දින සටහන

.................................................................................................

.................................................................................................

.................................................................................................

.................................................................................................

.................................................................................................

| සැසිය | විෂය අන්තර්ගතය | වේලාව |
| --- | --- | --- |
| | **දෙවන දිනය** | |
| පළමු සැසිය | **ඊමාන් යනු කුමක් ද?**<br>**ඊමානයේ මූලිකාංග:**<br>1. උත්තරීතර අල්ලාහ් පිළිබඳ විශ්වාසය<br>2. මලාඉකාවරුන් පිළිබඳ විශ්වාසය<br>3. දේව ග්‍රන්ථ පිළිබඳ විශ්වාසය<br>4. දේව දූතයින් පිළිබඳ විශ්වාසය<br>5. අවසන් දිනය පිළිබඳ විශ්වාසය<br>6. කලා කද්ර් හෙවත් දේව නියමය පිළිබඳ විශ්වාසය<br>**ඊමාන්හි ඵල:** | මිනිත්තු<br>20 |
| | **උතුම් අල් කුර්ආනය**<br>1. උතුම් අල් කුර්ආනය යනු කුමක් ද?<br>2. උතුම් අල් කුර්ආනය ආත්මය හා මනස පෝෂණය කරයි<br>3. උතුම් අල් කුර්ආනය ජීවන මාර්ගයකි<br>4. උතුම් අල් කුර්ආනයේ සඳහන් දේව දූතවරුන්ගේ කථාන්දර | මිනිත්තු<br>20 |
| | සූරා අල් ඉක්ලාසය කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | මිනිත්තු<br>20 |
| | **විවේකය** | |
| දෙවන සැසිය | **ඉබාදත් හෙවත් නැමඳුම:**<br>1. ඉබාදත් යන්නෙහි අර්ථය<br>2. ඉබාදත් පිළිගනු ලැබීමට අදාළ කොන්දේසි<br>3. ඉබාදත් වර්ග | මිනිත්තු<br>15 |
| | **තහාරා හෙවත් පිරිසිදුකම:**<br>**පිරිසිදුකමෙහි වර්ග**<br>1. ද්‍රව්‍යමය පිරිසිදුකම: පොදුවේ සියල්ල පිරිසිදු යි යන පොදු ඉස්ලාමීය නීතිය, අපිරිසිදු දෑ, අපිරිසිදු දෑ ඉවත් කිරීම, මළ මුත්‍රා පහ කිරීම<br>2. ද්‍රව්‍යමය නොවන පිරිසිදුකම: ආගමානුකූල අපිරිසිදුකමෙන් බැහැර වීම හා ආගමානුකූල අපිරිසිදුකමෙන් බැහැර වීම සඳහා පරිහරණය කරනු ලබන ජලය | මිනිත්තු<br>45 |

**දෙවන දින සටහන**

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

| සැසිය | විෂය අන්තර්ගතය | වේලාව |
|---|---|---|
| | **තෙවන දිනය** | |
| **පළමු සැසිය** | **මා වුළු කරන්නේ කෙසේ ද? (ලිඛිත)**<br>1. වුළුහි අර්ථය<br>2. අප වුළු කරන්නේ කෙසේ ද?<br>3. වුළු නිෂ්ඵල කරන කරුණු<br>4. වුළු අනිවාර්ය කරවන කරුණු<br>5. මේස් මත පිරිමැදීම | **මිනිත්තු**<br>**40** |
| | සූරා අල් ෆලක් කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | **මිනිත්තු**<br>**20** |
| | **විවේකය** | |
| **දෙවන සැසිය** | **මා ස්නානය කරන්නේ කෙසේ ද?**<br>1. ස්නානයෙහි අර්ථය<br>2. අප ස්නානය කරන්නේ කෙසේ ද?<br>3. ස්නානය අනිවාර්ය වන අවස්ථා<br>4. ජුනුබ් තත්ත්වයෙන් පසුවන කෙනෙකුට හරාම් හෙවත් තහනම් වන කරුණු<br>5. තයම්මුම් | **මිනිත්තු**<br>**20** |
| | **හයිල්**<br>1. කාන්තා ශරීරයෙන් බැහැර වන රුධිර වර්ග<br>2. හයිල්, නිෆාස් හා සම්බන්ධ නීතිරීති | **මිනිත්තු**<br>**20** |
| | සූරා අන්නාස් කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | **මිනිත්තු**<br>**20** |

**තෙවන දින සටහන**

| සැසිය | විෂය අන්තර්ගතය | වේලාව |
|---|---|---|
| **සිව්වන දිනය** | | |
| පළමු සැසිය | සූරා අල් කාෆිරූන් කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | මිනිත්තු 20 |
| | **මා සලාතය ඉටු කරන්නේ කෙසේ ද?**<br>1. සලාතය යනු කුමක් ද?<br>2. අප සලාතය ඉටු කරන්නේ මන් ද?<br>3. සලාතයේ තරාතිරම<br>4. සලාතයේ කොන්දේසි<br>5. පස්වේල් සලාතය<br>6. අප සලාතය ඉටු කරන්නේ කෙසේ ද? | මිනිත්තු 40 |
| **විවේකය** | | |
| දෙවන සැසිය | **සලාතය:**<br>1. සලාතය ඉටු කරන ක්‍රමවේදය සම්පූර්ණ කිරීම<br>2. ජුම්ආ සලාතය හෙවත් සිකුරාදා දින සලාතය | මිනිත්තු 60 |

## සිව්වන දින සටහන

| සැසිය | විෂය අන්තර්ගතය | වේලාව |
|---|---|---|
| | **පස්වන දිනය** | |
| පළමු සැසිය | සූරා අල්කව්සර් කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | මිනිත්තු 20 |
| | **සකාත්:**<br>1. සකාත් යනු කුමක් ද?<br>2. අප සකාත් ලබා දෙන්නේ මන් ද?<br>3. සකාත් ලබා දීමේ ක්‍රමවේදය | මිනිත්තු 20 |
| | **උපවාසය:**<br>1. උපවාසය යනු කුමක් ද?<br>2. අප උපවාසයේ නියැලෙන්නේ ඇයි?<br>3. උපවාසය නිෂ්ඵල කරන කරුණු<br>4. රමළාන් මස උපවාසයේ නියැලීම අනිවාර්ය නොවන උදවිය | මිනිත්තු 20 |
| | **හජ් වන්දනාව:**<br>1. හජ් වන්දනාව යනු කුමක් ද?<br>2. අප හජ් වන්දනාව ඉටු කරන්නේ මන් ද?<br>3. හජ් වන්දනාව අනිවාර්ය වන්නේ කවුරුන් හට ද? | මිනිත්තු 20 |
| | **විවේකය** | |
| දෙවන සැසිය | සූරා අල් අස්ර් කටපාඩම් කිරීම හා එහි අර්ථය අවබෝධ කරගැනීම | මිනිත්තු 20 |
| | **ඇඳුම් හා වස්ත්‍ර:**<br>1. ඇඳුම් පිළිබඳ පොදු ඉස්ලාමීය නීතිය<br>2. තහනම් කරන ලද ඇඳුම් | මිනිත්තු 30 |
| | **ආහාර පාන:**<br>1. ආහාර පාන හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය<br>2. තහනම් කරන ලද ආහාර පාන<br>3. කුර්බාන් කිරීමට අදාළ කොන්දේසි<br>4. වෙළඳසැල් හා අවන්හල්වල ඇති මාංස ආහාර පිළිබඳ ඉස්ලාමීය නීතිරීති | මිනිත්තු 30 |

**පස්වන දින සටහන**

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

<table>
<tr><th>සැසිය</th><th>විෂය අන්තර්ගතය</th><th>වේලාව</th></tr>
<tr><td colspan="3">හයවන දිනය</td></tr>
<tr><td rowspan="2">පළමු සැසිය</td><td>මූල්‍ය ගනුදෙනු<br>1. මූල්‍ය ගනුදෙනු යනු කුමක් ද?<br>2. මූල්‍ය ගනුදෙනු හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය<br>3. තහනම් කරන ලද මූල්‍ය ගනුදෙනු</td><td>මිනිත්තු 30</td></tr>
<tr><td>සාරධර්ම හා යහගුණාංග<br>1. ඉස්ලාමයේ සඳහන් සාරධර්ම<br>2. සාරධර්මවල මහිමය හා ශ්‍රේෂ්ඨත්වය<br>3. ඉස්ලාමයේ සාරධර්ම සම්බන්ධ වන ක්ෂේත්‍ර</td><td>මිනිත්තු 30</td></tr>
<tr><td colspan="3">විවේකය</td></tr>
<tr><td rowspan="2">දෙවන සැසිය</td><td>කටපාඩම් කරන ලද සූරාවන් පුනරාවර්ජනය කරගැනීම</td><td>මිනිත්තු 30</td></tr>
<tr><td>වුළූ හා සලාතය ඉටු කරන ක්‍රමවේදය පුනරාවර්ජනය කරගැනීම</td><td>මිනිත්තු 30</td></tr>
</table>

## හයවන දින සටහන

# විෂය මාලාව

## පළමු ඒකකය

### ඉස්ලාම් දහම


1 ඉස්ලාමය හා ප්‍රධාන ප්‍රශ්න 16

2 ඉස්ලාම් දහම 20

3 මුස්ලිම්වරයෙකු බවට පත්වන්නේ කෙසේද? 26

4 ඊමානය හෙවත් විශ්වාසය 30




## දෙවන ඒකකය

### උතුම් අල්-කුර්ආනය


1 උතුම් අල්-කුර්ආනය පිළිබඳ හැඳින්වීම 38

2 කෙටි සූරාවල අර්ථ විග්‍රහය 44




## තෙවන ඒකකය

### නැමඳුම්


1 නැමඳුම හැඳින්වීම 54
2 පවිත්‍රතාවය 58
3 වුළූ කිරීම 62
4 ස්නානය 68
5 ස්ත්‍රීන් හා බැඳි නීතිරීති 72
6 සලාතය 76
7 සකාතය (නියත බද්ධ) 84
8 උපවාසය 88
9 හජ් වන්දනාව 92




## සිව්වන ඒකකය

### ඉස්ලාමීය නීතිරීති


1 ඉස්ලාමීය නීතිරීති 100
2 ආහාරපාන 104
3 මූල්‍ය ගනුදෙනු 108
4 සාරධර්ම 112






පළමු ඒකකය

# ඉස්ලාම් දහම







## ඒකකයේ අන්තර්ගත පාඩම්:

1. ඉස්ලාමය හා මිනිසාගේ පැවැත්ම හා සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න
2. ඉස්ලාමය යනු කුමක් ද?
3. මුස්ලිම්වරයෙකු බවට පත්වන්නේ කෙසේ ද?
4. ඊමානය හෙවත් විශ්වාසය







# පළමු පාඩම

## ඉස්ලාමය හා මිනිසාගේ පැවැත්ම හා සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න

### ප්‍රවේශය

මිනිසාගේ පැවැත්ම හා සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්න පිළිබඳ මිනිස්සු වැඩි අවධානයක් යොමු කරති. එනිසා, මිනිස් ජීවිතයේ යථාර්ථය කුමක් ද? තමන් කොහි සිට පැමිණියේ ද? තමන් මෙහි පැමිණීමට හේතුව කුමක් ද? මරණයෙන් පසු තමන්ට කුමක් සිදු වන්නේ ද? යනාදී ප්‍රශ්න පිළිබඳ මිනිස්සු කල්පනා කරති. එම ප්‍රශ්න සඳහා ඉස්ලාමය ස්ථිර හා පරිපූර්ණ විසඳුම් ලබා දී ඇත.

### පළමු ප්‍රශ්නය

### මිනිස් ජීවිතයේ යථාර්ථය කුමක් ද?

මිනිසා උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ මැවීම් අතුරින් එක් මැවීමක් ලෙස ඉස්ලාමය අර්ථ දක්වයි. අනෙකුත් බොහෝ මැවීම්වලට වඩා උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මිනිසා ශ්‍රේෂ්ඨත්වයට පත් කොට ඇත්තාහ. මෙලොව ජීවිතයේ තමන්ට පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී උපයෝගී කරගැනීම පිණිස උන්වහන්සේ බොහෝ මැවීම් මිනිසාට වසඟ කර දී ඇත්තාහ. මේ පිළිබඳ ව උන්වහන්සේ මෙසේ දේශනා කරති. "තවද සැබැවින්ම අපි ආදම්ගේ දරුවන් ගෞරවයට ලක් කළෙමු. තවද ගොඩබිමෙහි හා මුහුදෙහි අපි ඔවුන් ඉසිලීමු. තවද යහපත් දැයින් අපි ඔවුනට පෝෂණය කළෙමු. තවද අප මැව්වා වූ දැයින් බොහෝ දැට වඩා අපි ඔවුන්ව මහිමයට පත් කිරීමෙන් උසස් කළෙමු." (සූරා අල්ඉස්රා - 70).

මලක්වරු උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ මැවීම් අතුරින් ආලෝකයෙන් නිර්මාණය කරන ලද මැවීමක් වෙති. ඔවුහු උන්වහන්සේට නැමඳුම් කිරීම හා අවනත වීම පිණිස සහජ ගැතිබවකින් යුතු ව මවනු ලැබ ඇත්තෝ ය. උන්වහන්සේ අණට පිටුනොපා, උන්වහන්සේ අණ කරන සියල්ල නොපිරිහෙලා ඉටු කරන්නා වූ අති ගෞරවණීය ගැත්තෝ වෙති. ඔවුන් බොහෝ සංඛ්‍යාවක් ඇතිමුත්, ඔවුන්ගේ නිශ්චිත සංඛ්‍යාව දන්නේ උන්වහන්සේ පමණි.

**උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මිනිසා තුළ පහත කරුණු හා බැඳි සමානකම් ඇති කොට ඇත.**

- පිරිසිදුභාවය හා නැමඳුම් කටයුතුවල මලක්වරුන්ගේ ස්වභාවය.
- ප්‍රතික්ෂේප කිරීම හා පිටුපෑමේ දී ෂෙයිතාන්ගේ ස්වභාවය.
- කෝපාවිෂ්ඨ වීම හා ආශාවන් තෘප්තිමත් කරගැනීමේ දී සත්ත්වයන්ගේ ස්වභාවය.

උන්වහන්සේ සහජයෙන් ම මිනිසා යහපත හා අයහපත වෙත නැඹුරුවන අයුරින් මවා ඇති නමුත්, යහපත හා අයහපත වෙන් කොට හඳුනාගැනීම පිණිස ෆිත්රා (ස්වභාවයෙන් ම මිනිසා තුළ ඇති අල්ලාහ් දෙවිඳාණන් පිළිබඳ වූ හැඟීම), විචාර බුද්ධිය හා පංචේන්ද්‍රියන් යනාදිය ඔහුට ලබා දී ඇත.

එමෙන් ම, උන්වහන්සේ මිනිසා හට පරිපූර්ණ නිදහස හා තෝරාගැනීමේ පරම අයිතිය ලබා දී ඇත්තාහ. එබැවින්, ඔහුගේ තෝරාගැනීම් හා ක්‍රියා පිළිබඳ විනිශ්චය දිනයේ දී ප්‍රශ්න කරනු ලැබේ.

## දෙවන ප්‍රශ්නය‍

**අපි කොහි සිට පැමිණියෙමු ද? අප මෙලොවෙහි සිටින්නේ මන්ද?**

උත්තරීතර අල්ලාහ් මහපොළොවේ ඇති මැටි පසින් මිනිසා නිර්මාණය කළ බව ඉස්ලාමය පැහැදිලි කරයි. මුළු මහත් මිනිස් සංහතියේ පියාණන් වන දේව දූත ආදම්තුමාණන් මවන ලද්දේ එමගිනි. උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. "තව ද, නියත වශයෙන් ම අපි මැටියෙන් යුත් සාරයෙන් මිනිසා ව මැව්වෙමු." (සූරා අල් මුඃමිනූන් - 12) උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මිනිසා මැවීමේ මුඛ්‍ය පරමාර්ථය උන්වහන්සේට ඉබාදත් හෙවත් නැමදුම් කිරීම වන නමුත්, උන්වහන්සේ කිසිවෙකුගෙන් කිසිදු අවශ්‍යතාවක් නොමැති සර්ව ස්වාධීන ය. මේ පිළිබඳ ව උන්වහන්සේ මෙසේ වදාරති. "මා ජින් වර්ගයා හා මිනිස් වර්ගයා නිර්මාණය කළේ මා නැමදීමට මිස අන් කිසිවකටත් නොවේ." (සූරා අස්සාරියාත් - 56) ඊට අමතර ව, මහපොළොව සාරවත් කිරීම, සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීම හා යහපත පැතිරවීම ද මුඛ්‍ය පරමාර්ථයකි. මේ පිළිබඳ ව උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. "නුඹලා ව මහපොළොවෙන් බිහි කළේ ඔහුය. තවද එහි පදිංචි වීමට සැලසුවේය." (සූරා හූද් - 61)

ආදම්තුමා
උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් දේව දූත ආදම්තුමාණන් ව මැවීමේ කථාව හා එතුමාණන් කෙරෙහි ෂෙයිතාන්ගේ විරෝධය කෙසේ ආරම්භ වූයේ ද යන්න පිළිබඳ උතුම් අල්-කුර්ආනයෙහි සඳහන් කර ඇත. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා උතුම් අල්-කුර්ආනයේ සූරා අල්බකරාහි 30-39 දක්වා බලන්න.

## සාකච්ඡා කරන්න

ඉස්ලාමයට පිවිසීමට පෙර හා පසු මිනිසාගේ පැවැත්මෙහි යථාර්ථය පිළිබඳ ඔබේ අදහස සංසන්දනාත්මක ව දක්වන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

## තෙවන ප්‍රශ්නය

### අප යන්නේ කොහෙද?

මෙලොව සෑම මනුෂ්‍යයෙකු ම මරණයට පත් වන අතර, ඔහුගේ මරණයත් සමඟ යහකම් කිරීමේ අවධිය අවසන් වී, ප්‍රශ්න කිරීමේ හා ක්‍රියාවන්ට අදාළ ප්‍රතිඵල ලබා දීමේ අවධිය ආරම්භ වේ. මේ පිළිබඳ ව උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. "(නබිවරය,) සැබැවින් ම ඔබ මරණයට පත් වේ. ඔවුහු ද මරණයට පත් වෙති. පසු ව, නියත වශයෙන් ම ඔබලා (මරණින් මතු) නැගිටුවනු ලබන දිනයේ දී ඔබලාගේ පරමාධිපතියාණන් අබියස වාදවිවාද කරගනිති." (සූරා අස්සුමර් - 39) කෙනෙකු මරණයට පත් වූ විට තම දහම හා ක්‍රියා පිළිබඳ ප්‍රශ්න කරනු ලබන්නා වූ ද, තම ක්‍රියාවන්ට අදාළ ප්‍රතිඵල ලබා දෙන්නා වූ ද අවධිය වෙත යොමු වේ. මේ පිළිබඳ උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. "සෑම ආත්මයක්ම මරණය අත් විඳින්නකි. (මළවුන්) නැගිටුවනු ලබන දින නුඹලාගේ ප්‍රතිඵල නුඹලාට පූර්ණව දෙනු ලබන්නේමය. කවරෙකු නිරයෙන් ඈත් කරනු ලැබ ස්වර්ගයට ඇතුළු කරනු ලබන්නේ ද සැබැවින්ම ඔහු ජය ලැබුවේය. තවද ලෞකික ජීවිතය මායාකාරී විඳීමක් හැර වෙනෙකක් නොවේ." (සූරා ආලු ඉම්රාන් - 185)

පරමාන්ත දිනය උදා වූ විට ප්‍රශ්න කිරීම හා ප්‍රතිඵල ලබා දීම පිණිස උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මරණයට පත්වූවන් ව සොහොන් භූමිවලින් නැවත නැගිටුවති. එහි දී, මුඃමින්වරුන් හෙවත් විශ්වාසවන්තයන් හට ස්වර්ගය ද කාෆිර්වරුන් හෙවත් ප්‍රතික්ෂේප කළවුන් හට නිරය ද අත් වේ. මේ පිළිබඳ ව උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ දේශනා කරති. "තවද (මක්කාව වන නුඹගේ) මාතෘ භූමියට ද ඒ අවට සිටින්නවුනට ද නුඹ අවවාද කරනු පිණිසත් කිසිදු සැකයක් නොමැති (විනිශ්චය සඳහා මැවුම්) රැස් කිරීමේ දිනය පිළිබඳව නුඹ අවවාද කරනු පිණිසත් අපි නුඹට මෙලෙස අරාබි බසින් වූ අල් කුර්ආනය දන්වා සිටියෙමු. (ඔවුන්ගෙන්) පිරිසක් ස්වර්ගයෙහි ද තවත් පිරිසක් නිරයෙහි ද වෙති." (සූරා අෂ්ෂූරා - 07)



## හිදායතය හෙවත් නිවැරදි මඟපෙන්වීම නමැති දායාදය

කවරෙකු මිනිසා නිර්මාණය කිරීමේ පරමාර්ථය හා විනිශ්චය දිනයේ මිනිසුන්ට හිමිවීමට නියමිත ප්‍රතිඵල පිළිබඳ අවබෝධ කරගන්නේ ද, උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දායාදයන් අතුරින් මිනිසාට පිරිනමා ඇති ශ්‍රේෂ්ඨතම දායාදය සත්‍ය දහම හා යහක්‍රියා පිළිබඳ නිවැරදි මඟපෙන්වීම බව ඔහු ස්ථීර ව වටහා ගනියි. උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් තම ගැත්තන්ට සලාතයේ දී ඉහ්දිනස්සිරාතල් මුස්තකීම් (අපට සෘජු මාර්ගය වෙත මඟපෙන්වන්න) යැයි ප්‍රාර්ථනා කිරීම අනිවාර්ය කර ඇත්තේ මේ හේතුවෙන් ය. මෙහි දී සිරාතල් මුස්තකීම් හෙවත් සෘජු මාර්ගය යන්නෙහි අදහස උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ තෘප්තිය හිමි කරදෙන ඉස්ලාම් දහම යන්න ය.

## සාකච්ඡා කරන්න

මහපොළොව සශ්‍රීක කිරීම හා ඒ මත යහපත් ශිෂ්ටාචාරයක් ගොඩනැගීම මිනිසාට පැවරී ඇති කර්තව්‍යයන් අතුරින් සුවිශේෂී වේ. එබැවින්, මෙම කර්තව්‍යය සාක්ෂාත් කරගත හැකි අයුරින් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මිනිසා නිර්මාණය කොට ඇත. මෙලෙස, අනෙකුත් මැවීම් සියල්ල හැර මිනිසාට පමණක් මෙම කර්තව්‍යය කිරීමට ඇති හැකියාව පහදන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

මරණයෙන් පසු මිනිසාට අත්වන ඉරණම පිළිබඳ ප්‍රයෝගික ව දැනගත හැකි පෙරනිමිති කිහිපයක් සඳහන් කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

## ඇගයුම් ප්‍රශ්න

**1** උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් අනෙකුත් මැවීම්වලට වඩා මිනිසා ව ශ්‍රේෂ්ඨත්වයට පත්කොට ඇත්තේ කෙසේ ද?

.......................................................................................................................................

.......................................................................................................................................

**2** මිනිසා නිර්මාණය කිරීමේ පරමාර්ථය කුමක් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

**3** මිනිස් නිර්මාණයේ ආරම්භය පිළිබඳ උතුම් අල්-කුර්ආනයෙහි විස්තරාත්මක ව සඳහන් වී ඇත්තේ මන් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

**4** මිනිසා මරණයට පත් වූ විට, ඔහුගේ දහම පිළිබඳ ප්‍රශ්න කරනු ලබන හා ඔහුගේ ක්‍රියාවන්ට අදාළ ප්‍රතිඵල ලබා දෙනු ලබන අවධිය වෙත යොමු වේ.

◯ නිවැරදි ය ◯ වැරදි ය

මිනිස් නිර්මාණයේ පරමාර්ථය මහපොළොව සශ්‍රීක කිරීම හා යහපත් ශිෂ්ටාචාරයක් ගොඩනැගීම වේ.

◯ නිවැරදි ය ◯ වැරදි ය

**5** මිනිසාගේ පැවැත්ම පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය හැදෑරීමෙන් පසු, ඒ සම්බන්ධයෙන් කෙතරම් දුරට ඔබ හදවතින් ම සෑහීමට පත්වන්නේ දැයි පහදන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................



# දෙවන පාඩම

## ඉස්ලාම් යනු කුමක් ද?

### ප්‍රවේශය

ඉස්ලාමය - අල්ලාහ් මුහම්මද් නබිතුමාණන් සමග පහළ කළ ධර්මය යි. එමෙන් ම එය පෙර පහළ වූ දේවදූතයින් දේශනා කළ ධර්මයේ දිගුවකි. මෙහි පදනම වන්නේ නැමදීමට සුදුසු දෙවිඳුන් එක්කෙනෙකු බවත් ඔහුට කිසිඳු ආදේශකයක් නොමැති බවත් ඒ දෙවිඳුන් අල්ලාහ් බවත් ඔහුට සිය පාලනයෙහි කිසිඳු සහායකයෙකු නොමැති බවත් ඔහු හා ඔහුගේ නැමඳුම්කරුවන් අතර කිසිඳු අතර මැදියෙකු නොමැති බවත් ය.

අප ඉස්ලාමය වැළඳගත යුත්තේ ඇයි? මෙම දහම සමස්ත මානව සමාජයට ම ද නැතිනම් අරාබිවරුන්ට පමණක් ද? නබිවරයා කවුරුන්ද? ඔහුගෙන් අනතුරු ව තවත් නබිවරයෙකු පහළ වීමට සිටී ද?

### මා ඉස්ලාමය වැළඳ ගත යුත්තේ ඇයි?

**සමහර විට තමන් ඉස්ලාමය වැළඳ ගත යුත්තේ මන්දැයි සමහරු විමසිය හැක.**

මීට පිළිතුරු වශයෙන් මා ඉස්ලාමය වැළඳගත යුතු යන්නට බලපාන හේතු කිහිපයක් ම දැක්විය හැක.

**1.** අල්ලාහ් දෙවිඳුන් විසින් පිළිගනු ලැබූ එකම දහම ඉස්ලාම් දහම යි. ඒ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “යමෙක් ඉස්ලාම් නොවන වෙනත් ධර්මයක් සොයන්නේ ද ඔහුගෙන් එය කිසිවිටෙක පිළිගනු නොලබන්නේය.තවද ඔහු පරලොව දී පරාජිතයන්ගෙන් කෙනෙක් වේ.” (ආලු ඉම්රාන් -85)

**2.** සෑම නබිවරයෙකුගේ ම දහම ඉස්ලාම් දහම යි. ඉස්ලාමය සෑම නබිවරයෙකු ව ම විශ්වාස කරන මෙන් නියෝග කරයි. ඔවුනතර කිසිදු වෙනසක් පෙන්වා නොමැත. මන්දයත් ඉස්ලාමය ඔවුන් සියලු දෙනාගේ ම දහම යි. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “අල්ලාහ් ද අප වෙත පහළ කරන ලද දෑ ද ඉබ්‍රාහිම්,ඉස්මාඊල්,ඉස්හාක්,යඃකූබ්, හා ඔහුගෙන් පැවැත එන්නන්ට පහළ කරන ලද දෑ ද තවද මූසාට සහ ඊසාට දෙනු ලැබූ දෑ ද අපි විශ්වාස කළෙමු.අපි ඔවුන් (නබිවරුන්) කිසිදු කෙනෙකු අතර භේදයක් ඇති නොකරමු.තවද අපි ඔහු (අල්ලාහ්ට) සම්පූර්ණයෙන් ම අවනත වූ මුස්ලිම්වරු වෙමුයි නුඹලා (ඔවුනට) කිය” (සූරා අල් බකරා - 136).

නබිවරු අතර ඇති වෙනස වන්නේ ඔවුන්ගේ ප්‍රජාවගේ ක්‍රියාකාරකම්වලට අනුව පෙන්වා දුන් නීතිරීතිවල ඇති වෙනස යි. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. ”නුඹලා අතරින් සෑම ප්‍රජාවකටම ආගමික පිළිවෙතක් හා ක්‍රියාමාලාවක් අපි ඇති කළෙමු.” (සූරා අල් මාඉදා - 48) එනම් සෑම සමාජයකට ම ඔවුන්ට අවැසි තීන්දු තීරණ ගැනීම සඳහා අල්ලාහ් දෙවිදුන් නීති සංග්‍රහයක් ඇති කොට ඇත. එමෙන් ම එය අල්ලාහ් දෙවිදුන් ට සමීප වීමට ඇති මගක් ද වේ. ඒ අනුව සෑම (දේවග්‍රන්ථ ලත්) ජන සමාජයකට ඔවුනට ආවේණික හා ගැලපෙන නීති පද්ධතියක් ඇත.

පසුව අල්ලාහ් දෙවිඳුන් සිය අවසන් දූතයා වශයෙන් මුහම්මද් නබිතුමා ව පහළ කළේය. ඒ සමග ම නබිවරුන් හා නීති සංග්‍රහ පහළ වීම අවසන් විය. එබැවින් අල්ලාහ් පිළිගන්නේ ඉස්ලාම් දහම පමණි.

**3.** ඉස්ලාම් යනු මේ ජීවිතයේ සතුටට සහ මතු ජීවිතයේ ගැලවීමට මාර්ගයයි, ඉස්ලාම් යනු මේ ජීවිතයේ සතුටට සහ මතු ජීවිතයේ ගැලවීමට මාර්ගයයි, එබැවින් මුහම්මද් නබිතුමා විශ්වාස කරන සහ ඔහුගේ පණිවිඩය ඔවුන් වෙත ළඟා වූ පසු ඔහුව අනුගමනය කරන අය ගැලවෙනු ඇත. ඔහුව ප්‍රතික්ෂේප කරන්නන් දිව්‍යමය දඬුවමට යටත් වනු ඇත. “කවරෙකු ඉස්ලාමය හැර වෙනත් දහමක් සොයන්නේ ද එවිට ඔහුගෙන් කිසිවක් පිළිගනු නොලබන්නේ ම ය. තවද ඔහු මතු ලොවෙහි අලාභ වන්තයින් අතුරින් කෙනෙකි.” (සූරා ආලු ඉම්රාන්, 3:85) නබිතුමාණෝ මෙසේ පැවසූහ.“මුහම්මද්ගේ ආත්මය කා අතේ තිබේද, ඔහු මත දිවුරා පවසමි. මෙම ප්‍රජාවේ, යුදෙව්වෙකු හෝ ක්‍රිස්තියානියෙකු වේවා, මා ගැන අසා මා එවන ලද දේ විශ්වාස නොකර මිය යන ඕනෑම පුද්ගලයෙක් නිරයේ වැසියන් අතර වේ.” (මුස්ලිම් 153).

**4.** මානව පැවැත්ම පිළිබඳ විශාල ප්‍රශ්නවලට ඉස්ලාම් තීරණාත්මක පිළිතුරු සපයයි: අපි පැමිණියේ කොහෙන් ද? ඇයි අපි මෙතන? මරණයෙන් පසු අපි යන්නේ කොහෙ ද?

**5.** ඉස්ලාම් සහජ මානව ස්වභාවය (ෆිත්රා) සමග පරිපූර්ණ එකඟතාවයකින් යුක්ත වේ. එකමුතුකම ප්‍රකාශ කිරීම වැනි උතුම්ම වටිනාකමෙන් පටන් ගෙන, ආචාර විධි නීති රීතිවලින් අවසන් කර, සදාචාර විශිෂ්ඨත්වය තුළ විශිෂ්ට පරිපූර්ණත්වයක් අත්කර ගැනීමට තම අනුගාමිකයින්ට ඉස්ලාම් උගන්වයි.

### සාකච්ඡා කරන්න

ඉස්ලාමය සෑම නබිවරයෙකුගේ ම දහම වන්නේ කෙසේ ද?

.................................................................................................

.................................................................................................

## ඉස්ලාමයේ සුවිශේෂතා

ඉස්ලාමය සෙසු දහම් අතුරින් එහි ඇති සුවිශේෂී ලක්ෂණ නිසා වෙනස් වේ. එම සුවිශේෂී ලක්ෂණ අතුරින් ප්‍රධානතම ලක්ෂණ කිහිපයක් නම් :

### 1 ඉස්ලාමය ගෝලීය දහමකි

ඉස්ලාමය හුදෙක් අරාබි ජාතිකයින්ට පමණක් සීමා වූ දහමක් නොව එය අල්ලාහ් දෙවිඳාණන් විසින් සකල ලෝක වැසියන්ට ම පහළ කරන ලද්දකි. අල්ලාහ් දෙවිඳුන් නබිතුමාණන්ට මෙසේ පවසන්නේ එබැවින් ය. “මා වෙත දේව පණිවිඩ දන්වනු ලබනුයේ, නුඹලාගේ දෙවිඳා එකම දෙවිඳාණන් බවය. එහෙයින් නුඹලා අවනත වන්නෝ වෙත්ද? යැයි (නබිවරය!) නුඹ විමසනු.” (සූරා අල් අන්බියා - 108). අල්ලාහ් දෙවිඳුන් පොදුවේ සියලු ම ජනයින්ට ඊමානය (විශ්වාසය) කරා මගපෙන්වන දයාවක් ලෙස නබිතුමාණන් ව පත් කොට ඔහුගේ නීති සංග්‍රහය ජනයින්ට දයාවක් වීම පිණිස පුළුල්තම නීති සංග්‍රහය බවට පත් කළේය.

**ආදර්ශ පාඨය**

ඉස්ලාමය ජනයාගේ සිරිත් විරිත් හා සම්ප්‍රදායන්වලට ගරු කරයි. ඒවා ඉස්ලාමීය වත්පිළිවෙත්වලට හෝ ඉගැන්වීම්වලට පටහැනි වන්නේ නම් පමණක් ඒවා වෙනස් කර ගත යුතු යැයි පවසයි.

## 2 ඉස්ලාමය පූර්ව පාපයන් සියල්ල කමා කරයි

පුද්ගලයෙකු ඉස්ලාමය වැළඳගෙන ඔහුට පැවරී ඇති වගකීම් ඉටුකර අල්ලාහ් දෙවිඳුන් වළක්වා ඇති දැයින් වැළකී සිටියේ නම් සැබවින් ම අල්ලාහ් දෙවිඳාණෝ ඔහු ඉස්ලාමය වැළඳ ගැනීමට පෙර කළ පාපයන් සියල්ලට ම සමාව ලබා දෙති. නබිතුමාණෝ මෙසේ වදාළහ. “(නබිවරය!) ප්‍රතික්ෂේප කළවුනට පවසනු, අකටයුතුකම් කිරීමෙන් ඔවුන් වැළකී සිටින්නේ නම් පෙර සිදු කළ දෑ ට ඔවුනට සමාව දෙනු ලැබේ.” (සූරා අල් අන්ෆාල්, 8:38). “මිනිසෙක් වරක් ඉස්ලාමය කෙරෙහි උනන්දුවක් දැක්වූ අතර, ඔහු නබිතුමා වෙත ගිය නමුත්, ඔහුගේ අතීත පාපයන් අල්ලාහ් ඔහුට සමාව දිය යුතු බව ඔහු නියම කළේය. නබිතුමා ඔහුට ශුභාරංචිය ලබා දෙමින්, “ඉස්ලාමය ඊට පෙර කළ සියලු පාපයන් අතුගා දමන බව ඔබ දන්නේ නැද්ද?” යැයි පැවසුවේය. (මුස්ලිම් 121).

## 3 ඉස්ලාමය අවසන් දහම යි

පෙර පහළ කරන ලද දේව ධර්මවල දිගුවක් වශයෙන් අල්ලාහ් දෙවිඳුන් ඉස්ලාමය පත්කර එය ලෝකවසානය දක්වා ම සමස්ත මානව සමාජයට ම අල්ලාහ් දෙවිඳුන් පිරිනැමූ දහම වශයෙන් පත්කොට ඇත. එබැවින් මහපොළවේ දක්නට ඇති සත්‍ය දහම ඉස්ලාමය පමණි. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “යමෙක් ඉස්ලාම් නොවන වෙනත් ධර්මයක් සොයන්නේ ද ඔහුගෙන් එය කිසිවිටෙක පිළිගනු නොලබන්නේය. තවද ඔහු පරලොව දී පරාජිතයන්ගෙන් කෙනෙක් වේ.” (සූරා ආලු ඉම්රාන් 3:85).

### සාකච්ඡා කරන්න



ඉස්ලාමය ආරාබිවරුන්ට පමණක් ආවේණික දහමක් යැයි විශ්වාස කරන්නන් හට පිළිතුරු ලබා දෙන්නේ කෙසේ ද?

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

## ඉස්ලාමයේ නබිවරයා කවුරුන් ද?

අල්ලාහ්ට පමණක් නැමඳුම් කරන මෙන් ජනයාට ඇරයුම් කිරීම පිණිස අල්ලාහ් දෙවිඳුන් විසින් යවනු ලැබූ නබිවරුන් අතුරින් අවසන් නබිවරයා මුහම්මද් නබිතුමාණන් බව ද ඔහුගෙන් පසු වෙනත් නබිවරයෙකු නොමැති බව ද මුස්ලිම්වරුන්ගේ ස්ථිර විශ්වාසය යි. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. "ජනයිනි, මුහම්මද් නුඹලා අතුරින් කිසිම පුරුෂයෙකුගේ පියා නොවෙයි. නමුත් අල්ලාහ්ගෙ රසූල්වරයා ද නබිවරුන්ගේ අවසාන නබිවරයා ද වෙයි.අල්ලාහ් සියලු දේ මැනවින් දන්නාය." (සූරා අල් අහ්සාබ් 33:40)

## දහම හදාරන්න .

- මුස්ලිම්වරයෙකු තම පරමාධිපති ව අවබෝධයෙන් නැමදීමට අවැසි දහම් කරුණු හැදෑරීම ඔහුගේ වගකීමකි.
- දහම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීම පිළිබඳ ව නබිතුමාණෝ මෙසේ සඳහන් කරමින් දිරිගන්වා ඇත. " අල්ලාහ් දෙවිඳුන් කවරෙකු කෙරෙහි යහපත පතන්නේ ද ඔහුට අල්ලාහ් දෙවිඳාණෝ ධර්මාවබෝධය පිරිනමති" (මූලාශ්‍රය - බුහාරි)
- දහම පිළිබඳ හැදෑරීම ස්වර්ගයට පිවිසීමේ මගක් ලෙස නබිතුමාණෝ වදාළහ. " කවරෙකු දැනුම සොයා ගමන් ගන්නේ ද ඔහුට අල්ලාහ් දෙවිඳාණෝ ස්වර්ගයට පිවිසෙන මග පහසු කරති" (මූලාශ්‍රය - මුස්ලිම්)

**අමතර කියවීම**

මුහම්මද් නබිතුමාගේ චරිතාපදානය ගැන වැඩි විස්තර දැනගැනීම සඳහා, ජාත්‍යන්තර භාෂා කිහිපයකින් උසුල් වෙබ් අඩවියෙහි ඇති මුහම්මද් නබිතුමා පොත කියවන්න.

පොත භාගත (Download) කිරීමට තිරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.



හොඳ දැනුමක් මත පදනම්ව තම ස්වාමියාට නමස්කාර කිරීම සඳහා මුස්ලිම්වරයෙකුට තම ආගමේ නීති ඉගෙන ගත හැකි පොත් රාශියක් ඇත. මේ සඳහා, ඔහුට මෙම පොත්වලින් හොඳම දේ පෙන්වීමට විශේෂඥයින්ගේ සහාය ලබා ගත යුතුය.

## ඉස්ලාමයේ ශ්‍රේෂ්ඨත්වය මනින නිර්ණායකය

මුලිම්වරයෙකුගේ ඊමානය (විශ්වාසය) හා දැහැමි බව යන අංශයන්හි වඩාත් ශ්‍රේෂ්ඨ කවුරුන් දැයි මනින නිර්ණායකයන් අල්ලාහ් දෙවිඳුන් පෙන්වා දී ඇත. ඒ අනුව මුස්ලිම්වරු අතර ශ්‍රේෂ්ඨත්වය මනින්නේ ඊමානයේ ස්ථිරත්වය මත මිස හැඩරුව, පරම්පරාව, ශරීර වර්ණය, ධනය, මත පදනම් ව නො වේ. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “ජනයිනි, අපි නුඹලා පිරිමියෙකුන් ද ගැහැණියකගෙන් ද මැව්වෙමු. නුඹලා එකිනෙකා හඳුනා ගැනීම පිණිස අප නුඹලා ජාතීන් හා ගෝත්‍රයන් කළෙමු. නියත වශයෙන් ම අල්ලාහ් හමුවේ නුඹලා අතුරින් ඉතා ගෞරවනීය වන්නේ ඉතාමත් බියබැතිමත් වූ අය යි.” (සූරා හුජුරාත් , 49:13).

එමෙන් ම නබිතුමාණන් ද මෙසේ පවසා ඇත. “ජනයිනි, ඔබලාගේ පරමාධිපති එක්කෙනෙක් බව දැනගන්න. ඔබලාගේ පියාණන් එක්කෙනෙකු බව ද දැනගන්න. දැහැමිභාවයෙන් මිස අරාබි නොවන්නෙකුට වඩා අරාබි ජාතිකයෙකු උසස් නොවන බවත් අරාබි ජාතිකයෙකුට වඩා අරාබි නොවන්නෙකු උසස් නොවන බවත් කළු ජාතිකයෙකුට වඩා සුදු ජාතිකයෙකු උසස් නොවන බවත් සුදු ජාතිකයෙකුට වඩා කළු ජාතිකයෙකු උසස් නොවන බවත් දැනගන්න.” (අල් බයිහකී )

## ඉස්ලාමයේ මූලිකාංග

ඉස්ලාම් දහම මූලික කරුණු පහක් මත ගොඩනැගී ඇත.



## ඇගයුම් ප්‍රශ්න

**1** ‘මුස්ලිම්වරයෙකුගේ නව දිවිය’ නමැති වීඩියෝ පටය නරඹා, ඔබ ව ඉස්ලාමය කෙරෙහි වැඩියෙන් ම යොමු කළ කරුණ කුමක් ද යන්න පිළිබඳ සාකච්ඡා කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

**2** අල්ලාහ් දෙවිඳුන්ගේ මගපෙන්වීමේ ආකාරයට ඔහුව නැමදීමට මුස්ලිම්වරයෙකු හැදෑරිය යුතු මූලික දහම් කරුණු කවරේ ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

**3** ඉස්ලාමයේ අන්තර්ගත වන්නේ

- ◯ ආචාරධර්ම පද්ධතිය
- ◯ ප්‍රායෝගිකත්වය
- ◯ න්‍යායාත්මක කරුණු
- ◯ ඉහත සියල්ල

ඉස්ලාමයේ මූලිකාංග කොපමණ ද?

- ◯ 6
- ◯ 5
- ◯ 4
- ◯ 3

**4** අල්ලාහ් දෙවිඳුන්ගේ දයාවෙන් අයෙකු ඉස්ලාමය වැළඳ ගැනීමෙන් අනතුරු ව අල්ලාහ් දෙවිඳුන් ව නිසි පරිදි නැමදීමට මූලික දහම් කරුණු හැදෑරීම අනිවාර්ය වේ.

◯ නිවැරදි ය ◯ වැරදි ය



# තෙවන පාඩම

## මුස්ලිම්වරයෙකු වන්නේ කෙසේ ද?

### ප්‍රවේශය

නව මුස්ලිම්වරයෙකුට අමතක නොවන අවස්ථාවක් වනුයේ, ඊමාන් හෙවත් විශ්වාසය හා බැඳි සාක්ෂි දැරීමට අදාළ ප්‍රකාශ දෙක සඳහන් කරමින් තමා ඉස්ලාමය වැලඳ ගත් මොහොතයි. මෙම ප්‍රකාශයත් සමඟ ඔහු, තමා සිටි තත්ත්වයට වඩා වෙනත් තත්ත්වයට පත්ව ඇති බව අනුන්ට පෙර තමාට ම ප්‍රකාශ කරයි. ඔහු මෙසේ සාක්ෂි දැරූ ඒ මොහොතේ සිට සත්‍යය දැනගැනීමට සහ එයට අනුගතවීමට අදාළ පළමු පියවර තබයි. මෙම පාඩමේ දී, සාක්ෂි දැරීම හා එහි අර්ථ මෙන් ම, ඒ කෙරෙහි මුස්ලිම්වරයෙකුට ඇති අවශ්‍යතා පිළිබඳ අපි ඉගෙන ගනිමු.

## සාක්ෂි දැරීම

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ මෙම සාක්ෂි දැරීමට අදාළ ප්‍රකාශ දෙක කෙනෙකු ඉස්ලාමයට පිවිසීමේ යතුර ලෙස පත් කර ඇත්තාහ. එම සාක්ෂි දැරීමට අදාළ ප්‍රකාශ දෙක මෙසේ දැක්විය හැක :

- මම උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හැර වෙනත් දෙවියෙකු නොමැති බවට සාක්ෂි දරන්නෙමි.
- මම දේව දූත මුහම්මද්තුමාණන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දූතයා බවට සාක්ෂි දරන්නෙමි.

## සාක්ෂි දැරීම යන්නෙහි අර්ථය කුමක් ද?

**1. පළමුව - "අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහ්" හෙවත් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හැර වෙනත් දෙවියෙකු නොමැත යනුවෙන් ෂාක්ෂි දැරීමෙහි අර්ථය.**

මෙහි අර්ථය වනුයේ, 'නමදිනු ලැබීමට සුදුස්සා උත්තරීතර අල්ලාහ් පමණක් බව තරයේ විශ්වාස කරමි' යන්න ය.

**මෙම සාක්ෂි දැරීමෙහි කරුණු දෙකක් අන්තර්ගත ය**

**පළමු කරුණ**

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හැර අනෙකුත් දෙවිවරුන් ප්‍රතික්ෂේප කිරීම.

**දෙවන කරුණ**

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ට පමණක් දේවත්වය තහවුරු කිරීම.

සියලු ම නබිවරුන්ගේ දහම වන ඉස්ලාමයේ හරය වනුයේ උත්තරීතර අල්ලාහ් ව පමණක් නැමදීම සහ ඔහු හැර නමදිනු ලබන සියල්ල ප්‍රතික්ෂේප කිරීම වේ. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “සැබවින්ම, මා හැර වෙනත් දෙවි කෙනෙකු නොමැත. එබැවින් ඔබලා මට පමණක් නැමදුම් කරන්න යැයි අපි වහී පහළ කොට මිස, ඔබට පෙර රසූල්වරුන්ව නො එව්වෙමු.” (සූරා අල් අන්බියා, 21:25).

කිසිදු අවස්ථාවක උත්තරීතර අල්ලාහ් හැර වෙනත් කිසිදු දේවත්වයක් විශ්වාස කිරීමට හෝ කිසිදු ආකාරයක නැමඳුමකින් වුව ද, උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හැර වෙනත් කිසිවකට සමීපවීමට අවසර නොමැත.

**2.** “ෂහාදතු අන්න මුහමුමදර් රසූලුල්ලාහ්” හෙවත් දේව දූත මුහම්මද්තුමාණන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දූතයා බවට සාක්ෂි දැරීමෙහි අර්ථය:

මෙහි අර්ථය වනුයේ, ‘දේව දූත මුහම්මද්තුමාණන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දූතයා බවත්, එතුමාණන් අවසන් දේව දූතයාණන් බවත්, එතුමාණන්ගෙන් පසුව වෙනත් නබිවරයෙකු හෙවත් දේව දූතයෙකු නොමැති බවත්, එතුමාණන්ගේ පණිවිඩය මුළු මහත් මනුෂ්‍ය සංහතිය උදෙසා ම බවත් මම තරයේ විශ්වාස කරමි’ යන්න ය. මේ පිළිබඳ ව අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ වදාරති. “ලෝවැසියන්ට එය අවවාදයක් වනු පිණිස තම ගැත්තා මත (සත්‍ය හා අසත්‍ය වෙන් කර දක්වන) මිනුම් දණ්ඩය (හෙවත් අල් කුර්ආනය) පහළ කළා වූ ඔහු උත්කෘෂ්ට විය.” (සූරා අල් ෆුර්කාන් : 0, 25:1).

## අභ්‍යාසය

‘මුහම්මදුර් රසූලුල්ලාහ්’ යන පොත ඔබ පරිශීලනය කිරීමෙන් පසු මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා පිළිබඳව පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

පොත භාගත (Download) කිරීමට තිරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.



එතුමාගේ නම :

එතුමාගේ පෙළපත :

එතුමාගේ උපත :

එතුමාගේ හැදී වැඩීම :

එතුමාගේ නබිත්වය :

එතුමාගේ සංක්‍රමණය :

එතුමාගේ අභාවය :

## සාක්ෂි දැරීමට අදාළ අනිවාර්ය කරුණු

හුදෙක් සාක්ෂි දෙක ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එමගින් අනිවාර්ය වන කරුණු ඉටු කිරීම අත්‍යාවශ්‍ය වේ. උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හැර වෙනත් දෙවියෙකු නොමැති බවට වන සාක්ෂි දැරීමෙන් නැමදුමට භාජනය වන අල්ලාහ් දෙවිඳාණන් හැර නමදිනු ලබන සෙසු සියල්ල ප්‍රතික්ෂේප කිරීම හා උත්තරීතර අල්ලාහ් පමණක් නැමදීමට සුදුසු එක ම දෙවිඳාණන් හා පරමාධිපතියාණන් වශයෙන් විශ්වාස කිරීම අනිවාර්ය වේ. "කවරෙකු තාඝූත්(ෂෙයිතාන්වරුන්) ප්‍රතික්ෂේප කර, අල්ලාහ්ව විශ්වාස කරන්නේ ද ඔහු සැබැවින්ම ශක්තිමත් අත්වැල ග්‍රහණය කර ගත්තේය. එයට කිසිවිටෙක බිඳීමක් නැත. " (සූරා අල් බකරා, 2:256) දේව දූත මුහම්මද්තුමාණන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දූතයා යනුවෙන් සාක්ෂි දැරීමෙන් එතුමාණන් පවසන දෑ විශ්වාස කිරීම, එතුමාණන් අණ කළ දෑ පිළිපැදීම සහ එතුමාණන් වැළැක් වූ දැයින් වැලකී, ඔහුට අවනත වීම අනිවාර්ය වේ.

### සාකච්ඡා කරන්න

ලා ඉලාහ ඉල්ලල්ලාහ් හෙවත් අල්ලාහ් හැර වෙන දෙවියෙකු නොමැති බවට වන සාක්ෂි දැරීමෙන් අල්ලාහ් හැර නැමදුමට භාජනය වන සියල්ල ප්‍රතික්ෂේප කිරීම අනිවාර්ය වන්නේ ඇයි?

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................

......................................................................................................................




අල්ලාහ්ගේ වක්තෘවරයෙකු වන ඉබ්රාහීම් (අලෙයිහිස් සලාම්) තුමා, තම ජනයා සමඟ තර්ක කළ තාර්කික තර්කවලින් එකක් වූයේ, "ඔහු ඔවුන්ගෙන් 'ඔබලා විසින් අඹන ලද දේට ඔබලා නමදින්නෙහුද?' " යි ඇසූ ප්‍රශ්නය යි. (සූරා අස් සාෆ්ෆාත්, 37·95)

## ඇගයුම් ප්‍රශ්න

**1** විශ්වයේ දෙවියන් උත්තරීතර අල්ලාහ් බව ඔබ දැන සිටීම ඉස්ලාමයට ප්‍රවේශ වීමට ප්‍රමාණවත් වේ.

○ හරි ○ වැරදි

දේව දූත මුහම්මද්තුමා අල්ලාහ්ගේ දූතයා බව සාක්ෂි දැරීමෙහි ලා එය සත්‍යය බව පිළිගෙන එතුමාණන්ට අවනත නොවී සිටීම ප්‍රමාණවත් ය.

○ හරි ○ වැරදි

**2** "Who is Muhammad?" යන මෙම වීඩියෝ පටය නැරඹීමෙන් පසු මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ ශ්‍රේෂ්ඨ පෞරුෂත්ව අංගයන් ගැන කතා කරන්න. ඉස්ලාම් විරෝධීන් ඔහුගේ ගෞරවනීය ප්‍රතිරූපයට අපහාස කිරීමට භාවිතා කළ ක්‍රම විශ්ලේෂණය කරන්න.

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

**3** jesusandquran.com යන මෙම වෙබ් පිටුව පිරික්සීමෙන් මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා සහ ඊසා (අලෙයිහිස් සලාම්) තුමා අතර සම්බන්ධය සාකච්ඡා කරන්න.

ප්‍රවේශ වීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................



# සිව්වන පාඩම

## අල් ඊමාන් - විශ්වාසය

### ප්‍රවේශය

මුස්ලිම්වරයෙකුට උතුම් අල්-කුර්ආනය කියවන විට හෝ සලාතය මගින් හෝ වෙනත් නැමදුම් ක්‍රියාවන් මගින් උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව නමදින විට සන්සුන්බවක් සහ සුවපහසුබවක් හැඟේ. සමහරුන් ව ප්‍රීතියේ සහ සතුටෙහි හිණිපෙත්තට ම යොමු කරන මෙම හැඟීම මුස්ලිම්වරයාගේ ඊමානය හෙවත් විශ්වාසයේ හරය වන අතර, එය තම මුළු ජීවිතය ම උත්තරිතර අල්ලාහ් දෙවිඳාණන් වෙනුවෙන් ගත කිරීමටත්, ආශාවෙන් හා කැමැත්තෙන් උන්වහන්සේගේ ආඥා පිළිපැදීමටත්, උන්වහන්සේ වැළැක් වූ කරුණු පිළිගෙන, ඊට පරිපූර්ණ ව අවනත වෙමින් ඒවායින් වැළකී සිටීමටත් උනන්දු කරවයි. මෙම පාඩමේදී ඊමානය හෙවත් විශ්වාසය පිළිබඳ සංකල්පය, එහි මූලිකාංග හා එහි ප්‍රයෝජන පිළිබඳ අපි ඉගෙන ගනිමු.

### ඊමාන් - විශ්වාසය යනු කුමක් ද?

ඊමාන් හෙවත් විශ්වාසය යනු උත්තරිතර අල්ලාහ්ගෙන් පැමිණි දෑ, සිතෙන් විශ්වාස කර, මුවින් තහවුරු කිරීම ය. ආදරයෙන් (අල්හුබ්), අපේක්ෂාවෙන් (අර්රජාඃ) හා බියෙන් (අල්කව්ෆ්) උන්වහන්සේට අවනත වී, ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම ය. "විශ්වාස කළවුනි, අල්ලාහ්ව ද ඔහුගේ රසූල්වරයාව ද ඔහුගේ රසූල්වරයාට පහළ කළ ධර්ම පුස්තකය ද (ඔහුට) පෙර පහළ කළා වූ ධර්ම පුස්තක ද විශ්වාස කරන්න. කවරෙකු අල්ලාහ්ව, ඔහුගේ මලක්වරුන්ව, ඔහුගේ ධර්ම පුස්තක, ඔහුගේ රසූල්වරුන්ව හා අවසාන දිනය ප්‍රතික්ෂේප කරන්නේ ද ඔහු සැබැවින්ම අන්ත මුළාවකට පත් වන්නේය." (සූරා අන්නිසා, 4:136)

### සාකච්ඡා කරන්න

අපේක්ෂාව (අර්රජාඃ) හා බිය (අල්කව්ෆ්) අතර වෙනස කුමක් ද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

## අර්කානුල් ඊමාන් හෙවත් විශ්වාසයේ මූලිකාංග

**ඊමානය හෙවත් විශ්වාසය ප්‍රධාන මූලිකාංග හයකින් සමන්විත ය . ඒවා පහත දැක් වේ.**

1. **උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් ව විශ්වාස කිරීම:** එනම්, මිනිසා උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ පැවැත්ම, නාමයන්, ගුණාංග පිළිබඳ ව ද, උන්වහන්සේ මේ මහා විශ්වයේ පරමාධිපතියා, මවුම්කරුවා, එහි ඇති සියල්ලෙහි හිමිකරුවා, සියල්ල සැලසුම් කරන්නා, ගැත්තන්ට අවශ්‍ය දෑ සපයන්නා බව ද, උන්වහන්සේ හැර නැමදුම් ලැබීමට සුදුසු වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බව ද, ඔහු පරිපූර්ණ ගුණාංගවලින් යුක්ත බව ද විශ්වාස කිරීම ය.

### උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් හට ආදේශ කිරීම.

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ට ආදේශ කිරීම යනු අල්ලාහ් නොවන වෙනත් යමක් දෙවියෙකු ලෙස විශ්වාස කිරීම හෝ කිසියම් නැමදුම් කටයුත්තක් මගින් ඒ වෙත සමීප වීම යි. එය ඉමහත් පාපයක් හා මහා අපරාධයකි. පහත සඳහන් අයුරින් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් වදාරා ඇති බැවින් උන්වහන්සේ ඊට සමාව ලබා නොදෙති. 'සැබැවින් ම අල්ලාහ් තමන්ට ආදේශ තබනු ලැබීමට සමාව දෙන්නේ ම නැත. ඒ නොවන දෑ සඳහා කවරෙකු කෙරෙහි අභිමත වන්නේ ද, ඔහුට සමාව දෙන්නේය. කවරෙකු අල්ලාහ්ට ආදේශ තබන්නේ ද, ඔහු ඉමහත් පාපයක් කරන්නේය.' (සූරා අන් නිසා : 48)

2. **මලාඉකාවරුන් විශ්වාස කිරීම:** එනම්, මලාඉකාවරුන් හෙවත් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ සුර දූතයින්ගේ පැවැත්ම විශ්වාස කිරීම හා ඔවුන් ව උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මවා ඇති බවත්, ඔවුන් උන්වහන්සේ ව නමදින බවත්, උන්වහන්සේගේ අණට ඔවුන් කිසිවිටක පිටුනොපාන බවත් විශ්වාස කිරීම මෙන් ම, අල් කිතාබ් හා අස්සුන්නාවෙහි සඳහන් ඔවුන්ගේ ගුණාංග හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද විශ්වාස කිරීම ය.

අල් කිතාබ් වස් සුන්නා යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඉස්ලාමයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක ලෙස සැලකෙන උතුම් අල් කුර්ආනය හා දේව දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ හදීස් හෙවත් සම්ප්‍රදා වේ.

3. **දේව ග්‍රන්ථ විශ්වාස කිරීම:** එනම්, මිනිසුන්ට යහමග පෙන්වීමට හා දහම් කරුණු පහදා දීමට උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් තම ගැත්තන් වෙත තමාගෙන් වූ ග්‍රන්ථයක් පහළ කළ බව විශ්වාස කිරීම ය. එම දේව ග්‍රන්ථ අතුරින් ඉම්රාන්ගේ පුත් මූසා (අලෙයිහිස් සලාම්) තුමා හට 'තව්රාත්' නමැති දේව ග්‍රන්ථය ද, දාවූද් (අලෙයිහිස් සලාම්) තුමා හට 'සබූර්' නමැති දේව ග්‍රන්ථය ද, මර්යම්ගේ පුත් ඊසා (අලෙයිහිස් සලාම්) තුමා හට 'ඉන්ජීල්' නමැති දේව ග්‍රන්ථය ද, දේව දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා හට උතුම් අල් කුර්ආනය ද පහළ කරන ලදී.

4. **නබිවරුන් කෙරෙහි විශ්වාසය කිරීම:** එනම්, මුඃමින්වරුන් හෙවත් විශ්වාසවන්තයින්ට ශුභාරංචි පැවසීමටත් කාෆිර්වරුන් හෙවත් ප්‍රතික්ෂේප කළ උදවියට අනතුරු ඇඟවීමටත් ඒ ඒ සමාජයන්ට ඔවුන්ගේ දහම් කරුණු ඉගැන්වීමටත් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් ජන සමාජ වෙත දේව දූතයන් යැවූ බවත් ඔවුනට ඔවුන්ගේ සත්‍යයතාව තහවුරු කරන අයුරින් ප්‍රාතිහාර්යයන් ලබා දුන් බවත් විශ්වාස කිරීම ය. මේ අනුව, කවුරුන් හට උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් විසින් දූතයෙක් එවනු ලැබුවේ ද එම දූතයාට අවනත වීම සහ ඔහු ව අනුගමනය කිරීම ඔවුනට අනිවාර්ය වේ.

5. **අවසන් දිනය විශ්වාස කිරීම:** මුස්ලිම්වරයෙක් 'යව්මුල් කියාමා' හෙවත් ලෝක අවසාන දිනය පිළිබඳ විශ්වාස කරන අතර, එදින මළවුන් ව තම සොහොන්වලින් උත්තරීතර අල්ලාහ් නැගිටුවන බවත්, ඔවුන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් විමසා, ඒ සඳහා ඔවුනට කුලිය ලබා දෙන බවත්, ඔවුන්ගෙන් සමහරුන් ස්වර්ගයට ද තවත් සමහරුන් නිරයට ද පිවිසෙන බවත් විශ්වාස කරයි.

6. **කද්ර් හෙවත් දෛවය විශ්වාස කිරීම:** එනම්, මෙලොව සිදු වන යහපත් හෝ අයහපත් සෑම ක්‍රියාවක් ම උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නියෝගය හා අවසරය පරිදි සිදු වන බවත් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් ඒ සියල්ල මැනවින් දන්නා බවත්, ලව්හුල් මහ්ෆූල්හි ඒ සියල්ල සඳහන් කර ඇති බවත්, උන්වහන්සේගේ අභිමතයෙන් තොර ව මෙලොව කිසිවක් සිදු නොවන බවත් විශ්වාස කිරීම ය.

අල්-කද්ර්, නොහොත් දිව්‍ය ආඥාව යන්නෙන් අදහස් කරන්නේ සර්වබලධාරී අල්ලාහ් දැනටමත් කලින් නියම කර ඇති දේවල් සහ එය ඔහුට පමණක් දන්නා අවස්ථාවන්හිදී සහ විශේෂිත ආකාරයකින් සිදුවීමේ ඔහුගේ පූර්ව දැනගැනීමයි.

ලව්හුල් මහ්ෆූල් යනු අල්ලාහ් විසින් මවන ලද මැවීම් සම්බන්ධයෙන් ලෝක අවසානය දක්වා නිර්ණය කර ඇති සියලු දෑ සටහන් කර ඇති ආරක්ෂිත ලේඛනය වේ.

## ඊමානයේ ප්‍රයෝජන

**ඊමාන් හෙවත් විශ්වාස කිරීමෙහි බොහෝ ප්‍රයෝජන ඇත. ඒවායින් කිහිපයක් පහත සඳහන් වේ ⋅**

- **සැනසීම⋅** ඊමානය මුඃමින්වරයෙකුගේ සිත සන්සුන්භාවයට හා උත්තරීතර අල්ලාහ් කෙරෙහි සහ උන්වහන්සේගේ කද්රය කෙරෙහි තෘප්තිමත්භාවයට පත් කර, උන්වහන්සේට හැර වෙනත් කිසිවකට බිය නොවන ධෛර්යය සම්පන්න කෙනෙකු බවට පත්කරයි.
- **උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව හඳුනා ගැනීම⋅** මුඃමින්වරයා තම පරමාධිපති කෙරෙහි ඇති බැඳීම වැඩි කරගන්නා තරමට තම පරමාධිපති ව නිසිලෙස හඳුනා ගනියි. එවගේ ම, ඔහු තම පරමධිපතිගේ නාමයන්, ගුණාංග හා ක්‍රියාවන් හඳුනා ගනියි.
- **උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීම⋅** මුඃමින්වරයා තම පරමාධිපතිව හඳුනා ගන්නා තරමට ම උන්වහන්සේ කෙරෙහි ඇති ගෞරවය හා ශ්‍රේෂ්ඨත්වය වැඩි වේ. එමගින් ඔහු තුළ අල්ලාහ් කෙරෙහි වූ ආදරය, අපේක්ෂාව හා බිය ද වැඩි වනු ඇත.
- **තම ගැත්තන්ට යහ මඟ පෙන්වීමෙහි ලා උත්තරීතර අල්ලාහ්ගේ කැමැත්ත හා උනන්දුව පිළිබඳ දැනගැනීම⋅** උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මිනිසුන් වෙත දූතයින් එවා, දේව ග්‍රන්ථ පහළ කළේ සත්‍ය දහම කරා ඔවුනට මඟපෙන්වීමට ය.
- **මලාඉකාවරුන්ට ආදරය කිරීම ⋅** ඒ මලාඉකාවරුන් හෙවත් අල්ලාහ්ගේ සුර දූතයින් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් ව නැමද, උන්වහන්සේ හට අවනත වීම හේතුවෙන් ය.
- **උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ දූතයන්ට ආදරය කිරීම ⋅** උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ තම පණිවිඩය මිනිසුන් අතර ප්‍රචාරය කිරීම සඳහා ඔවුන් ව තෝරා ගත්හ.
- **අධික ව නැමඳුම් කටයුතුවල නිරත වීමට උත්සාහ කිරීම ⋅** මිනිසාගේ විශ්වාසය ශක්තිමත් වන තරමට ම ඔහුගේ නැමදුම් කටයුතු වැඩි වනු ඇත.
- **යහපත් ජීවිතය ⋅** උත්තරීතර අල්ලාහ් තමන්ට පිරිනමා ඇති දෑ කෙරෙහි මුඃමින්වරයා තෘප්තිමත් සිතින් යුතු ව ජීවත් වෙයි. මෙලොව දී තමාට සිදු වන විපත් හා අයහපත් දෑ මගින් තම තත්ත්වය හා තරාතිරම උසස් වන බවත්, තම අකුසල් කර්මයන් කමා කරනු ලබන බවත් ඔහු මැනවින් දනියි. තව ද, පරලොව දී තමා වෙනුවෙන් උත්තරීතර අල්ලාහ් සූදානම් කර ඇති දෑ කෙරෙහි අපේක්ෂාවෙන් යුතු ව සිටියි.
- **මෙලොවට සැපසම්පත්වලට මුළා නොවී සිටීම ⋅** මෙලොව ජීවිතය තාවකාලික වන අතර එය පරලොව ඇති සදාතනික ජීවිතය සඳහා වන මාර්ගයකි.
- **මිථ්‍යා විශ්වාස හෙළිදරව් වීම ⋅** ඊමාන් හෙවත් විශ්වාසය බොහෝ මිථ්‍යා විශ්වාස බොහොමයක් හෙළිදරව් කර, ඒවා ප්‍රතික්ෂේප කරයි.
- **ස්වර්ගයට පිවිසීම ⋅** එය උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් තම ගැත්තන්ගෙන් මුඃමින්වරුන් හෙවත් විශ්වාස කළවුන් වෙනුවෙන් වෙන් කර ඇති සැපසම්පත්වලින් පිරි සදාතනික වාසස්ථානය යි.

### මාගේ සටහන

ඔබ ඉස්ලාමයට වැළඳ ගැනීමෙන් පසු අත්විඳි ඊමාන් හෙවත් විශ්වාසයේ ප්‍රයෝජන ලියන්න.

# ඇගයුම් ප්‍රශ්න

**1** රසූල්වරුන් හෙවත් දේව දූතවරුන් ව විශ්වාස කිරීම යන්නෙහි අදහස වනුයේ, හුදෙක් මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ නුබූව්වත් හෙවත් දේව දූතත්ත්වය පමණක් විශ්වාස කිරීම ය.

○ හරි ○ වැරදි

**2** “who is Allah?” මෙම වීඩියෝ පටය නැරඹීමෙන් පසු මැවුම්කරුවාණන්ගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන අදහස ඇගයීමට ලක් කරන්න.

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

**3** “The Six fundamentals of faith” මෙම වීඩියෝ පටය නරඹා, ඊමාන් හෙවත් විශ්වාස කළ යුතු කරුණු හයෙන් එක් එක් කරුණ විශ්වාස කිරීමෙන් ඔබට හිමි වන ප්‍රයෝජන ලැයිස්තු ගත කරන්න.

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

## ස්වයං ඇගයීම

| | ඉගෙනීමේ අරමුණ | ඇගයීම් මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | විශිෂ්ටයි |
| 1 | මානව පැවැත්ම සම්බන්ධ ප්‍රශ්නවලට පිළිතුරු ඔබ දන්නෙහි ද? | | | | |
| 2 | ඔබට, ඉස්ලාම් යන්නෙහි තේරුම සරල ව පැහැදිලි කළ හැකි ද? | | | | |
| 3 | ඔබ, මුස්ලිම්වරයෙකු වන්නේ කෙසේදැ යි දන්නෙහි ද? | | | | |
| 4 | ඊමානයේ සාක්ෂි දෙක ඔබට වටහා ගත හැකි ද? | | | | |
| 5 | සාක්ෂි දෙකෙහි අවශ්‍යතාවය පැහැදිලි කළ හැක ද? | | | | |
| 6 | අර්කානුල් ඊමාන් හෙවත් විශ්වාස කළ යුතු කරුණු ඔබ දන්නෙහි ද? | | | | |
| 7 | අල් ඊමානු බිල්ලාහ් හෙවත් අල්ලාහ්ව විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 8 | අල් ඊමානු බිල් මලාඉකා හෙවත් මලක්වරුන්ව විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 9 | පහළ කරනු ලද දේව ග්‍රන්ථ විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 10 | අල් ඊමානු බිර්රුසුල් හෙවත් රසූල්වරුන්ව විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 11 | අල් ඊමානු බිල්යව්මිල් ආඛිර් හෙවත් අවසන් දිනය විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 12 | කද්ර් හෙවත් දෛවය විශ්වාස කිරීම යන්නෙහි තේරුම පැහැදිලි කළ හැකි ද? | | | | |
| 13 | ඊමානයේ සාක්ෂි දෙක නැවැරදිව උච්චාරණය කරන්නේ කෙසේදැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 14 | නව මුස්ලිම්වරයෙක් තම ඊමාන් හෙවත් විශ්වාසය ශක්තිමත් කරගන්නේ කෙසේදැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 15 | ඉස්ලාම් ධර්මය කෙරෙහි ආදරයක් ඔබේ හදවතට දැනෙනවා ද? | | | | |



## දෙවන ඒකකය

# උතුම් අල් කුර්ආනය







## ඒකකයේ අන්තර්ගත පාඩම්:

1. උතුම් අල් කුර්ආනය හැදෑරීම
2. කෙටි සූරාවල අර්ථ විවරණය







# පළමු පාඩම

# උතුම් අල් කුර්ආනය හැදෑරීම

## ප්‍රවේශය

නබිවරු හෙවත් වක්තෘවරුන්ව, තම නුබුව්වතය හෙවත් වක්තෘත්වය තහවුරු කරන ආකාරයේ ප්‍රාතිහාර්යයන් ලබා දී ඔවුන්ගේ සමාජය වෙත අල්ලාහ් යැව්වේය. ඔවුන්ගේ අවසානයත් සමගම ඔවුන්ගේ එම ප්‍රාතිහාර්යයන් ද අවසන් වුණි. නමුත්, ඉස්ලාමයේ දූත (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට ලබා දුන් අල් කුර්ආනය එතුමාණන්ගේ මරණින් පසුවත් ආරක්ෂා කරන බවට අල්ලාහ් සහතික වූ අයුරින් එතුමාණන්ගේ සමාජයට මෙන්ම සියලුම මිනිසුන්ට පෙනන ආකාරයේ ඔහුගේ ගෞරවාන්විත ග්‍රන්ථය, ආශ්චර්යයමත් ප්‍රාතිහාර්යයක් බවට පත්කළේය. මෙම පාඩමේ අල් කුර්ආනයේ මහිමය හා එහි ආචාර විධි ගැන ඉගෙන ගනිමු.

## උතුම් අල් කුර්ආනය යනු කුමක් ද?

උතුම් අල් කුර්ආනය යනු, උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ භාෂිතය වන අතර, උන්වහන්සේ එය තම දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා හට එය පහළ කළහ. . පහළ කරනු ලද අල්ලාහ්ගේ ග්‍රන්ථ වලින් අවසාන ග්‍රන්ථය මෙය වන අතර, එයට පසු වෙනත් දේව ග්‍රන්ථයක් (පහළ වන්නේ) නැත.

කුතුබුල්ලාහිල් මුනස්සලා හෙවත් පහළ කරනු ලැබූ දේව ග්‍රන්ථ යනු, උත්තරීතර අල්ලාහ් විසින් තම වක්තෘවරුන්ට පහළ කරන ලද දේව ග්‍රන්ථ ය. මෙම දේව ග්‍රන්ථ, උත්තරීතර අල්ලාහ්ගෙන් පහළ වූ බව මුස්ලිම්වරයෙක් විශ්වාස කරයි. උන්වහන්සේ ඒවායෙහි තමාට සුදුසු දෑ පිළිබඳ කතා කර ඇත්තාහ. එම දේව ග්‍රන්ථ අතුරින් දාවූද් (අලෙයිහිස් සලාම්) තුමා හට ‘සබූර්’ නමැති දේව ග්‍රන්ථය ද, මූසා (අලෙයිහිස් සලාම්) තුමා හට ‘තව්රාත්’ ද, ඊසා (අලෙයිහිස් සලාම්) තුමා හට ‘ඉන්ජීල්’ නමැති දේව ග්‍රන්ථය ද පහළ කරන ලදී. මෙම ග්‍රන්ථ කාලයේ ඇවෑමෙන් විකෘති කිරීම් හා වෙනස් කිරීම්වලට භාජනය විය.

## උතුම් අල් කුර්ආනය කියවීමෙහි මහිමය

- දේව දූත මුහම්මද්තුමාණෝ මෙසේ දේශනා කොට ඇත්තාහ. “කවරෙකු අල්ලාහ්ගේ ග්‍රන්ථයෙන් අකුරක් කියවන්නේ ද, ඔහුට කුසලයක් හිමි වන්නේය. එම කුසලය දස ගුණයකින් වැඩි වේ. (උතුම් අල් කුර්ආනයේ සඳහන්) අලිෆ් ලාම් මීම් යනු එක් අකුරක් යැයි මම නො පවසමි. අලිෆ් යනු එක් අකුරකි. ලාම් යනු එක් අකුරකි. මීම් යනු එක් අකුරකි.” (මූලාශ්‍රය: තිර්මිදී - 2910)
- ‘අල් කුර්ආනය පරායණ කරන්න. කියාමත් දවසේ එය පාරායණ කළ කෙනාට මැදිහත්කරුවෙකු වශයෙන් පෙනී සිටියි.’ යැයි දේව දූත මුහම්මද්තුමාණෝ පැවසූහ. (මූලාශ්‍රය : මුස්ලිම් - 804)

## අල් කුර්ආනය ආත්මයෙහි හා බුද්ධියෙහි පෝෂණය යි.

**උතුම් අල් කුර්ආනය මිනිස් ආත්මය හා බුද්ධිය යන දෙක ම සමාන ව ආමන්ත්‍රණ කර ඇත. පහත වැකි මඟින් උතුම් අල් කුර්ආනය බුද්ධිය ආමන්ත්‍රණය කරයි॰**

- විවිධ ගැටළු සම්බන්ධයෙන් බුද්ධිමය හා තාර්කික කරුණු දැක්වීම දිරිගැන්වීම. “(අහස් හා මිහිතලය යන) ඒ දෙකෙහි අල්ලාහ් හැර වෙනත් දෙවියන් ඇත්නම් ඒ දෙකම අක්‍රමික වනු ඇත. එබැවින් අර්ෂ්හි පරමාධිපති වන අල්ලාහ්, ඔවුන් වර්ණනා කරන මිථ්‍යා දෙයින් පිවිතුරු ය.” අල්ලාහ් පවසයි. (සූරා අල් අන්බියා’, 21:22).
- උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ ශක්තිය පෙන්නුම් කරන්නා වූ සාධක හා සංඛේත පිළිබඳ සිතා බැලීමට හා බුද්ධිය උපයෝගී කිරීමට උනන්දු කිරීම. “ඔබලා සිතා බලනු පිණිස, ඔබලාට අල්ලාහ් (තමන්ගේ) වදන් පැහැදිලි කරනුයේ එලෙස ය” යි අල්ලාහ් පවසයි. (සූරා අල් බකරා, 2:219).
- උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ සාධක පිළිබඳ තම බුද්ධිය උපයෝගී නොකරන හා ඒ පිළිබඳ සිතා නොබලන උදවියට දොස් පැවරීම. “නැතහොත්, සැබැවින්ම එවුන්ගෙන් බොහෝ දෙනෙක් (සත්‍ය) සවන් දෙනු ඇත යි හෝ එය වටහා ගනු ඇත යි ඔබ සිතන්නෙහි ද? ඔවුන් පශු කුලයට අයත් සතුන් මෙන් ය. (උන්ට වඩා) ඔවුන් (සෘජු) මාර්ගයෙන් ඉතා මුළාවූවන් ය.” යි අල්ලාහ් පවසයි. (සූරා අල් ෆුර්කාන්, 25: 44).

**පහත වැකි මඟින් උතුම් අල් කුර්ආනය ආත්මය හා හැඟීම් ආමන්ත්‍රණය කරයි॰**

- බොහෝ අවස්ථාවන්වලදී මානව හැඟීම් කෙරෙහි අවධානය යොමු කර, ඒවා ඉස්මතු කිරීම හා නිරූපණය කිරීම. “මිනිසුන් අතර, අල්ලාහ් නොවන සෙසු දෑ (අල්ලාහ්ට) සමගාමීන් ලෙස ගත් අය වෙති. (විශ්වාස කළවුන්) අල්ලාහ්ව ප්‍රිය කරන්නාක් මෙන් ඔවුහු එම සමගාමීන්ව ප්‍රිය කරති. නමුත්, විශ්වාස කළවුන් අල්ලාහ්ව (පමණක්) ප්‍රිය කිරීම, ඉතා දැඩිය.” යැයි අල්ලාහ් පවසයි. (සූරා අල් බකරා , 2:165).
- මානව හැඟීම් පිළිබඳ සිහිපත් කිරීම සහ ඒවායෙහි යහපත් හා අයහපත් බලපෑම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම. “අපි කිතුනුවන් යැයි පැවසූ අයව, ලෙන්ගතුකමින් විශ්වාස කළවුන්ට සමීපතම අය ලෙස සැබැවින්ම ඔබ දකින්නෙහි ය. ඒ, ඔවුන් අතුරින් පියතුමන්ලා සහ පැවිද්දන් සිටින හෙයින් ද ඔවුන් උඩඟු නොවන හෙයින් ද වේ.” යැයි අල්ලාහ් පවසයි. (සූරා අල් මාඉදා, 5:82).
- අන් අය ඉස්ලාමය කරා ඇරයුම් කරන විට මෘදුව හා කාරුණික ව කටයුතු කරන ලෙස විධානය කර තිබීම. “(නබිවරය,) ඔබ, ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස් මගින් ද ඔබගේ පරමාධිපතිගේ මාර්ගය කරා (ජනයින්ව) ඇරයුම් කරන්න. තවද ඉතා යහපත් දෙය මගින් ඔවුන් සමග වාද කරන්න.” යැයි අල්ලාහ් පවසයි. (සූරා අන් නහ්ල්, 16: 125).
- නීතිරීති හා සම්බන්ධ වැකිවල ඊමානීය අරුත් අන්තර්ගත ව තිබීම. “ඔබලා පෙර සිටියේ මෙලෙස ය. පසුව අල්ලාහ් ඔබලා කෙරෙහි (අභයදායී ජීවිතය පිරිනමා) උපකාර කර ඇත. ” යැයි අල්ලාහ් පවසයි. (සූරා අන් නිසා, 4:94).
- හදවතට දැනෙන හා හැඟීම් උද්දීපනය කරන්නා වූ වචන භාවිත කර තිබීම “අල්ලාහ් ඔබලාට සමාව ද ලබා දිය යුතු ය යැයි ඔබලා ප්‍රිය නො කරන්නෙහු ද?” යැයි අල්ලාහ් පවසයි. (සූරා අන්නූර්, 24:22).

සමහර විට බුද්ධිය සහ ආත්මය යන අංශ දෙක ම, එකම වැකියක අන්තර්ගත වන අතර, එක ම අවස්ථාවක දී බුද්ධිය ආමන්ත්‍රණය කොට, බුද්ධියට ඒත්තු ගන්වන අතර, මිනිස් හැඟීම් ද අවදි කරයි. “ජනයිනි, ඔබලා කෙරෙහි (දායාද කරන ලද) අල්ලාහ්ගේ දායාදයන් සිහිපත් කරන්න. අහසෙන් හා පොළොවෙන් ජීවන සම්පත් ලබා දෙන අල්ලාහ් නොවන වෙනත් මැවුම්කරුවෙකු සිටින්නේ ද? ඔහු හැර (නැමදීමට සුදුසු) වෙනත් දෙවියෙකු නොමැත. එසේ තිබියදී, ඔබලා (ඔහුගෙන් වෙනතකට) හරවනු ලබන්නේ කෙසේද?” (සූරා ෆාතිර්, 35:3).

### සාකච්ඡා කරන්න

ඔබ ඉස්ලාමය වැලඳ ගැනීමට පෙර කියවූ අල් කුර්ආන් වැකි මොනවාද? ඔබ කෙරෙහි ඒවායෙහි බලපෑම කෙසේ පැවතුණි ද?

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

## උතුම් අල් කුර්ආනය ජීවන මාර්ගයකි

උතුම් අල් කුර්ආනය යනු සියලු ම මිනිසුන් ව මැවූ, විශ්වයේ පරමාධිපතියාණන්ගේ භාෂිතය වේ. ඔවුනට වඩා ඔවුන් පිළිබඳ ව උන්වහන්සේ මැනවින් දනිති. එමෙන් ම, ඔවුනට යහපත ඇත්තේ කුමක ද? අයහපත ඇත්තේ කුමක ද? යන්න පිළිබඳ ව ද මනාව දනිති. පහළ කරනු ලැබූ අවසාන දේව ග්‍රන්ථය වන උතුම් අල් කුර්ආනය, මිනිසුන්ට ජීවත්වන මාර්ගය ගෙනහැර දක්වන ග්‍රන්ථයක් බවට උත්තරීතර අල්ලාහ් පත් කළේ එබැවිනි. එය පහත සඳහන් කරුණු මගින් පැහැදිලි වේ.

- උතුම් අල් කුර්ආනය පුද්ගල ජීවිතය, පවුල් ජීවිතය හා සමාජ ජීවිතය යන ත්‍රිත්වය මගින් මිනිසාගේ ජීවිතය හා පුළුල් ව බැඳී තිබීම.
- එහි තේමාවන් අකීදා හෙවත් ඉස්ලාමයේ මූලික සිද්ධාන්ත, ඉබාදා හෙවත් නැමදුම් කටයුතු, සිරිත් විරිත්, සමාජ සබඳතා මෙන් ම මානසික, ශාරීරික හා බුද්ධිමය අංශ වැනි විවිධ අංශ ආවරණය කර තිබීම.
- උතුම් අල් කුර්ආනය සතුරන් සමග පවා යුක්තිසහගත ව කටයුතු කරන ලෙස අණ කරන අතර, සියලු ම ආකාරයේ අසාධාරණ කටයුතුවලින් වළක්වයි.

උතුම් අල් කුර්ආනය මිනිසුන්ට තම ජීවිතය ගතකරන ආකාරය ගෙනහැර දක්වයි. ඔවුනට අදාළ නීතිරීති සෑම ස්ථානයකට ම මෙන් ම සෑම කාලයකට ම ගැළපෙන අයුරින් පනවමින් ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම් වඩාත් නම්‍යශීලීත්වයකින් යුක්ත ව පහදා දෙයි.



මුස්ලිම්වරයෙකු අල් කුර්ආනය කියවීමට හා එහි නීතිරීති හැදෑරීමට දැඩි උනන්දුවක් හා කැමැත්තක් දැක්විය යුතු ය.

## අල් කුර්ආනයේ සඳහන් දේව දූතයින්ගේ කථා වස්තු

උතුම් අල් කුර්ආනය පෙර පහළ වූ දේව දූතයිනගේ හා ඔවුන්ගේ සමාජය හා සම්බන්ධ කතාන්දරවලින් පිරී ඇත. එම කථා වස්තු ආදම් (අලෙයිහිස් සලාම්) තුමාගෙන් පටන්ගෙන නූහ්, හූද්, සාලිහ්, ෂුඅයිබ්, ඉබ්රාහීම්, ඉස්මායීල්, ඉස්හාක්, යඃකූබ්, මූසා සහ ඊසා (අලෙයිහිමුස් සලාම්) තුමන්ලා ඇතුළු අනෙකුත් වක්තෘවරුන් හා දූතයින් හා සම්බන්ධ ව දිගහැරෙයි. උතුම් අල් කුර්ආනය ඔවුන්ගේ කථා වස්තු සඳහන් කරන්නේ හේතු සහිත ව ය.

- සෑම දේව දූතයින්ගේ ම දහම එකක් බවත්, එහි පදනම උත්තරීතර අල්ලාහ්ගේ ඒකීයත්වය බවත් පහදා දීම.
- මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට මුහුණ දීමට සිදු වූ දෑ ඔහුට පෙර සිටි වක්තෘවරුන්ට ද මුහුණ දීමට සිදු වූ බව පෙන්වා දී, එතුමාණන් ව සැනසීම සහ දහමෙහි ස්ථිර කිරීම.
- මුඃමින්වරුන් හෙවත් විශ්වාස කළවුන්ට සිදු වන විපත්ති, ඔවුනට පෙර සිටි උත්තරීතර අල්ලාහ්ගේ යහ ගැත්තන්ට ද සිදු ව ඇති බව ඒත්තු ගැන්වීම.
- ඒවා සත්‍ය සිදුවීම් බැවින්, ඒවායින් පාඩම් සහ ආදර්ශ ඉගෙන ගැනීමට හැකි වීම.

### අභ්‍යාසය

**පහත සඳහන් සෑම වාක්‍ය ඛණ්ඩයක්ම එහි සම්බන්ධය අනුව සුදුසු කොටුවේ යොදන්න.**

- තම සගයිනට මැදිහත්කරුවෙකු වශයෙන් පෙනී සිටියි.
- අල්ලාහ්ගේ වචන
- සෙසු අයව ඉස්ලාමය කරා ඇරයුම් කරන විට මෘදුව හා කාරුණිකව කටයුතු කරන ලෙස විධානය කර තිබීම.
- බුද්ධියෙන් වැඩ කිරීමට ඇරයුම් කරයි.
- මනසට දැනෙන වචන භාවිතා කර තිබීම
- පහළ කරනු ලැබූ අවසාන දේව ග්‍රන්ථය
- එය, මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා වෙත පහළ කරන ලදී.

| අල් කුර්ආනයේ ගුණාංග |
| --- |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |

| අල් කුර්ආනයේ මහිම |
| --- |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |

# උතුම් අල් කුර්ආනය

**එහි සූරා හෙවත් පරිච්ඡේද ගණන**

114කි.

**එහි ආශ්චර්යමය ස්වභාවය** අරාබි කාෆිර්වරු උතුම් අල් කුර්ආනය ප්‍රතික්ෂේප කළහ. එබැවින්, උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ඔවුනට අල් කුර්ආනය වැන්නක් හෝ එයින් එක් පරිච්ඡේදයක් මෙන් හෝ වැකි දහයක් හෝ එක ම එක වැකියක් හෝ ගෙන එන ලෙස අභියෝග කළ නමුත්, ඔවුනට එසේ කිරීමට නොහැකි විය.



**එහි භාෂාව**

එය අරාබි භාෂාවෙන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ පහළ කළහ.

**එහි මූලාශ්‍රය**

උතුම් අල් කුර්ආනය මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමාගේ මාර්ගයෙන් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ පහළ කළහ.

**එහි ආයත් හෙවත් වැකි ගණන**

6236කි.

**එහි පහළ වීම**

මක්කා සහ මදීනා සමයේ අවුරුදු 23 කාලයක් විටින් විට උත්තරීතර අල්ලාහ් දෙවිඳාණෝ පහළ කළහ.

**එහි වෙනත් නම්**

උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් එයට අල් කුර්ආන්, අල් කිතාබ්, අල් ෆුර්කාන්, අස් සික්ර් යන නම් තබා ඇත. මීට අමතර වෙනත් නම් ද ඊට ඇත.

**එහි ප්‍රධාන තේමාවන්**

උතුම් අල් කුර්ආනයේ සඳහන් ප්‍රධානතම තේමාවන් කිහිපයක් පහත සඳහන් වේ.

- උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ ඒකීයත්වය හා උන්වහනසේ කෙරෙහි ආදේශ තැබීම ප්‍රතික්ෂේප කිරීම.
- මැවුම්කරුවාණන්ගේ සූක්ෂමභාවය හා නිරවද්‍යතාව පෙන්නුම් කරන විශ්වය.
- ආදර්ශ හා උපදෙස්වලින් පිරී ඇති උතුම් අල් කුර්ආනීය කථා වස්තු.
- අවසාන දිනයේ දී මිනිසුන් ව නැවත නැගිටවීම හා ඔවුන්ගේ ක්‍රියාවන්ට අනුව කුලිය ලබා දීම.
- මුඃමින්වරුන් හෙවත් විශ්වාසවන්තයින්ගේ ආධ්‍යාත්මිකත්වය දියුණු කිරීම හා ඔවුනට අදාළ නීති සම්පාදනය.

## ඇගයුම් ප්‍රශ්න

**1** මුඃමින් හෙවත් විශ්වාසවන්තයා හා උතුම් අල් කුර්ආනය අතර ඇති බැඳීම, ජීවිතය අවසානයත් සමග අවසන් වේ.

◯ හරි ◯ වැරදි

**2** උත්තරීතර අල්ලාහ් උතුම් අල් කුර්ආනය පහළ කළේ මන්ද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**3** 'alnaba.ws' යන මෙම වෙබ් අඩවිය පිරික්සා, අල් කුර්ආනයේ ප්‍රාතිහාර්යයේ සමහර අංග උපුටා දක්වමින් එහි සත්‍යතාවය පෙන්නුම් කරන සාධක කිහිපයක් සඳහන් කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**4** උත්තරීතර අල්ලාහ් උතුම් අල් කුර්ආනය පහළ කළේ,

◯ අ) සියලු වක්තෘවරුන්ට ය. ◯ ආ) මුහම්මද් තුමාණන්ට ය.



# දෙවන පාඩම

# කෙටි සූරාවල අර්ථ විවරණය

## ප්‍රවේශය

සූරා ෆාතිහා යනු උතුම් අල් කුර්ආනයේ ඇති ශ්‍රේෂ්ඨතම සූරාව යි. උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ දූත මුහම්මද්තුමාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) මෙහි මහිමය හා ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ බොහෝ හදීස් මඟින් අවධාරණය කර ඇත. සෑම මුස්ලිම්වරයෙකු ම මෙම සූරාව කටපාඩම් කළ යුතු ය. මන්ද යත්, තම සලාතයේ (නැමදුමෙහි) අනිවාර්යයෙන් ම කියවිය යුතු එක ම සූරාව මෙය යි. මෙම පාඩමේදී මෙම සූරාව පිළිබඳ ඉගෙන ගනිමු. එහි වැකි කටපාඩම් කර, ඒවායේ අරුත් වටහා ගනිමු. එමෙන් ම, ශ්‍රේෂ්ඨ අරුත් අන්තර්ගත තවත් කෙටි සූරාවන් කිහිපයක් ඉගෙන ගනිමු.

## සූරතුල් ෆාතිහා (ආරම්භය)

සූරා අල් ෆාතිහා අර්ථ විග්‍රහය:

"අසමසම කරුණාන්විත අපරිමිත දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරන්නෙමි)"

සත්‍ය නැමදුම් ලබන්නා වන උත්තරීතර අල්ලාහ්ගෙන් උපකාරය පතමින් උන්වහන්සේගේ නාමයෙන් උතුම් අල් කුර්ආනය පරායනය කිරීමට ආරම්භ කරන්නෙමි. උන්වහන්සේ පොදුවේ සියලු මැවීම්වලට කරුණාවන්ත වන අතර, තම ගැත්තන් වන මුඃමින්වරුන් කෙරෙහි විශේෂ වූ දයාවක් දක්වති.

"සියලු පැසසුම් විශ්වයේ පරමාධිපති වන උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ට ම හිමි ය."

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ පරිපූර්ණ වූ ගුණාංග හේතුවෙන් සහ සියලු මැවීම් හට උන්වහන්සේ පිරිනමා ඇති දායාද හේතුවෙන් සියලු ම ආකාරයේ ප්‍රශංසා සඳහා සුදුස්සා උන්වහන්සේ පමණි. කිසිවකින් තොර ව සියල්ල නිර්මාණය කොට, ඒ සියල්ල පරිපාලනය කරන්නා හා සංවර්ධනය කරන්නා වන උන්වහන්සේ සියලු ම මැවීම්හි පරමාධිපතියාණෝ වෙති.



"උත්තමයාණන් සැමට කරුණාවන්ත හා දයාන්විත ය."

අර්රහ්මාන් යනු පොදුවේ සියලු මැවීම්වලට කරුණාව දක්වන්නා යන්නත්; අර් රහීම් යනු, එම මැවීම්වලින් මුඃමින්වරුන් කෙරෙහි සුවිශේෂී වූ කරුණාවක් දක්වන්නා යන්න ය.



සියලු ම මැවීම් කෙරෙහි කරුණාවන්ත ය.



විශේෂයෙන් ම මුඃමින්වරුන් කෙරෙහි කරුණාවන්ත ය.

"විනිශ්චය දිනයේ අධිපති ය." ක්‍රියාවන් සම්බන්ධයෙන් විභාග කර, ඒ සඳහා කුලිය ලබා දෙන දිනය වන විනිශ්චය දිනයේ අධිපති ය.

"අපි ඔබ ව පමණක් ම නමදින්නෙමු. ඔබගෙන් පමණක් ම උදව් පතන්නෙමු." අපගේ පරමාධිපති වන ඔබ ව පමණක් නමදින්නෙමු. සෑම කටයුත්තක් ම ඔබගේ අතෙහි බැවින් අපගේ සෑම කටයුත්තක දී ම ඔබගෙන් ම පමණක් උදව් පතන්නෙමු.

"අප හට ඍජු මාර්ගය වෙත මඟ පෙන්වනු මැන!" අපට ඍජු මග පෙන්වා දෙනු මැන! ඔබ ව හමුවන තෙක් අප එම ඍජු මාර්ගයේ ම ස්ථාවර කරනු මැන! මෙහි ඍජු මාර්ගය යන්නෙන් අදහස් වන්නේ ඉස්ලාම් ධර්මය යි. උත්තරීතර අල්ලාහ්ගේ තෘප්තිය සහ උත්තමයාණන්ගේ ස්වර්ග කරා ගෙන යන පැහැදිලි මාර්ගය ද එය යි.

"(එම ඍජු මාර්ගය කෙසේ ද යත්) ඔබ කවුරුන් කෙරෙහි ආශිර්වාද කළෙහි ද ඔවුන්ගේ මඟ යි. ඔබගේ උදහසට ලක්වූවන්ගේ හා නොමඟ ගියවුන්ගේ මාර්ගය නොවේ."

එම මාර්ගය නම් වක්තෘවරුන්, ඔවුන්ගේ සහගාමීන් සහ ඔවුන් අනුගමනය කළ උදවිය ඇතුළු යහ මාර්ගය වෙත ඔබ මඟපෙන්වූ උදවියගේ මාර්ගය යි. ඔවුහු යහමඟ ලැබ, එහි ස්ථිර ව ම සිටි උදවිය වෙති.

සත්‍යය දැන, ඒ අනුව ක්‍රියා නොකළ හේතුවෙන් ඔබගේ කෝපයට පාත්‍ර වූ අයගේ මාර්ගයෙන් හා තම අඥානවන්තභාවය හේතුවෙන් යහමඟ නොලැබ, නොමඟ ගියවුන්ගේ මාර්ගයෙන් අප ව දුරස් කරනු මැන!

## සාකච්ඡා කරන්න

සූරා අල් ෆාතිහාව කටපාඩම් කළ හැකි ක්‍රම මොනවා ද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

## සූරා අල් ඉඛ්ලාස් (පිවිතුරුභාවය)

සූරා අල් ඉඛ්ලාස් අර්ථ විග්‍රහය:




"(නබිවරය,) ඔබ පවසන්න. ඔහු, අල්ලාහ් ඒකීය ය."

දූතයාණෙනි, ඔබගේ පරමාධිපතිගේ විස්තර ඔබෙන් විමසන්නන්ට : 'ඔහු, (එනම්) අල්ලාහ් දේවත්වයෙන් හා පරමාධිත්වයෙන් ඒකීය ය. ඔහු හැර වෙනත් දෙවි කෙනෙක් නැත' යි පවසන්න.

"(ඔහු) කිසිවෙකු කෙරහි හා කිසිදෙයක් කෙරෙහි අවශ්‍යතාවයක් නොමැත්තා ය."

උන්වහන්සේ පරිපූර්ණ ගුණාංගවලින් යුක්ත ය. සියලු මැවීම් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට උන්වහන්සේ වෙත යොමු වන නමුත්, උන්වහන්සේට මැවීම් කෙරෙහි කිසිදු අවශ්‍යතාවක් නොමැත.

"ඔහු කිසිවෙකු ජනිත නොකළ අතර, ඔහු ද කිසිවෙකු විසින් ජනිත නො කරන ලදී."

ඔහුට දරුවන් මෙන්ම දෙමාපියන් ද නොමැත. එනම්, ඔහුට පුතෙක් හෝ දුවෙක් නැත. එවගේ ම, පියෙක් හෝ මවක් නැත.

"තව ද, ඔහුට සමාන කිසිවෙක් නොමැත."

ඔහුගේ මැවීම් අතුරින් ඔහුගේ නාමයෙන් හෝ ඔහුගේ ගුණාංගවලින් හෝ ඔහුගේ ක්‍රියාවෙන් හෝ ඔහුට සමාන කිසිවෙක් නොමැත.

## සූරා අල් ෆලක් (අරුණෝදය)

සූරා අල් ෆලක් අර්ථ විග්‍රහය:




"(නබිවරය,) ඔබ පවසන්න. මම අරුණෝදයේ පරමාධිපතියාණන්ගෙන් රැකවරණය පතන්නෙමි."
දූතයාණෙනි, ඔබ, 'අලුයම උදාව හෙවත් අරුණෝදයේ පරමාධිපතිගෙන් මම රැකවරණය පතමි' යැයි පවසන්න.

"ඔහු නිර්මාණය කළ දෑහි නපුරෙන් ද."

ඔහු නිර්මාණය කළ, අපිට පෙනෙන සහ නො පෙනෙන සියල්ලෙහි නපුරෙන් ද.

"ඝන අන්ධකාරය පිවිසෙන විට, රාත්‍රියේ නපුරෙන් ද."

අඳුර වැටෙන විට, රාත්‍රියේ නපුරෙන් ද, එහි ඇති අයහපත හා හානිවලින් ද,



අල් ෆලක් යනු අලුයම උදාව හෙවත් අරුණෝදය යි.



අල් ගසක් යනු, රාත්‍රියේ දැඩි අන්ධකාරය යි.

"(මතුරා) ගැට මත පිඹින්නියන්ගේ නපුරෙන් ද,"

හූනියම් වැනි අදෘෂ්‍යමාන දෑ හා සම්බන්ධ කටයුතුවල දී ගැට මත පිඹින මායාකාරීන්ගේ නපුරෙන්,

"ඊර්ෂ්‍යා කරනවිට ඊර්ෂ්‍යා කාරයාගේ නපුරෙන් ද. මම රැකවරණය පතමි."

ඊර්ෂ්‍යාවට ලක්වන්නාගේ දායාද ඉවත් වී ඔහුට හානි ඇති විය යුතු යි පතන ඊර්ෂ්‍යාකාරයාගේ නපුරෙන් (මම රැකවරණය පතමි).

## සූරා අන් නාස් (මිනිසුන්)

සූරා අන් නාස් අර්ථ විග්‍රහය:




"(නබිවරය,) ඔබ පවසන්න. මම මිනිසුන්ගේ පරමාධිපතියාණන්ගෙන් රැකවරණය පතන්නෙමි."

දූතයාණෙනි, මිනිසුන්ගේ පරමාධිපතිගෙන් මම රැකවරණය පතමි යැයි පවසන්න. ඔහුට සියල්ල තනිව ම කළ හැකි ය.

"මිනිසුන්ගේ අධිපති ය."

සියලු මිනිසුන්ගේ අධිපති ය. ඔවුන්ගේ කටයුතු සියල්ල හසුරුවන්නා ය.

"මිනිසුන්ගේ දෙවියන් ය."

සියලු මිනිසුන්ගේ දෙවියන් ය. ඔහු හැර සුදුසු වෙනත් දෙවි කෙනෙක් නැත.

"(අල්ලාහ්ව සිහිපත් කරන විට,) පසු බසින්නා වූ, සැක සහිත සිතුවිලි කොඳුරන්නාගේ නපුරෙන් ද,"

(දැහැමි කටයුතුවල දී) ඔවුන් නොසැලකිලිමත් ව සිටින විට ඔවුන්ට නපුරු සිතුවිලි කොඳුරන හා ඔවුන් අල්ලාහ් ව සිහිපත් කරන විට එයින් වැලකී සිටින ෂෙයිතාන්ගේ හානියෙන් ද,

"මොහු කවරෙකු ද යත්, මිනිස් සිත් තුළ සැක සහිත සිතුවිලි උපදවන්නෙකි."

මිනිසුන්ගේ සිත් තුළ නපුරු සිතුවිලි ඇති කර, ඔවුන්ගේ හැඟීම් හා අදහස් හසුරුවයි.

"(මෙවැනි උදවිය) ජින්වරුන් හා මිනිසුන් අතර සිටිති."

ජින් සහ මිනිස් ෂෙයිතාන්වරුන්ගෙන් (මම රැකවරණය පතමි.)

## සූරා අල් කාෆිරූන් (ප්‍රතික්ෂේප කරන්නන්)

සූරා අල් කාෆිරූන් අර්ථ විග්‍රහය:




"(නබිවරය,) ඔබ පවසන්න : ප්‍රතික්ෂේප කළවුනි, "

අල්ලාහ්ව සහ ඔහුගේ දූතයාව ප්‍රතික්ෂේප කළ අය උදෙසා, අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළවුනි, යැයි ආමන්ත්‍රණය කොට නබිවරය ඔබ පවසන්න.

"ඔබලා නමදින දෑ මම නො නමදිමි."

ඔබලා නමදින පිළිම වැනි බොරු දෙවිවරුන්ව මම නො නමදිමි.

"තවද මා නමදින දෑ ඔබලා නො නමදින්නෙහුය."

මම නමදින දෙවියා පමණක් නැමදීමට සුදුසු සැබෑ දෙවියා වශයෙන් සිටිද්දී ඔබලා ඔහුව නො නමදින්නෙහුය.

"ඔබලා නැමදූ දෑ මම (අනාගතයේදී පවා) නො නමදිමි."

ඔබලා නමදින බොරු දෙවිවරුන්ව මම නො නමදිමි.

අල්-කාෆිර්: නිර්මල ඒකදේවවාදය ප්‍රකාශ නොකරන සහ මුහම්මද් නබිතුමා ගෙන ආ දිව්‍ය පණිවිඩය අනුගමනය නොකරන පුද්ගලයා.

"තවද මා නමදින දෑ ඔබලා නො නමදින්නෙහුය."

මම නමදින දෙවියා පමණක් නැමදීමට සුදුසු සැබෑ දෙවියා වශයෙන් සිටිද්දී ඔබලා ඔහුව නො නමදින්නෙහුය.

"ඔබලාට ඔබලාගේ දහම ය. මට මාගේ දහම ය."

ඔබ පිළිපදින ඔබේ දහම ඔබට ය. මට මගේ දහම ය.

### සාකච්ඡා කරන්න

සූරා ඉඛ්ලාස් සහ සූරා කාෆිරූන් අවධාරණය කරන විෂය කුමක්ද?

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

## සූරා අල් කවුසර් (අධික යහපත)

සූරා අල් කව්සර් විස්තර කරයි:




"සැබැවින්ම අපි, 'කවුසරය' ඔබට පිරිනැමුවෙමු."

දූතයාණෙනි, මෙලොව හා පරලොව, ගණන් කළ නොහැකි හා අසීමිත බොහෝ යහපත් දෑ නියත වශයෙන් ම අපි ඔබට පිරිනමා ඇත්තෙමු. ස්වර්ගයේ ඇති 'කවුසර්' නැමති ගඟ ඉන් එකකි.

"එබැවින්, ඔබගේ පරමාධිපති වෙනුවෙන් සලාතය ඉටුකර, (සතුන්) කැප කරන්න."

එබැවින්, ඔබගේ සලාතයන් හා කැපකිරීම් අල්ලාහ්ට පමණක් වන සේ පිවිතුරු කර ගන්න. ආදේශ නොමැති ඔහුව ම පමණක් නමදින්න. ආදේශ නොමැති ඔහු, ඔබට ලබා දුන් ගරුත්වය හා යහපත වෙනුවෙන් තුති පිදීම පිණිස, ඔහුගේ නාමයෙන් පමණක් (සතාගේ ගෙල) කපන්න.

"ඔබගේ සතුරා" යනු ඔබව හා ඔබ ගෙන ආ සත්‍ය දහම පිළිකුල් කරන්නා වේ.

"සැබැවින් ම ඔබගේ සතුරා වන ඔහු (සියලු ආකාරයේ යහපත් දෑ) අහිමි වූ තැනැත්තා ය."

සැබැවින්ම, ඔබව සහ ඔබ රැගෙන ආ සත්‍ය දහම පිළිකුල් කර, ඔබව කෝපයට පත් කරන්නා, සියලු ම ආකාරයේ යහපත් දෑ අහිමි වූ නින්දා සහගත තැනැත්තා ය.

## සූරා අල් අස්ර් (කාලය)

සූරා අල් අස්ර් අර්ථ විග්‍රහය:




"කාලය මත දිවුරමින්."

මිනිසුන්ගේ යහපත් හා අයහපත් කටයුතු සිදු වන්නා වූ කාලය මත උත්තරීතර අල්ලාහ් දිවුරා ඇත.

"සැබැවින් ම මිනිසා අලාභයෙහි ය."

නියත වශයෙන් ම මිනිසා අලාභයෙහි සහ විනාශයෙහි සිටී.

"(නමුත්,) විශ්වාස කර යහකම් කර, සත්‍යය හා ඉවසීම පිළිබඳ ව එකිනෙකාට උපදෙස් දුන් අය හැර."

උත්තරීතර අල්ලාහ් ව විශ්වාස කර යහක්‍රියාවන් කළ, සමහරු තවත් සමහරුනට සත්‍යයෙහි ස්ථිර ව හා ඉවසීමෙන් සිටින ලෙස උපදෙස් කර ගත් අය හැරෙන්නට (අනෙකුත් සියලු දෙනා අලාභයෙහි සිටිති.)

# ස්වයං ඇගයීම

| | ඉගෙනීමේ අරමුණු | ඇගයීම් මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | විශිෂ්ටයි |
| 1 | අල් කුර්ආනය යනු කුමක් දැයි ඔබට පැහැදිලි කළ හැකි ද? | | | | |
| 2 | අල් කුර්ආනය හා ජීවිතය අතර සම්බන්ධය සිතා ගත හැකි ද? | | | | |
| 3 | වක්තෘවරුන්ගේ කතා අල් කුර්ආනයේ සඳහන් කර ඇත්තේ මන් දැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 4 | සූරා අල් ෆාතිහාවෙහි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 5 | සූරා අල් ඉඛ්ලාස්හි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 6 | සූරා අල් ෆලක්හි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 7 | සූරා අන් නාස් සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 8 | සූරා අල් කාෆිරූන්හි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 9 | සූරා අල් කවුසර්හි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 10 | සූරා අල් අස්ර්හි සම්පූර්ණ අර්ථය ඔබට තේරෙනවා ද? | | | | |
| 11 | ඔබට සූරා අල් ෆාතිහාව නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 12 | ඔබට සූරා අල් ෆාතිහාව කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 13 | ඔබට සූරා අල් ඉඛ්ලාසය නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |

| | ඉගෙනීමේ අරමුණ | ඇගයීම් මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | විශිෂ්ටයි |
| 14 | ඔබට සූරා අල් ඉඛ්ලාසය කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 15 | ඔබට සූරා අල් ෆලක් නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 16 | ඔබට සූරා අල් ෆලක් කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 17 | ඔබට සූරා අන් නාස් නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 18 | ඔබට සූරා අන් නාස් කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 19 | ඔබට සූරා අල් කාෆිරූන් නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 20 | ඔබට සූරා අල් කාෆිරූන් කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 21 | ඔබට සූරා අල් කවුසර් නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 22 | ඔබට සූරා අල් කවුසර් කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 23 | ඔබට සූරා අල් අස්ර් නිවැරදිව පාරායනය කළ හැකි ද? | | | | |
| 24 | ඔබට සූරා අල් අස්ර් කටපාඩම් කරගැනීමට හැකි වී තිබේ ද? | | | | |
| 25 | ඔබ ඉගෙන ගත් සූරාවන්හි අර්ථය ඔබට දැනෙනවා ද? | | | | |



# තෙවන ඒකකය

## නැමදුම







## ඒකකයේ අන්තර්ගත පාඩම්

1. නැමඳුම
2. පවිත්‍රතාවය
3. වුළූ කිරීම
4. ස්නානය
5. ස්ත්‍රීන් හා බැඳි නීතිරීති
6. සලාතය
7. සකාතය (නියත බද්ධ)
8. උපවාසය
9. හජ් වන්දනාව







# පළමු පාඩම

# නැමඳුම

## ප්‍රවේශය

මුස්ලිම්වරයෙක් සිය මැවුම්කරුවාණන්ට සමීප වීම පිණිස තම ජීවිතයේ බොහෝ නැමඳුම් කටයුතුවල නියළෙන්නේය. ඒ සෑම නැමඳුමක් ම සැබවින් ම උන්වහන්සේ ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීමක් හා උන්වහන්සේ හට පමණක් ඇති අවනතභාවය නිරූපනය කිරීමකි. මුස්ලිම්වරයෙකුගේ හදවත උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව ශ්‍රේෂ්ඨත්වයට පත් කරන සෑම විට ම, එය ඔහුගේ නැමඳුම්වල සංකේතවත් වේ. අල්ලාහ් දෙවිඳුන් උතුම් අල් කුර්ආනයේ "නියත වශයෙන් ම මාගේ සලාතය ද මාගේ කැප කිරීම ද මාගේ ජීවිතය ද මුළු මහත් විශ්වයේ ම පරමාධිපතියාණන් වන අල්ලාහ්ට ම හිමි ය. උන්වහන්සේට කිසිදු හවුල්කරුවෙක් නොමැත. මා අණ කරනු ලැබුවේ මේ පිළිබඳ ව ය. තව ද, මම මුස්ලිම්වරුන් අතුරින් ප්‍රථමයා වෙමි." (සූරා අල් අන්ආම්, 6:162-163) යනුවෙන් සඳහන් වන පරිදි, සැබෑ මුස්ලිම්වරයා යනු ඔහු තම ජීවිතයේ සෑම කරුණක් ම, එය යම් ක්‍රියාවක නියැළීම හෝ නිදාගැනීම හෝ සතුටු වීම හෝ වේවා ඒ සියල්ලක් ම උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් වෙනුවෙන් ම පත් කරගනියි. මෙම පාඩමෙන් ඉබාදත් යනු කුමක් ද එහි වර්ග, ඉබාදත් පිළිගනු ලැබීම සඳහා වන කොන්දේසි හා ඉබාදත්හි තරාතිරම් පිළිබඳ ව අපි හදාරමු.

## ඉබාදත් යන්නෙහි අරුත

මිනිසෙකු උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ට සමිප වීම පිණිස උන්වහන්සේ විසින් පනවා ඇති ක්‍රියා ඉබාදත් වේ. එනම්, උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ප්‍රිය කරන ක්‍රියා හා වදන්වල එකතුවකි. ඒවා ශාරීරික නැමඳුම්වලට නිදසුන් වන සලාතය, හජ් වැනි බාහිර නැමඳුම් හෝ මනස හා බැඳි නැමඳුම්වලට නිදසුන් වන අල්ලාහ් දෙවිඳුන් කෙරෙහි ඇති ආදරය, බිය හෝ අපේක්ෂාව වැනි අභ්‍යන්තර ඉබාදත් හෝ විය හැක. මිනිසෙකුට තමන් එදිනෙදා ඉටු කරන ක්‍රියා ඇතුළු සිය සෑම ක්‍රියාවක් ම යහපත් චේතනාව ඇති කරගැනීම හරහා නැමඳුමක් වශයෙන් පරිවර්තනය කරගත හැකි ය. එනම් 'අල්ලාහ්ට අවනත වීම සඳහා ශක්තිය ලබා ගැනීම' යන චේතනාවෙන් යමෙකු ආහාරපාන ගන්නේ නම් හෝ නිදාගන්නේ නම් ඒ සඳහා ද ඔහුට කුසල් හිමි වේ.

## ඉබාදත් වර්ග

**ඉබාදත් වර්ග කිහිපයකට බෙදේ.**



**සිත හා බැඳි නැමඳුම**

**ආදාරය බිය අපේක්ෂාව හා හුශූඃ වැනි මුස්ලිම්වරයෙකු සිය සිත උපයෝගී කරගෙන කරන නැමඳුම් මෙම වර්ගයට අයත් වේ.**



**කය හා බැඳි නැමඳුම**

**සලාතය, සකාතය (නියත බද්ධ) හා හජ් කර්තව්‍යය වැනි මුස්ලිම්වරයෙක් සිය කය උපයෝගී කරගනිමින් ඉටුකරන නැමඳුම් මෙම වර්ගයට අයත් වේ.**



**වැළකී සිටිමෙන් කරන**

**සුරාව, දුරාචාරය වැනි තහනම් කර ඇති දෑ හෝ උපවාසය අතරතුර අහාරපානවලින් මිදී සිටීම වැනි නිශ්චිත කාල සීමාවක් සඳහා අනුමත දෑ අත්හැරීම ආදී වැළකී සිටිය යුතු කරුණුවලින් වැළකී සිටීමෙන් ඉටු කරන නැමඳුම් මෙම වර්ගයට අයත් වේ.**

අපේක්ෂාව යනු :- උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ දායාද කෙරෙහි තෘප්තිමත් වීම හා කැපවීමෙන් සහ නිවැරදි අයුරින් අල්ලාහ් දෙවිඳුන් වෙත සියල්ල භාර කරමින් උන්වහන්සේගේ උපකාර හා පරිත්‍යාග කෙරෙහි මහත් කැමැත්තෙන් යුතු ව බලාපොරොත්තු තබා ගැනීම.

හුශූඃ :- සලාතය වැනි ඉබාදත් ඉටු කිරීමේ දී අවධානය වෙනතකට යොමු නොවී, සිත සන්සුන් ව පවතින්නා වූ තත්ත්වයකි. එහි බලපෑම පංචේන්ද්‍රයන්හි නිශ්චලභාවයෙන් පිළිබිඹු වේ.

## ඉබාදත් හෙවත් නැමඳුම් පිළිගනු ලැබීම සඳහා වන කොන්දේසි

**නැමඳුම් පිළිගැනීම සඳහා කොන්දේසි ද්විත්වයක් ඇත.**

**පළමුවැන්න ∙** උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටුකරනවා යන පවිත්‍ර චේතනාවෙන් ඉටු කිරීම. එනම්, උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ට සමීප වීම සඳහා කිසිඳු ආදේශ කිරීමක් හෝ මුනිච්චාවකින් තොර ව නැමඳුම් කිරීම.

**දෙවැන්න ∙** උත්තරීතර අල්ලාහ්ගේ මඟපෙන්වීමට අනුකූල වීම. උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ මඟපෙන්වීම් හා දේව දූත මුහම්මද්තුමාණන් එය ඉටු කළ අයුරින් මුස්ලිම්වරයෙකු නැමඳුම් කිරීම.

මුනිච්චාව යනු :- තමන් නැමඳුම් කිරීම අන් අය දැක, ඔවුන් තමාට ප්‍රශංසා කිරීම අපේක්ෂාවෙන් නැමඳුම් කිරීම වේ.

### සාකච්ඡා කරන්න



යමෙකු අල්ලාහ් වෙනුවෙන් යන පවිත්‍ර චේතනාවෙන් තොරව නැමඳුම් කිරීම මගින් ඔහුට ඇතිවන අවාසි මොනවා ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

## ඉබාදත්හි තරාතිරම

**ඉබාදත්හි විවිධ තරාතිරම් ඇත. ඒ අතුරින් කිහිපයක් මෙසේ දැක්විය හැක.**

- සලාතය වැනි සෑම මුස්ලිම්වරයෙකුට ම අනිවාර්ය වන ඉබාදත්.
- ධනවතුන්ට පමණක් අනිවාර්ය සකාතය වැනි මුස්ලිම්වරුන්ගෙන් කොටසකට පමණක් අනිවාර්ය වන ඉබාදත්.
- සලාතයෙන් පසු උසුරන ප්‍රාර්ථනා හා දික්ර් (උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව මෙනෙහි කරන වදන්) වැනි අනිවාර්ය නොවන සුන්නත් (ප්‍රියජනක) ඉබාදත්.

### අභ්‍යාස

**පහත දැක්වෙන ඉබාදතයන්ට අදාළ තරාතිරම අනුව ඊට අදාළ තීරුවෙහි යොදන්න.**

- උදෑසන දික්ර් (උත්තරීතර අල්ලාහ් දෙවිඳුන් ව මෙනෙහි කරන වදන්)
- අසර් සලාතය
- හජ් කර්තව්‍යය
- දෙමව්පියන්ට කීකරුවීම
- සකාතය
- රමළාන් මස උපවාසය

**සෑම මුස්ලිම්වරයෙකුට ම අනිවාර්ය නැමඳුම්**

**මුස්ලිම්වරුන් පිරිසකට පමණක් අනිවාර්ය නැමඳුම්**

**අනිවාර්ය නොවන සුන්නත් (ප්‍රියජනක) නැමඳුම්**

# ඇගයුම් ප්‍රශ්න

**1** ‘මම අල්ලාහ් දෙවිඳුන්ට අවනත විය යුත්තේ ඇයි’ යන වීඩියෝ පටය නරඹා, උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ගේ අපේක්ෂාව හා අභිමතය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් හා තම සියලු ක්‍රියා උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් ම පමණක් යන පිවිතුරු චේතනාවෙන් යුතු ව ඉටු කිරීමෙන් මුස්ලිම්වරයෙකුට හිමි වන ප්‍රතිලාභ කවරේ ද යන්න පිළිබඳ සාකච්ඡා කරන්න.

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

**2** යහපත් ක්‍රියාවක් පිළිගනු ලැබීමට උත්තරීතර අල්ලාහ් කෙරෙහි වූ ඉඛ්ලාස් හෙවත් පිවිතුරු චේතනාව හා ඉස්ලාමීය මඟපෙන්වීමට අනුගත ව තිබීම අනිවාර්ය වේ.

◯ නිවැරදි ය. ◯ වැරදි ය.



# දෙවන පාඩම

# පවිත්‍රතාවය

## හැඳින්වීම

ඉස්ලාමය පවිත්‍රතාවය හා පිරිසිදුකම කෙරෙහි උනන්දු කරන අතර, මුස්ලිම්වරයෙකු සිය පුද්ගලික පවිත්‍රතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු යැයි අවධාරණය කරයි. එමෙන් ම, මෙම කරුණ ආගමික වත්පිළිවෙතක් වශයෙන් ද පත් කොට ඇත. බොහෝ නැමඳුම්වල වලංගුභාවය මුස්ලිම්වරයෙකුගේ පවිත්‍රත්වය සමඟ සම්බන්ධ කර ඇත. පවිත්‍රතාවය දේව විශ්වාසවන්තකයෙකුගේ ලක්ෂණයක් හා මුස්ලිම්වරයෙකු හා මුස්ලිම් නොවන්නෙකු අතර වෙනස හුවා දක්වන සංකේතයක් ලෙස ද සැලකේ. මෙම පාඩම තුළින් පවිත්‍රතාවය යනු කුමක් ද, එහි වර්ගීකරණය හා ඒ හා බැඳි නිතීරීති කිහිපයක් පිළිබඳ හදාරමු.

## පවිත්‍රතාවය යන්නෙහි අරුත

### පවිත්‍රතාවය යන්නෙහි අරුත

**උත්තරීතර අල්ලාහ් ව නැමදීම**

යම් ක්‍රියාවක් උත්තරීතර අල්ලාහ්ට අවනත වීමක් හා උන්වහන්සේට සමීප වීමක් වශයෙන් අදිටන් කරගැනීම.

**කිල්ලෙන් බැහැර වීම**

ශරීර අවයවයන් මගින් ඇති වන්නා වූ දෑ. එමඟින් පිරිසිදුභාවය මුළුමනින් ම තුරන් වේ.

**සහ අපිරිසිදු දෑ ඉවත් කිරීම**

මළමුත්‍රා වැනි ඉස්ලාමය පිරිසිදු කරන මෙන් අණ කර ඇති දෑ.

අමතර කියවීම පිණිස

ජාත්‍යන්තර භාෂා කිහිපයකින් උසුල් වෙබ් අඩවියේ ඇති පවිත්‍රතාව පිළිබඳ ඉස්ලාමීය නිතිය ගැන වැඩිදුර දැන ගැනීමට.

පොත භාගත (Download) කිරීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## පවිත්‍රතා වර්ගීකරණය

පවිත්‍රතාවය දෙවර්ගයකි

**භෞතික පවිත්‍රතාවය**

එනම් අපිරිසිදුකාරක ඉවත් කර අදාළ ස්ථානය පිරිසිදු කිරීම

**අභෞතික පවිත්‍රතාවය**

සිතෙහි පවිත්‍රතාව. එනම් අල්ලාහ්ට ආදේශ කිරීම, කුහක කම හා අල්ලාහ් ව විශ්වාස කරන දනන් ව පිළිකුල් කිරීම වැනි සිතෙහි ඇති වන රෝගවලින් පවිත්‍ර වීමයි.
“අල්ලාහ්ට ආදේශ කරන්නෝ අපවිත්‍ර ය”
(සූරා අත්තව්බා 28)



වුළූ යනුවෙන් අර්ථවත් වන්නේ නිශ්චිත ශරීරාංග කිහිපයක් ජලයෙන් සෝදා හැරීම වේ.

භෞතික පවිත්‍රතාවය වුළූ හෝ ස්නානය මගින් සිදුකර ගත හැක.



ස්නානය යනුවෙන් අදහස් කෙරෙන්නේ සම්පූර්ණ ශරීරය ම ජලයෙන් සෝදා හැරීම වේ.



මුහුදු ජලය, ගංගා ජලය, ළිං ජලය හෝ අපිරිසිදුකම සමග මිශ්‍ර නොවූ වෙනත් ජලය වැනි පිරිසිදු ජලයෙන් පිරිසිදු කිරීම සිදු කළ යුතුය.

### පවිත්‍රතාවය හා බැඳි මගපෙන්වීම් කිහිපයක්

- සාමාන්‍යයෙන් ඉස්ලාමය අපිරිසිදුකාරකයක් ලෙස පැනවූ දෑ හැර අන් සියලු ම දෑ පිරිසිදු ය.
- ශරීරයේ හෝ වස්ත්‍රයෙහි අපිරිසිදුකාරකයක් තැවරුණේ නම් එය ජලයෙන් හෝ ඕනෑ ම පිරිසිදුකාරකයක් යොදා ගනිමින් පිරිසිදු කිරීම ප්‍රමාණවත් වේ.
- යමෙකු මලමුත්‍රා පහ කළේ නම් අදාළ ශරීර අවයව ජලයෙන් පිරිසිදු කිරීම වඩාත් යෝග්‍ය වන අතර අදාළ ශරීරාංග කඩදාසි පිස්නයකින් (ටිශූ) හෝ එවැනි, අපිරිසිදුකාරක පිරිසිදු කළහැකි දෙයක් භාවිතා කළ හැකි ය.

## සාකච්ඡා කරන්න

ඉස්ලාමය මුස්ලිම්වරයෙකුගේ පවිත්‍රතාවය හා පුද්ගලික ස්වස්ථතාවයෙහි වැදගත්කම පිළිබඳ අවධාරණය කිරීම මගින් ගම්‍යමාන වන්නේ කුමක් ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**නිවැරදි පිළිතුර තෝරන්න**

**1** පවිත්‍රතාවය යනු

- අ. කිල්ලෙන් තොරවීම
- ආ. අපිරිසිදුකාරක ඉවත් කිරීම
- ඇ. ඉහත සියල්ල ම

**2** සම්පූර්ණ ශරීරය ම ජලයෙන් සේදීම හඳුන්වන පදය

- අ. වුළු කිරීම
- ආ. ස්නානය
- ඇ. තයම්මුම්

**3** සාමාන්‍යයෙන් පවිත්‍රතාව දෙවර්ගයකි

- අ. භෞතික පවිත්‍රතාවය හා අභෞතික පවිත්‍රතාවය
- ආ. වුළු හා තයම්මුම්
- ඇ. වුළු හා ස්නානය



# තෙවන පාඩම

# වුළූ දෝවනය කිරීම

## පූර්විකාව

ඉස්ලාමීය නැමඳුම් අතුරින් වැදගත් ම නැමඳුම ලෙස සැලකෙන සලාතය සමග වුළූ දෝවනය ඍජු ව ම බැඳෙන බැවින් ඉස්ලාමයෙහි වුළූ දෝවනයට ඉහළ ස්ථානයක් හිමි වේ. එබැවින් එය නිවැරදි ව ඉටුකරන අයුරු හැදෑරීමට මුස්ලිම්වරයෙක් විශාල රුචිකත්වයක් දක්වයි. මෙම පාඩම හරහා වුළූ යන්නෙහි අර්ථය, එය අනිවාර්ය වන අවස්ථා, වුළූ කඩවන අවස්ථා හා වුළූ කරන නිවැරදි ක්‍රමවේදය යනාදිය හදාරමු.

## වුළූ යන්නෙහි අර්ථය:-

මුහුණ දෑත් හා දෙපා යම් නිශ්චිත ක්‍රමවේදයකට අනුව සේදිම වේ.

## වුළූ අනිවාර්ය වන අවස්ථා

යම් කරුණක් ඉටු කිරීමට වුළූ කිරීම කොන්දේසියක් ලෙස සැලකෙන සියලු අවස්ථා හා යම් කටයුත්තක් කිරීමට වුළූ කිරීම අනිවාර්ය කොට ඇති සියලු අවස්ථා. එමෙන් ම යමෙක් කිල්ලට පාත්‍ර වූයේ නම් ඔහුට පහත කරුණු තහනම් වේ.

හදස් (කිල්ල): මෙය අපගේ පිරිසිදුබවේ බිඳී යාමේ තත්වය වන අතර එමගින් අපව පිරිසිදු කිරීමට පෙර සලාතය ඉටු කිරීමෙන් වළක්වයි. එය වර්ග දෙකකින් යුක්ත වේ: එකක් එය ඉවත් කිරීම සඳහා අප විසින් වුළූ පමණක් සිදු කිරීමට අවශ්‍ය වන අතර, අනෙක අප විසින් සම්පූර්ණ පිරිසිදු කිරීම් (ස්නානය) සිදු කිරීමට අවශ්‍ය වේ.



1 සලාතය ඉටුකිරීම



2 කඃබාව පැදකුණු කිරීම



3 අල්කුර්ආනය ස්පර්ශ කිරීම

## වුළූ ඉටු කරන ආකාරය

මුස්ලිම්වරයෙකුට වුළූ කිරීමට අවශ්‍ය නම්, ඔහු පහත සඳහන් දෑ කළ යුතුය.

**1**

ඔහු තම සිතින් වුළූ ඉටු කිරීමට අදිටන් කරන අතර, බිස්මිල්ලාහ් (අල්ලාහ්ගේ නාමයෙන්) යැයි පවසයි.



**2**



ඔහු ජලයෙන් මැණික් කටුව දක්වා දෑත් සෝදා ගනී.

**3**



ඔහු ජලය මඟින් කට කලත්වා තම මුඛය හොඳින් සෝදා හරියි. මෙම ක්‍රියාවලිය අරාබි භාෂාවෙන් "මළ්මළා" ලෙස හැඳින්වේ.

**4**



ඔහු තම නාසය පිරිසිදු කිරීමට නාස්පුඩු තුළට ජලය ආඝ්‍රාණය කර නාසය පිඹීමෙන් එය පිටකරයි.

**5**



ඔහු නළල මුදුනේ ඇති කෙස් කළඹේ සිට නිකට පහළ දක්වාත්, රැවුල වවා ඇත්නම් රැවුලත් සමඟ ද, එක් කනක සිට අනෙක් කන දක්වා හොඳින් මුහුණ සෝදා ගනී.

**6**



ඔහු තම දකුණු අතෙන් පටන් ගෙන ඇඟිලි තුඩුවල සිට වැලමිට දක්වා දෑත් සෝදා ගනී.

**7**



ඔහු තෙත් දෑතින් හිසකෙස් රේඛාව අසල හිස මුදුනේ ඔහුගේ දෑත් තබා, ඔහු එය බෙල්ලේ පිටුපසට සහ නැවත ඉදිරිපසට පිස දමයි.

**8**



ඔහු ඔහුගේ තෙත් දබර ඇඟිලිවලින් කන්වල අභ්‍යන්තර පැති සහ මාපටැඟිලිවලින් පිට පැත්ත ද පිස දමයි.

**9**



ඔහු තම දකුණු පාදයෙන් පටන් ගෙන පාදම කකුලට සම්බන්ධ කරන සන්ධියේ කැපී පෙනෙන අස්ථි දෙක වන වළලුකර දක්වා ඔහුගේ පාද සෝදා ගනී.

## වුළූ කිරීමේදී සෝදා හරින සිරුරේ කොටස් අප කීවතාවක් සේදිය යුතු ද?

සුන්නාහ්ව අනුව, හිස සහ කන් එක් වරක් පමණක් පිස දමනු ලබන අතර ශරීරයේ සෙසු සෑම කොටසක්ම තුන් වරක් සෝදා හරිනු ලැබේ. කෙසේ වෙතත්, මෙම ශරීර කොටස් හොඳින් සෝදා ඇත්නම් ඒවා වරක් සේදීම ප්‍රමාණවත් වේ.

## වුළූ අවලංගු කරන දෑ

කරුණු හතරක ප්‍රතිඵලයක් ලෙස වුළූ අවලංගු වේ:

- ඉදිරිපස හා පසුපස පෞද්ගලික කොටස්වලින් මූත්‍රා, අසූචි, වාතය, ශුක්‍ර තරලය සහ පැහැදිලි, අවර්ණ, ලිංගික උද්දීපනය තුළ ශ්‍රාවය වන තරල පිටවීම.
- නින්ද හෝ මත්වීම නිසා සිහිය නැතිවීම
- රාගයෙන්, දැතින් ආවරණයකින් තොරව රහස්‍ය කොටස් ස්පර්ශ කිරීම
- ඔටුවන්ගේ මස් අනුභව කිරීම

අමතර කියවීම

කෙනෙකුගේ පිරිසිදු කිරීම සිදු කරන ආකාරය ගැන. උසූල් මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කරන ලද මෙම වීඩියෝ ආධාරකය නරඹන්න,

වීඩියෝ පටය නැරඹීමට තිරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## සාකච්ඡා කරන්න

අපට වුළූ ගැන අධ්‍යනය කිරීමට සහ එය නිවැරදිව ඉටු කිරීමට උපකාර වන මාධ්‍යයන් කිහිපයක් ලැයිස්තුගත කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

## මම නැවත වුළූ ඉටු කළ යුත්තේ කවදා ද?

මුස්ලිම්වරයෙකු වුළූ ඉටු කරන්නේ නම්, සාමාන්‍ය රීතිය නම්, කලින් සඳහන් කළ වුළූව බිඳ දමන එක් දෙයක් සිදු නොවුනේ නම්, ඔහුගේ වුළූව තවමත් වලංගු වන අතර, එසේ වුනේ නම් ඔහු නැවත වුළූ කළ යුතුය.

### අභ්‍යාස

**පහත සඳහන් එක් එක් වචන හෝ වාක්‍ය ඛණ්ඩ අදාළ මාතෘකාව යටතේ සඳහන් කරන්න.**

- අල් කුර්ආනය ස්පර්ශ කිරීම
- මුත්‍ර කිරීම
- සලාතය
- නින්ද යෑම
- රාගයෙන් රහස්‍ය කොටස් ස්පර්ශ කිරීම.
- කඃබාව පැදකුණු කිරීම (තවාෆ්)
- ඔටු මස් අනුභව කිරීම

**මෙය කිරීමට පෙර යමෙකු වුළූ කළ යුතුය:**

**වුළූ අවලංගු කරන දෑ**

## මේස් මත පිස දැමීම

යමෙකුට තම මේස් පැළඳ සිටින විට වුළු කිරීමට අවශ්‍ය නම්, තෙත් දැතින් ඒවා උඩින් පිස දැමීමට ඔහුට අවසර දී ඇති අතර, ඒවා ගලවා පාද සේදීමට අවශ්‍ය නොවේ. මේ සඳහා කොන්දේසි තුනක් ඇත.

**එක**

ඒවා පැළඳීමට පෙර ඔහු පිරිසිදු තත්වයක සිටිය යුතුය.

**දෙක**

මේස් වළලුකර සමඟ පාද ආවරණය කළ යුතුය.

**තුන**

ඒවා මත පිස දැමීමේ කාලය පදිංචිකරුවෙකු සඳහා පැය 24 ක් සහ සංචාරකයෙකු සඳහා පැය 72 නොඉක්මවිය යුතුය.



මේස් මත පිස දැමීමේ කාලය ආරම්භ වන්නේ යමෙකු ඒවා පිස දැමූ පළමු අවස්ථාවේ සිට ය.

## නිවැරදි පිළිතුර තෝරන්න

**1** වුළු ඉටු කිරීමේ ක්‍රමය සඳහන් පහත සඳහන් වාක්‍ය ඛණ්ඩය නිසි අනුපිළිවෙලට නැවත සකස් කරන්න:

අ) හිස මත පිස දැමීම ◯ ..........

ආ) මුඛය සේදීම ◯ ..........

ඇ) මුහුණ සේදීම ◯ ..........

ඈ) කන් පිස දැමීම ◯ ..........

ඉ) පාද සේදීම ◯ ..........

ඊ) අත් සේදීම ◯ ..........

**2** වුළු අවශ්‍ය කරන නමස්කාර ක්‍රියාවන් හඳුනා ගන්න:

◯ අ) සලාතය

◯ ආ) උපවාසය

◯ ඇ) අල් කුර්ආනය ස්පර්ශ කිරීම

◯ ඈ) සලාතය සඳහා කැඳවීම

◯ ඉ) කබාව වටා වට වන්දනා කිරීම (තවාෆ්)

**3** නිවැරදි පිළිතුර තෝරන්න.

වුළු අවලංගු කරන දේවල්වල මුළු ගණන:

◯ 2

◯ 3

◯ 4



# සිව්වන පාඩම

# ගුස්ල් හෙවත් ස්නානය

## හැඳින්වීම

මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ පිරිසිදුකමෙහි වැදගත්කම සම්බන්ධයෙන් දෙවන පාඩමේ තෙවන ඒකකයේ සඳහන් වුණි. පිරිසිදු කිරීම්වලින් මුස්ලිම්වරයෙකුට විශේෂිත අවස්ථාවන්වල අනිවාර්යයෙන්ම කළ යුතු පිරිසිදුකම සම්බන්ධයෙන් මෙම පාඩමේදී ඉගෙන ගනිමු.

## ගුස්ල් හෙවත් ස්නානය යන්නෙහි තේරුම

ස්නානය යනු, 'හදස්' හෙවත් මහ කිල්ල ඉවත් කරගන්නා චේතනාව ඇතිව මුලු සිරුරම ජලයෙන් සේදීම වේ.

## අපි ස්නානය කළ යුත්තේ කෙසේද?

ස්නානයේදී ජලයෙන් මුලු සිරුරෙහිම ජලය සංසරණය කරවීම අවශ්‍ය ය. මුස්ලිම්වරයා එසේ කිරීමෙන් 'ජනාබත්'යෙන් පිරිසිදු වන්නේය.

මහ කිල්ල: ස්නානය මඟින් පිරිසිදු විය යුතු අවස්ථා.

1- ජනාබත්: සංසර්ගය මඟින් හෝ සංසර්ගයකින් තොරව ශුක්‍ර මෝචනය වීම.

2- 2- ඔසප් වීම: කාන්තාවකගේ මාසික චක්‍රයේ කොටසක් ලෙස සිදුවන සාමාන්‍ය යෝනි මාර්ගයෙන් ලේ ගැලීම.

3- පශ්චාත් ප්‍රසව රුධිර වහනය: දරු ප්‍රසූතියෙන් පසු සිදුවන යෝනි මාර්ගයෙන් ලේ ගැලීම.

## පූර්ණ ස්නානය කරන ආකාරය

මුස්ලිම්වරයා පූර්ණ ස්නානය කිරීමට අපේක්ෂා කරන්නේ නම්, පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

1. තම ලිංගේන්ද්‍රයට ජලය ඉස පිරිසිදු කළ යුතු ය.
2. සලාතයට කරන වුළූඃ මෙන් වුළූඃ කර ගත යුතු ය.
3. මුලු සිරුරම ජලයෙන් සෝදා ගත යුතු ය.

## ස්නානය අනිවාර්ය වන්නේ කුමන අවස්ථාවේ ද?

මුස්ලිම්වරයාට අවස්ථා තුනක ස්නානය අනිවාර්ය වන්නේය.

**පළමු අවස්ථාව**
අවදියෙන් සිටියදී හෝ නින්දේදී ශුක්‍රාණු පිටවීම.

**දෙවන අවස්ථාව**
ශුක්‍රාණු පිටවුව ද නොවුව ද සංසර්ගයේ නියැළීම.

**තෙවන අවස්ථාව**
කාන්තාවකගේ ඔසප්වීම හෝ දරු ප්‍රසූතියෙන් පසු රුධිර පිටවීම නැවතීමෙන් පසු.

### සාකච්ඡා කරන්න

'හදස්' හෙවත් කිල්ල ඉවත් කිරීමට ස්නානය අනිවාර්ය වේ. ඒ මක් නිසා ද?

........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

## ‘ජුනුබ්’ හෙවත් ස්නානය අනිවාර්ය වූ පුද්ගලයාට හරාම් වූ ක්‍රියාවන් මොනවා ද?

සංසර්ගයෙන් හෝ ශුක්‍රාණු පිටවීමෙන් පුද්ගලයෙකුට ස්නානය අනිවාර්ය තත්ත්වය ‘ජනාබා’ ලෙස හැඳින්වේ. එසේ ස්නානය අනිවාර්ය වූ පුදගලයා ‘ජුනුබ්’ ලෙස හැඳින්වේ. මේ තත්ත්වයේ සිටියදී ඔහුට සමහර දේවල් තහනම් වන්නේය.



1 සලාතය ඉටු කිරීම.



2 කඃබාව’ තවාෆ් කිරීම.



3 කුර්ආනය ඇල්ලීම හා ඉසිලීම.



4 ‘මස්ජිදයේ’ රැඳී සිටීම.



5 කුර්ආන් පාරායනය.

## ‘තයම්මුම්’

‘වුළූඃ’ කිරීම හෝ ස්නානය කිරීම අපේක්ෂා කරන්නෙකුට, ජලය නොමැති වීම හෝ අසනීප වැනි හේතු නිසා ජලය භාවිත කිරීමට නොහැකි අවස්ථාවන්වල ඒ දෙක වෙනුවට ‘තයම්මුම්’ කිරීමට නියම කර ඇත.

‘තයම්මුම්’ කරන ආකාරය : තම දැත් එක් වරක් පස් මත ගැසීමෙන් පසු එහි ඇලී ඇති පස් අංශුවලින් තම මුහුණ පිරිමැද අනතුරුව තම දැත් පිරිමැදීම.



## මම ‘වුළූඃ’ කළ පසු ජලය ලැබුණහොත් කුමක් කළ යුතු ද?

‘තයම්මුම්’ කළ මුස්ලිම්වරයෙකුට ජලය ලැබුණහොත් හෝ ජලය භාවිතා කිරීමට හැකිවුවහොත් ‘තයම්මුම්’ මගින් කරගත් එම පිරිසිදුකම අවලංගු වන අතර ඔහු ‘වුළූඃ’ කිරීම හෝ ස්නානය කිරීම අනිවාර්ය වන්නේය.

# ඇගයුම් ප්‍රශ්න

**1**

කෙනෙකුගේ 'ජනාබත'ය ඉවත් වීමට නිවැරදි ස්නානයක් වන තෙක් මුලු සිරුරෙහිම ජලය සංසරණය කරවීම අනිවාර්ය වන්නේය.

○ නිවැරදි ○ වැරදි

නින්දේදී ශුක්‍රාණු පිටවීම සිදුවුවහොත් ස්නානය අනිවාර්ය නොවන අතර අවදියෙන් සිටියදී ශුක්‍රාණු පිටවීම සිදුවුවහොත් අනිවාර්ය වන්නේය.

○ නිවැරදි ○ වැරදි

'ජුනුබ්' හෙවත් ස්නානය අනිවාර්ය වූ පුද්ගලයාට මස්ජිදයේ වාඩිවීම නුසුදුසු ය.

○ නිවැරදි ○ වැරදි

**2**

මුස්ලිම්වරයෙකුට 'තයම්මුමය' නියම කර ඇත්තේ

○ අ- ජලය භාවිත කිරීමට නොහැකි අවස්ථාවල

○ ආ- ජලය නොමැති අවවස්ථාවල

○ ඇ- ඉහත සියලුම අවස්ථාවල



# පස්වන පාඩම

## මුස්ලිම් කාන්තාවට අදාළ නීති

### හැඳින්වීම

සමහර නැමදුම් කටයුතු පිරිමින්ට අනිවාර්ය නොකර කාන්තාවට පමණක් අනිවාර්ය කළාක් මෙන් සර්වබලධාරී අල්ලාහ් කාන්තාවන් පිරිමින්ගෙන් වෙන් කොට හඳුනා ගත හැකි ගුණාංග හා ලක්ෂණයන්ගෙන් කාන්තාව සුවිශේෂී කර ඇත. අපි මෙම පාඩමේදී මුස්ලිම් කාන්තාවට විශේෂිත වූ නීතිරීති ගැන ඉගෙන ගනිමු.

### කාන්තාවට ඉස්ලාමය ලබා දී ඇති ස්ථානය

ඉස්ලාමයේ කාන්තාවන්ට ලබා දී ඇති ගෞරවය සම්බන්ධ නිදසුන් කිහිපයක්.

- ඉස්ලාමය කාන්තාවට ගෞරවයෙන් හා සාධාරණ ලෙස දේපළ පසු උරුම අයිතිය ලබා දී ඇත. ඇගේ කොටස සමහර අවස්ථාවල පිරිමියාට සමාන වන අතර තවත් සමහර අවස්ථාවල ඇගේ ඥාතීත්වය නිසා සහ ඇයට පැවරී ඇති වියදම් නිසා ඇගේ කොටස පිරිමියාට වඩා වෙනස් වේ.
- විවිධ කාරණාවලදී පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතා පවතී. සියලුම මූල්‍ය ගනුදෙනු ඉන් එකකි.
- කාන්තාවට තම සැමියා තෝරාගැනීමේ නිදහස ලබා දී තිබීම.
- ඇගේ නම සහ ඇගේ පියා සමග ඇති සබඳතාවය පවත්වාගෙන යාම. එබැවින් විවාහයෙන් පසු ඇගේ පෙළපත වෙනස් නොවන අතර ඇගේ නම ඇගේ පියා සමඟ සහ ඇගේ පවුල සමඟ සම්බන්ධ ව ම තිබේ.
- පිරිමියාට තම බිරිඳ, මව හා සහෝදරිය වැනි තමා වියදම් කිරීමට බැඳී සිටින අයගෙන් කෙනෙකු වන ඇයව රැක බලා ගැනීම හා කිසිදු අපේක්ෂාවකින් තොරව ඇය වෙනුවෙන් වියදම් කිරීමට අනිවාර්ය කර තිබීම.
- කිසිවකු නොමැති දුර්වල කාන්තාවකට තමා, ඇගේ ඥාතියෙකු නොවුවත් ඇප උපස්ථාන කිරීමේ මහිමය හා ගෞරවය තහවුරු කර තිබීම හා ඇයට සේවය කිරීමට උත්සහ කිරීම දිරිගැන්වීම වෙනුවෙන් අල්ලාහ් අබියස එය උතුම් ක්‍රියාවක් බවට පත් කර තිබීම.

**අමතර කියවීම**

ඉස්ලාමයේ සහ වෙනත් සමහර ආගම්වල කාන්තාවන්ගේ තත්ත්වය සංසන්දනය කරන මෙම වීඩියෝව නරඹන්න.

වීඩියෝ පටය නැරඹීමට තිරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## පිරිමියෙකු සමඟ කාන්තාවකගේ සබඳතා

**පිරිමියකු සහ කාන්තාවක් අතර ඇති සම්බන්ධය කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.**

| කාන්තාව ඔහුගේ බිරිඳ වීම | ඔහුට 'මහ්රම්' කාන්තාවක් වීම | ඔහුට 'අජ්නබී' කාන්තාවක් වීම |
|---|---|---|
| අඹු සැමියන් නොවන අයට කළ නො හැකි, බැලීම හා සවන්දීම වැනි දෑ අඹු සැමියන් වන ඔවුන් දෙදෙනාට කළ හැකිය. සැමියා බිරිඳට වස්ත්‍රයක් ලෙසත් බිරිඳ සැමියාට වස්ත්‍රයක් ලෙසත් අල්ලාහ් හඳුන්වා දී ඇත්තේ ඔවුන් දෙදෙනා අතර ඇති සබඳතාවය කායිකව හා මානසිකව එකිනෙක බැඳුණු අපූරු චිත්‍රයක් ලෙස ය. | 'මහ්රම්' යන්නෙන් අපේක්ෂා කරනු ලබන්නේ, පිරිමියාට තම මව, සහෝදරිය, දියණිය, සහෝදරියගේ දියණිය, පියාගේ සහෝදරිය, මවගේ සහෝදරිය හා බිරිඳගේ මව වැනි කිසිදා විවාහ කර ගැනීමට නුසුදුසු කාන්තාවන්ය. මෙම කාන්තාවන්ට තම දෑත්, ගෙල සහ හිසකෙස් වැනි දෑහි සීමාව නො ඉක්මවා අලංකාරය එළිදක්වමින් 'මහ්රම්' පිරිමින් ඉදිරියට පිවිසීමට අවසරය ඇත. | 'අජ්නබී' කාන්තාව යනු, පියාගේ සහෝදරියගේ (නැන්දාගේ) දියණිය හා පියාගේ සහෝදරයාගේ (බාප්පා හෝ ලොකු තාත්තාගේ) දියණිය වැනි ඥාති වුව ද, තම සහෝදරයාගේ බිරිඳ හා පවුලේ සෙසු ඥාතීන් වැනි සමීපතයින් වුව ද, ඥාති හෝ පවුල් බැඳීමකින් තොර වුව ද 'මහ්රම්' නොවන කාන්තාවන්ය. ඉස්ලාමය, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර කටයුතුවලදී හිජාබය අනිවාර්ය කර තිබීම හා ඔවුන් සමඟ තනිව හුදකලා නොවී සිටීම වැනි නීතිරීති ස්ථාපනය කර ඇත. |

## මුස්ලිම් කාන්තාවකගේ හිජාබය

අල්ලාහ්, හිජාබය පිරිමියාට අනිවාර්ය නොකර, කාන්තාවට පමණක් අනිවාර්ය කර ඇත්තේ, සුන්දරත්වය හා ආකර්ෂනය ඇය තුළ ඇති නිසාය. පිරිමියාට ඇය පරීක්ෂාවක් වීමට වඩා ඇය පිරිමියාට පරීක්ෂාවක් වන බැවිනි. මෙම හිජාබයෙහි සීමාව වනුයේ, 'මහ්රම්' නොවන පිරිමින් ඉදිරියේ ඇගේ මුළු සිරුර ම ආවරණය කළ යුතු ය. පහත සඳහන් කොන්දේසි තුනට අනුව ඇයට අවශ්‍ය ඕනෑම හැඩයකින් හා ඕනෑම වර්ණයකින් එය පැළඳිය හැකිය.

| පළමු කොන්දේසිය | දෙවන කොන්දේසිය | තුන්වන කොන්දේසිය | හතරවන කොන්දේසිය |
|---|---|---|---|
| **හිජාබය, ආවරණය කළ යුතු සියල්ල ආවරණය කරන එකක් වීම.** | **සිරුරේ අවයව තද වන ආකාරයේ හිර නොවන, ලිහිල් හා පහසු එකක් වීම.** | **එය ඇතුළතින් ඇති සිරුරේ කොටස් විනිවිද පෙනෙන ආකාරයේ සිනිඳු එකක් නොවීම.** | **එය සාමාන්‍යයෙන් ආකර්ශනීය යැයි සැලකෙන ඇඳුම් වර්ගයක් නොවිය යුතුය.** |

## කාන්තාවගෙන් පිටවන රුධිර වර්ග

කාන්තාවගෙන් පිටවන රුධිරය වර්ග දෙකකි.

| ඔසප් වීම | දරු ප්‍රසූතියෙන් පසු පිටවන රුධිරය |
|---|---|
| කාන්තාවගේ ගර්භාෂයෙන් සෑම මාසකම පාහේ පිටවන ස්වභාවික රුධිරය ඔසප් වීම ලෙස හැඳින්වේ. එය දින කිහිපයක් පවතී. එයට මාසික ඍතු වීම යැයි ද කියනු ලැබේ. | දරු ප්‍රසූතියකින් පසු කාන්තාවකගේ ගර්භාෂයෙන් පිටවන ස්වභාවික රුධිරය වේ. මෙය දින 40ක් දක්වා දින කිහිපයක් පවතී. |

## ඔසප් වීමේ සහ දරු ප්‍රසූතියෙන් පසු පිටවන රුධිරය සම්බන්ධ නීතිරීති

ඔසප් වූ කාන්තාවට සහ දරු ප්‍රසූතියෙන් පසු රුධිරය පිටවන කාන්තාවට අල්ලාහ්, පහත සඳහන් නීතිරීති පනවා ඇත.

- ඒ දෙදෙනාගෙන් සලාතය හැලීම : ඒ දෙදෙනා එම සමයේ සලාතය ඉටු කිරීම අනිවාර්ය නොවේ. එවගේම රුධිරය නැවතීමෙන් පසු ද සලාතය නැවත ඉටු කළ යුතු නැත.
- උපවාසය අතහැරීම : ඒ දෙදෙනාට එම සමයේ උපවාසයේ නියැළීම අනිවාර්ය නොවන අතර රමළාන් මාසයේ අතපසු වූ උපවාස දින ගණන නැවත ඉටු කළ යුතු ය.
- සංසර්ගයේ නියැළීම තහනම් ය. ඔසප් සමයේ හෝ දරු ප්‍රසූතියකින් පසු රුධිරය පිටවන සමයක තම බිරිඳ පසුවන්නේ නම්, එය නැවතීමෙන් පසු ස්නානය කරන තෙක් සංසර්ගයේ නියැළීම සැමියාට නුසුදුසු ය. ලිංගික සංසර්ගයේ නියැළීමකින් තොරව ඇය සමඟ රති කෙළියේ නියැළීම කළ හැකිය.
- රුධිරය නැවතීමෙන් පසු ස්නානය කර ගැනීම. ඔසප් සමයේ හෝ දරු ප්‍රසූතියකින් පසු රුධිරය පිටවී, නැවතුණහොත් ස්නානය කළ යුතු ය. මුළු සිරුරම ජලයෙන් සෝදා ගත යුතු ය.

**අමතර කියවීම**

**කාන්තාවන්ට ඉස්ලාමය ගෞරව කිරීම ගැන විස්තර දැනගැනීම සඳහා ජාත්‍යන්තර භාෂා කිහිපයකින් ලබා ගත හැකි 'ඉස්ලාම් සෙවණේ කාන්තාව' යන පොත කියවන්න.**

පොත භාගත (Download) කිරීමට තිරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## සාකච්ඡා කරන්න

සමහර අනිවාර්ය වගකීම් කාන්තාවගෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කරන්න.

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

## ඇගයුම් ප්‍රශ්න

**1**

කාන්තාවට රැකවරණය ලබාදීම හා අපේක්ෂාවකින් තොරව ඇය වෙනුවෙන් වියදම් කිරීම ඉස්ලාමය පුරුෂයාට අනිවාර්ය කර ඇත.

- ◯ නිවැරදි ◯ වැරදි

හිජාබය, පුළුල් හා ලිහිල් විය යුතු යැයි කොන්දේසියක් නොවන්නේය.

- ◯ නිවැරදි ◯ වැරදි

ඔසප් වූ කාන්තාව රුධිරය නැවතීමෙන් පසු සලාතය ඉටුකිරීමට පෙර ස්නානය කරගත යුතු ය.

- ◯ නිවැරදි ◯ වැරදි

ඔසප් වීම යනු, දරු ප්‍රසූතියකින් පසු සිදුවන රුධිර පිටවීමකි.

- ◯ නිවැරදි ◯ වැරදි

**2**

මුස්ලිම් කාන්තාවට තම සිරුර පහත සඳහන් කවර පාර්ශවය ඉදිරියේ ආවරණය කර ගැනීම අනිවාර්ය වන්නේ ද?

- ◯ අ- සෙසු කාන්තාවන් ඉදිරියේ.
- ◯ ආ- 'අජ්නබි' පිරිමින් ඉදිරියේ.
- ◯ ඇ- සැමියාගේ පියා ඉදිරියේ.

ඔසප් වූ කාන්තාවට සහ දරු ප්‍රසූතියකින් පසු රුධිරය පිටවන කාන්තාවට ඒවා නැවතීමෙන් පසු නැවත ඉටු කිරීම අනිවාර්ය වන්නේ

- ◯ අ- සලාතය ඉටු කිරීම
- ◯ ආ- උපවාසයේ නියැළීම
- ◯ ඇ- ඉහත සියල්ල



# හයවන පාඩම

# සලාතය

## හැඳින්වීම

'සලාතය' යනු, මුස්ලිම්වරයෙකු අනිවාර්යයෙන්ම ඉගෙන ගෙන, ඉටුකළ යුතු උතුම්ම ආගමික වතාවක් ලෙස සැලකේ. සර්වබලධාරී අල්ලාහ්, අප කෙරෙහි තෘප්තිමත් වන අයුරින් මෙම සලාතය ඉටු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අපට උගන්වා ඇත. මෙම පාඩමෙන් අනිවාර්ය සලාතයන්, ඒවායේ තත්ත්වය, කොන්දේසි සහ ඒවා නිවැරදිව ඉටු කරන්නේ කෙසේද යන්න පිළිබඳව අපි ඉගෙන ගනිමු.

## සලාතය යනු කුමක්ද?

සලාතය යනු, ගැත්තා තම පරමාධි වෙත සමීප වන කියමන් සහ ක්‍රියා මාලාවක් ඇතුළත් දෛනික නැමදුමක් වන අතර එය දිනකට පස් වතාවක් ඉටු කරනු ලැබේ.

සලාතය ඉස්ලාමයේ දෙවන කුළුණයි.

## සලාතයේ තත්ත්වය

සලාතය සුවිශේෂී කාරණා සමූහයකින් සංෂිප්ත වේ. ඒවා අතර,

- 'ෂහාදා' හෙවත් සාක්ෂි දැරීමෙන් පසු ඉස්ලාමයේ ඊළඟ කුළුණ ලෙස සැලකේ.
- නිරෝගිව සිටියදී මෙන්ම රෝගීව සිටියදී ද සහ ආරක්ෂිතව සිටියදී මෙන්ම බියව සිටියදී වැනි සෑම අවස්ථාවකම ඉටු කළ යුතු නැමදුමකි.
- මුස්ලිම්වරයෙකු ප්‍රතික්ෂේප කරන්නෙකුගෙන් වෙන්කර හඳුනා ගන්නා නැමදුමකි.

## අපි සලාතය ඉටු කරන්නේ ඇයි?

අපි සලාතය ඉටු කරන්නේ පහත සඳහන් කාරණා නිසා ය.



## සලාතයේ මුඛ්‍ය අරමුණු සහ ප්‍රතිලාභ කිහිපයක්:

- ‘සලාතය’ ගැත්තා සහ ඔහුගේ පරමාධිපති අතර සම්බන්ධය ඇති කරයි.
- ‘සලාතය’ මෙලොව දුක් කරදරවලින් මුදවයි.
- ‘සලාතය’ ගැත්තාගේ අපේක්ෂාව සහ අධිෂ්ඨානය ශක්තිමක් කරයි.
- එය ඉටු කරන්නාගේ සාරධර්ම වඩවන අතර ඔහුව නපුරෙන් ඈත් කරයි.

## සලාතයේ කොන්දේසි

සලාතය ඉටු කිරීම සඳහා සමහර කොන්දේසි සපුරා තිබිය යුතු ය. ඒවානම්,

- **පිරිසිදුකම:** සිරුර සහ ස්ථානය නජීස් හෙවත් අපිරිසිදුකමෙන් ද වුළූඃ හෝ ස්නානය මගින් ‘හදස්’ හෙවත් කිල්ලෙන් ද පිරිසිදුව තිබීම අන්තර්ගත වේ.
- **නිරුවත ආවරණය කිරීම:** නිරුවත යනු මිනිසුන් ඉදිරියේ ශරීරයෙන් ආවරණය කළ යුතු පෙදෙස යි. පිරිමියෙකු සලාතය ඉටු කරන විට, ආවරණය කළ යුතු වන්නේ පෙකණියේ සිට දණහිස දක්වාය. කාන්තාවක් සලාතය ඉටු කරන විට, මුහුණ සහ මැණික් කටුවෙන් පහළ දෑත් හැරෙන්නට මුළු සිරුර ම ආවරණය කළ යුතු ය.
- **කිබ්ලාවට මුහුණලා සිටීම:** එය ගෞරවණීය මක්කා නගරයේ පිහිටි කඃබාවෙහි දිශාවය. සලාතය ඉටුකරන්නා සලාතය පුරාවට ම එම දිශාවට මුහුණලා සිටීම අනිවාර්ය  වන්නේය.
- **සලාතය ඉටු කළ යුතු වේලාව එළඹ තිබීම:** සලාතයේ වේලාව එළඹීමට පෙර සලාතය ඉටු කිරීම වලංගු නොවන අතර එම වේලාව ඉක්මවන තෙක් ප්‍රමාද කිරීම ද නුසුදු ය. අදාළ වේලාවෙහි ආරම්භයේම ඉටු කිරීම වඩා හොඳ ය.

**අමතර කියවීම**

**සලාතය ඉටු කරන ආකාරය පැහැදිලි කරන මෙම වීඩියෝ පටය නරඹන්න.**

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## පස්වේල් සලාතය

අල්ලාහ්, තම ගැත්තන්ට දෛනිකව පස්වේල් සලාතය ඉටු කිරීම අනිවාර්ය කර ඇත. ඒවා

| සලාතය | ආරම්භ වේලාව | අවසන් වේලාව | රකඅත් ගණන |
|---|---|---|---|
| ෆජ්ර් සලාතය | අළුයම උදාව | හිරු උදාව | 2 |
| ලුහ්ර් සලාතය | හිරු අවරට යාමට පටන් ගැනීම (මධ්‍යහනේ හිරු මුදුන් අහෙසින් බටහිර දෙසට ඉවත් වීම) | යම් වස්තුවක සෙවණැල්ල එම වස්තුවේ උසට සමාන වීම | 4 |
| අස්ර් සලාතය | යම් වස්තුවක සෙවණැල්ල එම වස්තුවේ උසට සමාන වීම | හිරු බැසීම | 4 |
| මග්රිබ් සලාතය | හිරු බැසීම | රක්ත මේඝය ඉවත් වීම | 3 |
| ඉෂා සලාතය | රක්ත මේඝය ඉවත් වීම | රාත්‍රියේ අඩක් ගතවීම | 4 |

## අප සලාතය ඉටු කළ යුත්තේ කෙසේ ද?

මුස්ලිම්වරයෙකු සලාතය ඉටු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ඔහු පහත පියවර අනුගමනය කළ යුතු ය.



1. සලාතය ඉටු කරනවා යන චේතනාව සිතෙහි ඇති කර ගැනීම.

2. ‘කිබ්ලාව’ මුහුණලා සිටගෙන තම දෑත් උරහිස දක්වා උසවා ‘අල්ලාහු අක්බර්’ යැයි පැවසීම.

3. තම වම් අත මත දකුණු අත තැබීම. පසුව, ‘සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික වතබාරකස්මුක වතආලා ජද්දුක වලා ඉලාහ ගයිරුක’ වැනි ‘දුආඋල් ඉස්තිෆ්තාහ්’ වලින් යමක් කියවීම. අනතුරුව ‘අඌදු බිල්ලාහිමිනෂ් ෂයිතානිර් රජීම්’ සහ ‘බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්’ යැයි පවසා සූරා ‘ෆාතිහා’ පාරායනා කර, අවසානයේ ‘ආමීන්’ යැයි පැවසීම. එහි තේරුම වනුයේ, ‘යා අල්ලාහ්, අපගේ ප්‍රාර්ථනාවන් පිළිගනු මැනව!’ යන්නය. ‘ෆාතිහා’ සූරාව පාරායනා කිරීමෙන් අනතුරුව කුර්ආනයෙන් තමාට පාඩම් ඇති පහසු කොටසක් ආයතයක් වුව ද පාරායනා කිරීම.





4. තම උරහිසට හෝ කනට ආසන්නව තම දෑත් ඔසවා ‘අල්ලාහු අක්බර්’ යැයි පවසා ‘රුකූඃ’ කිරීම සඳහා තම කොන්ද නැමීම. තම දෑත් තම දණහිස් මත තබා හිස සහ කොන්ද එක සමානව තබා ගැනීම.
‘රුකූඃ’ හි ‘සුබ්හාන රබ්බියල් අළීම්’ යැයි තුන් වතාවක් පැවසීම.



**5** හිට ගැනීම සඳහා හිස එසවීම තම උරහිසට ආසන්නව තම දෑත් එසවීම. එම අවස්ථාවේ 'සමිඅල්ලාහු ලිමන් හමිදා' යැයි පවසීම. අනතුරුව හිටගෙන 'රබ්බනා වලකල් හම්දු..' පැවසීම.



**6** 'සුජූද්' කිරීම සඳහා පොළවට පාත්වීම. තම දෑත්, දණහිස් හා පාදයේ ඇඟිලි තුඩු පොළොවෙහි තබනවාත් සමඟ තම නළල සහ නහය ද පොළොවෙහි තැබීම. 'සුබ්හාන රබ්බියල් අඃළා' යැයි තුන් වතාවක් පැවසීම.



## 7

තම හිස ඔසවා තම දකුණු පාදය කෙලින් තබාගෙන තම වම් පාදය මත වාඩි වීම. තම දෑත් තම කළව මත තබා ගැනීම. වාඩි වී ‘රබ්බිග්ෆිර්ලී.’ යැයි පැවසීම.

## 8

පළමු ‘සුජූදය’ මෙන් නැවත වතාවක් ‘සුජූද්’ කිරීම. ‘සුජූද්’ කිරීම සඳහා නැමෙන විට ‘අල්ලාහු අක්බර්’ යැයි පැවසීම. පළමු ‘සුජූද’යේ පැවසූ දෑ දෙවන ‘සුජූද’යේ ද පැවසීම.





## 9

‘අල්ලාහු අක්බර්’ යැයි පවසමින් දෙවන ‘රකඅතය’ට නැගිටීම සඳහා තම හිස එසවීම. පළමු ‘රකඅතය’ මෙන් දෙවන ‘රකඅතය’ ද සම්පූර්ණයෙන් ඉටු කිරීම.



## 10

දෙවන ‘රකඅතයේ’ දෙවන ‘සුජූද’යෙන් පසු ‘සුජූද්’ දෙක අතර වාඩි වූ ආකාරයෙන් වාඩි වී, ‘අත්තහියියාතු ලිල්ලාහි වස්සලවාතු වත්තයියිබාතු, අස්සලාමු අලෙයික අයියුහන් නබීයියු වරහ්මාතුල්ලාහි වබරකාතුහු, අස්සලාමු අලයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු’ යැයි පැවසීම. මෙයට ‘පළමු තෂහ්හුද්’ ලෙස කියනු ලැබේ.

ඉන් පසුව, ‘අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදිව් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්.’ අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්.’ මෙයට ‘සලාතුල් ඉබ්රාහිමීයියා’ යැයි කියනු ලැබේ.



## 11

දකුණු දෙසට හිස හරවා බලා ‘අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ්’ යැයි පැවසීම. පසුව වම් පස බලා එලෙසම පැවසීම.
එලෙස සලාතය අවසන් වේ.

මෙම ලක්ෂණ, රකඅත් දෙකක ‘ෆජ්ර්, ජුමුආ’ වැනි සලාතයට ය. ‘මග්රිබ්’ වැනි රකඅත් තුනක හෝ ‘ලුහ්ර්, අස්ර්, ඉෂා’ වැනි රකඅත් හතරක සලාතයක් නම්, පළමු තෂහ්හුදය අවසානයෙන් පසු, ඉතිරිය ඉටු කළ යුතු ය. පසුව දෙවන රකඅතයේ වාඩි වූ ආකාරයට වාඩි වී පළමු තෂහ්හුදය ද අනතුරුව සලාතු ඉබ්රාහිමියියාහි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට සලවාත් පවසා සලාම් දිය යුතු ය.

## ජුමුආ සලාතය

- අල්ලාහ්, මුස්ලිම්වරුනට සිකුරාදා දින විශේෂිත සලාතයක් ඉටු කිරීම අනිවාර්ය කර ඇත. එය 'ජුමුආ සලාතය' ලෙස හැඳින්වේ. එයට විශේෂිත ලක්ෂණ හා කොන්දේසි ඇති අතර එය එදින 'ලුහ්ර්' සලාතය වෙනුවට ඉටු කරනු ලබන්නකි.
- ඒ වෙනුවෙන් මුස්ලිමුවරු මස්ජිදයේ එක්රැස්වනු ඇත. ඔවුනට 'ඉමාම්වරයා' දේශණ දෙකක් පවත්වයි. පසුව රකඅත් දෙකක සලාතය මෙහෙයවයි. එහිදී කුර්ආනය හඬ නගා පාරායනය කරයි.
- 'ජුමුආ' සලාතයට සහභාගි වන්නා ස්නානය කරගෙන, වේලාසනින් පැමිණිය යුතු ය. සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රමාද වීම නුසුදුසු ය. කවරෙකු හෝ ප්‍රමාද වුයේ නම්, ඔහු ලුහ්ර් සලාතය ඉටු කළ යුතු ය. එවිට කුර්ආනය හඬ නොනගා පාරායනය කළ යුතු ය.
- කාන්තාවට සහ ගමනක නියැළී සිටින මගීන්ට 'ජුමුආ' සලාතය අනිවාර්ය නැත.

### සාකච්චා කරන්න

නියමිත වේලාවේ සලාතය ඉටු කිරීමෙන් වැළකී සිටීමට මුස්ලිම්වරයා මුහුණ දෙන අභියෝග කිහිපයක් සහ එම අභියෝග ජයගන්නේ කෙසේ ද යන්න ඔබගේ සගයින් සමඟ සමාලෝචනය කරන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................



"විශ්වාස කළවුනි, සිකුරාදා දින ජුමුආ සලාතය වෙනුවෙන් කැඳවනු ලැබූ කල්හි වෙළඳාම අතහැර, අල්ලාහ්ව මෙනෙහි කිරීම පිණිස ඔබලා ඉක්මන් වන්න. ඔබලා දන්නෙහු නම්, එය ඔබලාට යහපත් වන්නේය." (සූරා අල් ජුමුආ , 62:9)

## ඇගයුම් ප්‍රශ්න

**1**

'ෆර්ල් සලාතයෙහි' වේලාව එළඹීමට පෙර එම සලාතය ඉටු කිරීම මුස්ලිම්වරයාට සුදුසු ය.

◯ නිවැරදි ◯ වැරදි

'ෆජ්ර් සලාතයේ' වේලාව හිරු උදාවීමත් සමඟ අවසන් වේ.

◯ නිවැරදි ◯ වැරදි

**2**

සිකුරාදා දින සුවිශේෂී නැමදුම් කටයුතු දෙකක් සඳහන් කරන්න.

............................................................................................................

............................................................................................................

මුස්ලිම්වරයෙකුගේ දෛනික ජීවිතයේ පස්වේල් සලාතය ඉටු කිරීමෙහි ප්‍රයෝජන මොනවාද?

............................................................................................................

............................................................................................................

https://islamicfiqh.net/en, මෙම වෙබ් අඩවියට පිවිසීමෙන් ඉස්ලාමයේ සලාතය නොසලකා හැරීම පිළිබඳ තීන්දුව ගැන කතා කරන්න.

............................................................................................................

............................................................................................................

**3**

පිරිමියෙකු සලාතයේදී ආවරණය කර සිටිය යුතු නිරුවත් පෙදෙස වනුයේ.

◯ අ- මුහුණ, අත් දෙක සහ පාද දෙක හැර මුලු සිරුර ම

◯ ආ-පෙකණියේ සිට දණ හිස දක්වා

◯ ඇ- උරහිසේ සිට දණ හිස දක්වා

සලාතය ඉටු කරන්නා මුහුණලා සිටිය යුතු දිශාව වනුයේ.

◯ අ- උතුරු දිශාව

◯ ආ- බටහිර දිශාව

◯ ඇ- කඃබා දිශාව

සලාතය ඉටු කරන්නා සුජූදයේ පැවසිය යුත්තේ.

◯ අ- සුබ්හාන රබ්බියල් අළීම්

◯ ආ- සුබ්හාන රබ්බියල් අඃලා

◯ ඇ- රබ්බිග්ෆිර්ලී



# හත්වන පාඩම

# සකාතය

## හැඳින්වීම

ඈත අතීතයේ සිටම මිනිසුන් මේ මිහතලය මත විවිධ තරාතිරම්වල ජීවත්ව ඇත. ඔවුන්ගෙන් සමහරු වැඩි ධනයක් තමා සතු කරගත් ධනවතුන් වන අතර තවත් සමහරු තම එදා වේල පවා නොලද දුප්පත් අය වෙති. මෙලොවදී එසේ පැවතීම අල්ලාහ්ගේ ක්‍රමවේදයකි. ඉස්ලාමය, ධනවතුන් තම ධනයෙන් අනිවාර්ය කොටසක් දුප්පතුන්ට ලබාදී, ඔවුන්ගේ දුප්පත්කම තුරන් කිරීමට උපකාර වන ලෙස අනිවාර්ය කර ඇත. මුස්ලිම්වරයාගෙන් තම ධනයෙන් කොටසක් වියදම් කරන ලෙස ඉල්ලා සිටින ඉස්ලාමය, සුදුසු සෑම අවස්ථාවකදීම දුප්පතුන්ට දානමාන ලබා දෙන මෙන් ඉල්ලා සිටියාක් මෙන් මුස්ලිම්වරයාගේ ජීවිත කාලය තුළ සහ ඔහුගේ මරණයෙන් පසුවත් ඔහුට ලැබෙන ඉමහත් කුලියෙන් කොටසක් බවට පත් කර ඇත. කුසගින්නෙන් පෙළෙන අයට ආහාර ලබාදීම සහ ඇඳුම් නොමැති අයට ඇඳුම් ලබාදීමට දිරි ගන්වන්නේය. මේ සියල්ල මුස්ලිම් සමාජය එකට බැඳී, අල්ලාහ් අපේක්ෂා කරන අයුරින් සිටීමට ය. අපි මෙම පාඩමෙන් 'සකාත්'හි නීතිය, එය ඉටු කරන්නේ කෙසේද? යන්න හා එය අනිවාර්ය වන්නේ කුමන දේවල්වල ද යන්න ඉගෙන ගනිමු.

## 'සකාත්' යනු කුමක් ද?

'සකාත්' යනු, පොහොසත් මුස්ලිම්වරුන්ගේ ධනයෙන් දුප්පතුන්ට ලබා දීමට ඇස්තමේන්තු කර ඇති කොටස වේ. මෙය ඉස්ලාමයේ තුන්වන වගකීම වන්නේය.

**අමතර කියවීම්**

**'සකාත්' සහ සමාජයට එයින් ඇති බලපෑම ගැන කතාකරන මෙම වීඩියෝ පටය නරඹන්න. මෙය නිෂ්පාදනය කරන ලද්දේ උසුල් මධ්‍යස්ථානය විසිනි.**

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

## අපි 'සකාත්' පිරිනැමිය යුත්තේ ඇයි?

අප සකාත් ගෙවන්නේ එය ගෙවීමට අපට අණ කළ අල්ලාහ්ගේ අණට අනුකූලව ය.

## මුස්ලිම්වරු තම ධනයෙන් 'සකාත්' පිරිනමන්නේ පහත සඳහන් කරුණු තුන නිසා ය.

**1**

ධනයට ඇති බැඳීමෙන් හා ඒ සමග ඇති මසුරුකමෙන් තම සිත පිරිසිදු කර ගැනීම.

**2**

ධනය වැඩි කර ගැනීම. 'සකාත්'ය පිරිනැමීම නිසා ධනය අඩු නොවන නමුත්, ධනය වැඩි කර අභිවෘද්ධිය ඇති වේ.

**3**

දුප්පතුන්, අසරණයින් වැනි අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම.

## 'සකාත්' අනිවාර්ය වන්නේ කුමන දේවල්වලද?



රන් රිදී



මුදල්



ධාන්‍ය හා පලතුරු



ගව, මහේෂාදි සතුන්

වෙළඳ භාණ්ඩ යනු, නිවාස, කඩ, වාහන, සතුන් වැනි විකිණීම උදෙසා සකසන ලද සියල්ල වේ.



වෙළඳ භාණ්ඩ

ගව, මහේෂාදි සතුන් ;:මෙයින් ඔටුවන්, ගවයන්, බැටළුවන් සහ එළුවන් අදහස් කෙරේ.

## අපි 'සකාත්' පිරිනැමිය යුත්තේ කෙසේ ද?

මුස්ලිම්වරයෙකු වසරකට වරක් තම මූල්‍ය වත්කම්වලින් 'සකාත්' පිරිනමයි. සකාත් පිරිනැමිය යුතු ප්‍රමාණය 2.5%කි. දුප්පතුන්ට සහ අවශ්‍යතා ඇත්තවුන්ට 'සකාතය' පිරිනමයි.

### අභ්‍යාස

**පහත සඳහන් වාක්‍ය ඛාණ්ඩයන් සුදුසු කොටුවෙහි යොදන්න.**

- අත් ඔරලෝසු
- රන් රිදී
- ගෘහ භාණ්ඩ
- මුදල් ප්‍රමාණයක්
- බැටළුවන්
- කුකුල්ලු
- ඇපල් වගාව

මුස්ලිම්වරයාට සකාතය අනිවර්ය වන දෑ

සකාතය අනිවාර්ය නොවන දෑ

### සාකච්ඡා කරන්න

සියලු ධනවතුන් තම සකාතය පිරිනැමීමේ ප්‍රයෝජන මොනවා ද?

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

## ඇගයුම් ප්‍රශ්න

**1**

Why do Muslims pay zakat? යන වීඩියෝපටය නරඹන්න. පසුව සකාතය අනිවාර්ය කිරීමේ අර්ථය ගැන කතා කරන්න.



...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

...............................................................................................................................

**2**

මුස්ලිම්වරයාට තම මූල්‍යමය වත්කම්වලින් ‘සකාත්’ වශයෙන් පිරිනැමිය යුතු වන්නේ

- ◯ අ-ජීවිතයටම එක් වතාවකි.
- ◯ ආ- අවුරුද්දකට වතාවකි.
- ◯ ඇ- මසකට වතාවකි.

මූල්‍යමය වත්කම්වල ‘සකාත්’ පිරිනැමිය යුතු ප්‍රමාණය වනුයේ,

- ◯ අ- 25%කි.
- ◯ ආ- 10%කි.
- ◯ ඇ- 2.5%කි.



අටවන පාඩම

# 'සව්ම්' හෙවත් උපවාසය

## හැඳින්වීම

අල්ලාහ්, තම ගැත්තන්ගෙන් සෑම සමාජයකටම අනිවාර්ය කළ නැමදුමක් ලෙස 'සව්ම්' හෙවත් උපවාසය සැලකේ. ඉස්ලාමයේ මුස්ලිම්වරයා මෙම කර්තව්‍යය අල්ලාහ්ට අවනතවීමක් වශයෙන් ඉටු කරයි. අපි මෙම පාඩමෙන් උපවාසයේ අරමුණ, උපවාසයේ නියැළෙන්නේ කෙසේද?, එය කඩවන්නේ කෙසේ ද? ඒ හා සම්බන්ද වැදගත් නීතිරීති සම්බන්ධයෙන් ඉගෙන ගනිමු.

## 'සව්ම්' හෙවත් උපවාසය යනු කුමක් ද?

'සව්ම්' යනු, ෆජ්ර් උදාවේ සිට හිරු බසින තෙක් ආහාර පාන ගැනීමෙන් හා සංසර්ගයේ නියැළීමෙන් වැලකී සිටින නැමදුකමකි. '

'රමළාන්' මාසයේ උපවාසයේ නියැළීම ඉස්ලාමයේ අනිවාර්ය කරුණුවලින් හතරවන කරුණ ය.

## අපි උපවාසයේ නියැළෙන්නේ කෙසේ ද?

මුස්ලිම්වරයා උපවාසයේ නියැළෙන්නේ,අල්ලාහ්ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හා අවනතවීමක් වශයෙනි.

## උපවාසයේ සමහර මුඛ්‍ය අරමුණු සහ ප්‍රතිලාභ

- නැමදුම් කටයුතු වැඩි කර, පාපයන් අඩු කර ගැනීමෙන් 'තක්වා' හෙවත් භියබැතිමත් වීම තහවුරු කර ගැනීමට.
- තම මනෝ ඉච්චාවන්ගෙන් මිදී ඒවා පාලනය කිරීමට සහ පුහුණු කිරීමට.
- දුගී දුප්පත් අයගේ කුසගින්න තමා දැන ගැනීමට.

"විශ්වාස කළවුනි, ඔබලා බියබැතිමත් වීම පිණිස ඔබලාට පෙර වූවනට අනිවාර්ය කරනු ලැබුවාක් මෙන් ඔබලා කෙරෙහි ද උපවාසය අනිවාර්ය කරනු ලැබ ඇත." (සූරා අල් බකරා , 2:183). යැයි අල්ලාහ් පවසන පරිදි පෙර විසූ සමාජ කෙරෙහි උපවාසය අනිවාර්ය කළාක් මෙන් අල්ලාහ් මුස්ලිම්වරුනට උපවාසය අනිවාර්ය කළේය.

## උපවාසය කඩවන දේවල්

උපවාසයේ නියැළී සිටින්නා, කවර දේවල් කිරීමෙන් උපවාසය කඩවන්නේ ද එවැනි දේවල්වලින් වැළකී සිටීම අනිවාර්ය වන්නේය. ඒවානම්,

1. ආහාර පාන ගැනීම. මෙයට පෝෂ්‍ය එන්නත් ලබාගැනීම අතුළත් වේ.
2. සංසර්ගයේ නියැළීමෙන් හෝ සංසර්ගයකින් තොරව ඕනෑකමින් ශුක්‍රානු පිට කිරීම. රමළාන් මස දිවා කාලයේ සංසර්ගයේ නියැළීම ඉමහත් පාපයකි.
3. ඕනෑකමින් වමනය ගැනීම.

ඉහත සඳහන් කාරණාවලට අමතරව පහත සඳහන් කාරණාව නිසා ද කාන්තාවකගේ උපවාසය කඩවනු ඇත.

4. ඔසප් රුධිරය හෝ දරු ප්‍රසූතියකින් පසු රුධිරය පිටවීම.

## ආශිර්වාද ලත් රමළාන් මාසය

එය 'හිජ්රි' වර්ෂයේ (චන්ද්‍ර දින දර්ශනයේ) නවවන මාසය වේ. මෙය, අභිවෘද්ධිය ලත් මාසයකි. එහිදී අල්ලාහ්, තම දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා වෙත කුර්ආනය පහළ කළේය. එහි දිවා කාලයෙහි උපවාසය නියැළීම සහ රාත්‍රී කාලය සලාතයේ නියැළීම, පාපයන් සමා කරනු ලැබීමට හේතුවක් බවට පත් කර ඇත. මාස දහසකට වඩා උතුම් රාත්‍රියක් මෙම මාසයෙහි යෙදීමෙන් අල්ලාහ් එය සුවිශේෂි කොට ඇත. එම රාත්‍රිය 'ලයිලතුල් කද්ර්' ලෙස හැඳින්වේ. කවරෙකු එම රාත්‍රිය 'දික්ර්' සහ 'සලාත්' මගින් ප්‍රාණවත් කරන්නේද, ඔහුගේ පෙර පාපයන් සියල්ල සමා කරනු ලැබේ.



මුස්ලිම්වරු රමළාන් මස රාත්‍රී කාලයේ 'තරාවීහ් සලාතය' ඉටු කරති. එය රමළාන් මාසය හා බැඳුණු මගපෙන්වීමකි. එය ඉෂා සලාතයෙන් පසු ඉටු කරනු ලැබේ.

## රමළාන් මාසයේ උපවාසය අත්හැරීමට අවසරය ඇත්තේ කවුරුන් හටද?

අල්ලාහ්, පහත සඳහන් පාර්ශවයන්ට රමළාන් මස දිවා කාලයේ උපවාසයෙන් මිදී සිටීමට අවසරය ලබා දී ඇත.

1. උපවාසයේ නියැළීමෙන් පීඩාවට පත්වන රෝගී අය
2. උපවාසයේ නියැළීමට නොහැකි මහළු අය
3. ගමනෙහි නියැළී සිටින මගියා
4. ඔසප් හෝ දරු ප්‍රසූතියකින් රුධිරය පිටවන කාන්තාවන්
5. ගැබිනි මව සහ කිරි දෙන මව තමා කෙරෙහි හෝ තම දරුවන් කෙරෙහි බියවූ විට

### උපවාසය හා සම්බන්ධ වැදගත් දෑ

- රමළාන් මාසයේ හේතුවක් ඇතිව කවරෙකු උපවාසයෙන් මිදී සිටින්නේද, ඔහු උපවාසයෙන් මිදී සිටි සෑම දවසක් වෙනුවෙන්ම වෙන දවසක් රමළාන් නොවන කාලයේ උපවාසයේ නියැළිය යුතු ය.
- රෝගියෙකු සුවවීමේ බලාපොරොත්තුවක් නොමැති රෝගයක් නිසා උපවාසය අත්හරිනවා නම්, ඔහුගෙන් උපවාසය ගිලිහෙන අතර, ඔහු උපවාසය අත්හැර දැමූ සෑම දිනක් වෙනුවෙන්ම දිළින්දෙකුට ආහාර වේලක් බැගින් ලබා දිය යුතු ය.
- උපවාසයේ නියැළීමට නොහැකි වයෝවෘද්ධ මුස්ලිම්වරයෙකුගෙන් උපවාසය ගිලිහෙන අතර, ඔහු උපවාසය අත්හැර දැමූ සෑම දිනක් වෙනුවෙන්ම දිළින්දෙකුට ආහාර වේලක් බැගින් ලබා දිය යුතු ය.




මුස්ලිම්වරු මග්රිබ් අඳානයත් සමඟ තම 'ඉෆ්තාර්' ආහාරය ගනිති. මුස්ලිම්වරුන්ගෙන් බොහෝ අය ඉෆ්තාරයට තම සහෝදරයින්ව එකතු කර ගැනීමට උනන්දු වෙති.

## ඇගයුම් ප්‍රශ්න

**1** Why do Muslim fast Ramadan? මෙම වීඩියෝ පටය නරඹා, උපවාසයේ නියැළීමෙන් මුස්ලිම්වරයෙකුට ලැබෙන ප්‍රයෝජන ගැන කතා කරන්න.



..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

**2** මිනසුන්ගෙන් සමහර පාර්ශවයන්ට උපවාසයෙන් මිදීමට අල්ලාහ්, අවසරය ලබා දී ඇත. ඔවුන්ගෙන් පාර්ශව කිහිපයක් සඳහන් කර, එසේ ලබා දිමට හේතු සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

**3** මුස්ලිම්වරයා උපවාසයේ නියැළෙන අතරතුර වැළකී සිටිය යුත්තේ

- ◯ අ-ආහාර පාන ගැනීමෙන්.
- ◯ ආ- සංසර්ගයේ නියැළීමෙන්.
- ◯ ඇ- ඉහත සඳහන් සියල්ලගෙන්.

උපවාසය කඩවන කාරණා කීයද?

- ◯ අ- 6කි.
- ◯ ආ- 5කි.
- ◯ ඇ- 4කි.



# නවවන පාඩම

# හජ් කර්තව්‍යය

## හැඳින්වීම

හජ් කර්තව්‍යය ඉස්ලාමීය මූලික වගකීම් අතුරින් එකකි. එමෙන් ම එය අල්ලාහ්ට සමීපවීමට ඇති විශිෂ්ට ක්‍රියාවකි. මෙම කර්තව්‍යයේ වැදගත්කම හා විශිෂ්ටත්වය සම්බන්ධ ව නබිවැකි බොහෝමයක් වාර්තා වී ඇත. මෙම පාඩම හරහා හජ් නමැති විශිෂ්ට නැමදුම පිළිබඳ ව මූලික අවබෝධයක් ලබා ගනිමු.

### හජ් කර්තව්‍යය යනු කුමක් ද?

හිජ්රි වර්ෂයේ අවසන් මාසය වන දුල් හිජ්ජා නම් මස නිශ්චිත නැමඳුම් කිහිපයක් ඉටුකිරීම පිණිස ගෞරවනීය මක්කා පුරවරයට හැකියාව ඇති මුස්ලිම්වරයෙකුගේ නික්ම යෑමේ නැමඳුම හජ් කර්තව්‍යය ලෙස හැඳින්වේ.

ඉස්ලාමීය මූලික වගකීම් අතුරින් පස්වන වගකීම හජ් කර්තව්‍යය යි.

ඉස්ලාමීය හිජ්රි දින දර්ශනය යනු මක්කාවේ සිට මදීනා දක්වා නබිතුමාගේ සංක්‍රමණය සමග සම්බන්ධ වූ චන්ද්‍ර දින දර්ශනයකි. දෙවන කලීෆා ‘උමර් ඉබ්න් අල්-කත්තාබ්, (අල්ලාහ් ඔහු ගැන සතුටු වේවා,) ඉස්ලාමීය දින දර්ශනය සඳහා වඩාත් සුදුසු යොමු ලක්ෂ්‍යය නබිතුමාගේ හිජ්රා බව තීරණය කළේය. ඉස්ලාමීය දින දර්ශනයට මාස දොළහක් ඇත, එය මුහර්රම් මාසයෙන් ආරම්භ වී දුල්-හිජ්ජා මාසයෙන් අවසන් වේ. අද දක්වා මුස්ලිම්වරුන් ඉස්ලාමීය හිජ්රි දින දර්ශනය අනුගමනය කරති.

## හජ් කර්තව්‍යය අප ඉටු කරන්නේ මන්ද?

මුස්ලිම්වරු හජ් කර්තව්‍ය ඉටු කිරීම පිණිස මක්කා නුවරට සංක්‍රමණය කරති.

## හජ් වන්දනාවේ මුඛ්‍ය අරමුණු සහ ප්‍රතිලාභ කිහිපයක්

- බයිතුල් හරාම් වෙත ගොස් හජ් කර්තව්‍යය ඉටු කරන මෙන් අල්ලාහ් දෙවිඳුන්ගේ ආරාධනයට පිළිගැනීමක් වශයෙන් බයිතුල් හරාම් වෙත ගොස් හජ් ඉටුකළ ප්‍රධාන නබිවරයා වන ඉබ්රාහීම් නබිතුමා ඇතුළු සෙසු නබිවරුන් ව අනුගමනය කිරීමක් වශයෙන්
- එක් නැමදුමකින් පසු ව තවත් නැමදුමක් යන ආකාරයෙන් දවස් කිහිපයක් රැඳී සිටිමින් නැමදුම් කිරීමක් වශයෙන්
- ලොව නන් දෙසින් පැමිණෙන මුස්ලිම්වරුන් ව පවිත්‍ර මානසිකත්වයකින් හමුවීමක් දැනහැඳින ගැනීමක් හා ඔවුන් සමග සන්නිවේදන සම්බන්ධතා ගොඩනැගීමක් වශයෙන්

### සාකච්ඡා කරන්න



දැනටමත් හජ් ඉටු කර ඇති ඔබේ හවුල්කරුවන් සමඟ මෙම වන්දනා ක්‍රියාව සාකච්ඡා කර, ඔවුන් එය ඉටු කළ විට ඔවුන්ගේ හැඟීම් ගැන ඔවුන්ගෙන් විමසන්න.

## හජ් ඉටුකිරීම අනිවාර්ය වන උදවිය

ශාරීරික ව හා ආර්ථික ව ශක්තිමත් සෑම මුස්ලිම්වරයෙකුට ම හා මුස්ලිම්වරියකට ම ජීවිතයේ එක් වතාවක් හෝ හජ් ඉටු කිරීම අනිවාර්ය වේ.

### හජ් හා බැඳි සැලකිලිමත් විය යුතු කරුණු

- හජ් ඉටු කිරීම සඳහා වෙන් වූ ස්ථානයෙහි (මක්කා නුවර) හා නිශ්චිත කාලයෙහි (දුල් හජ් මස) හැර වෙනයම් ස්ථානයක හෝ කාලයක හජ් ඉටු කළ නොහැකි ය.
- හජ් කර්තව්‍යය තුළ තවත් නැමදුම් බොහෝමයක් අන්තර්ගත ව ඇති බැවින් හජ් ඉටු කිරීමට පිටත්ව යන් අයෙක් ඒ පිළිබඳ ව හැදෑරිය යුතු ය.



සෑම වසරකම විවිධ රටවල මුස්ලිම්වරු විශාල කණ්ඩායම් වශයෙන් හජ් වන්දනා කරති. ඒකාකාරී සරල ඇඳුම් ඇඳීම, ධනවත් සහ දුප්පත් යන දෙපිරිසටම සියලු සමාජ බාධක සහ වෙනස්කම් බිඳ වැටීමත් සමඟ එක හා සමාන බව පෙනේ.

# ඇගයුම් ප්‍රශ්න

**1**

why do Muslims perform pilgrimage (Hajj)?
යන වීඩියෝ පටය නරඹා, මෙම හජ් කර්තව්‍යය මිනිස් ස්වභාවය හා සැසඳෙන අයුරු සාකච්ඡා කරන්න.



**2**

හජ් කර්තව්‍යය මුස්ලිම්වරු ඉටු කරන්නේ

- ◯ අ- රමළාන් මස
- ◯ ආ- දුල් හජ් මස
- ◯ ඇ- දෙසැම්බර් මස

මුස්ලිම්වරයෙකුට හජ් අනිවාර්ය වන්නේ

- ◯ අ- ජීවිතයේ එක් වතාවක්
- ◯ ආ- ජීවිතයේ දෙවතාවක්
- ◯ ඇ- හැකියාව ඇති සෑම විට ම

# ස්වයං ඇගයීම

| | ඉගැන්වීමේ අරමුණු | තක්සේරු අගය | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | ඉතා හොඳයි |
| 1 | ඉබාදත් (නැමදුම) යන්නෙහි අර්ථය වැටහුනේ ද? | | | | |
| 2 | ඉබාදත්වල කොන්දේසි සඳහන් කළ හැකි ද? | | | | |
| 3 | ඉබාදත් වර්ග මොනවා දැයි සඳහන් කළ හැකි ද? | | | | |
| 4 | තහාරත් (පවිත්‍රතා) යන්නෙහි අර්ථය වැටහුනේ ද? | | | | |
| 5 | තහාරත් වර්ග හඳුනන්නේ ද? | | | | |
| 6 | වුළූහි ලක්ෂණ කුමක් දැයි විග්‍රහ කළ හැකි ද? | | | | |
| 7 | වුළූ අවලංගු කරවන දෑ කුමක්දැයි දන්නවා ද? | | | | |
| 8 | මේස් මත ජලයෙන් පිරිමැදීම සම්බන්ධ නීතිරීති දන්නවා ද? | | | | |
| 9 | ස්නානයේ ලක්ෂණ කුමක්දැයි හඳුනන්නේ ද? | | | | |
| 10 | ස්නානය අනිවාර්ය කරවන දෑ කුමක් දැයි දන්නවා ද? | | | | |
| 11 | ජනාබත් තත්ත්වයේ පසු වන විට නොකළ යුතු දෑ කුමක්දැයි දන්නවා ද? | | | | |
| 12 | ස්ත්‍රියකට පිටවන රුධිර වර්ග කුමක් දැයි ඔබ දැනුවත් ද? | | | | |
| 13 | ස්ත්‍රියකට පිටවන රුධිරය පිළිබඳ මූලික නීතිරීති පිළි ඔබ දන්නවා ද? | | | | |
| 14 | සලාතය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි දන්නවා ද? | | | | |
| 15 | අප සලාතය කරන්නේ මන්දැයි ඔබ දන්නවා ද? | | | | |
| 16 | සලාතයේ කොන්දේසි කුමක් දැයි දන්නවා ද? | | | | |
| 17 | පස්වේල සලාතයන් කුමක් දැයි ඔබ දන්නවා ද? | | | | |
| 18 | සලාතයේ ලක්ෂණ කුමක්දැයි දන්නවා ද? | | | | |
| 19 | ජුමුආ සලාතයේ නීතිරීති පිළිබඳ දන්නවා ද? | | | | |

| | ඉගැන්වීමේ අරමුණු | තක්සේරු අගය | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | ඉතා හොඳයි |
| 20 | සකාතයේ අර්ථය අවබෝධකරගත හැකි ද? | | | | |
| 21 | අප සකාතය ලබා දෙන්නේ කුමකට දැයි වැටහුනේ ද? | | | | |
| 22 | සකාතය අනිවාර්ය වන දෑ කුමක් දැයි හඳුනාගත හැකි ද? | | | | |
| 23 | සකාතයේ කොන්දේසි හඳුනාගත හැකි ද? | | | | |
| 24 | සකාතය ලැබීමට සුදුසු පාර්ශ්ව කවුරුන් දැයි හඳුනාගත හැකි ද? | | | | |
| 25 | උපවාසයේ අදහස වැටහුනේ ද? | | | | |
| 26 | අප උපවාසයේ නියැලෙන්නේ මන්දැයි වැටහුනේ ද? | | | | |
| 27 | අනිවාර්ය උපවාසය හඳුනාගත හැකි ද? | | | | |
| 28 | උපවාසය අවලංගු කරවන දෑ හඳුනාගත හැකි ද? | | | | |
| 29 | රමළාන් මාසයේ උපවාසයෙන් වැළකී සිටිය හැකි අය කවුරුන්දැයි හඳුනාගත හැකි ද? | | | | |
| 30 | හජ් කර්තව්‍යය යනු කුමක්දැයි වැටහුනේ ද? | | | | |
| 31 | අප හජ් කරන්නේ මන්දැයි ඔබට වැටහුනේ ද? | | | | |
| 32 | හජ් ඉටුකිරීම අනිවාර්ය වන්නේ කවුරුන් හට දැයි දන්නවා ද? | | | | |
| 33 | ඔබට නිවැරදි ව වුළූ කළ හැකි ද? | | | | |
| 34 | ඔබට නිවැරදි ව ස්නානය කළ හැකි ද? | | | | |
| 35 | ඔබට නිවැරදි ව සලාතය ඉටු කළ හැකි ද? | | | | |
| 36 | ඉස්ලාමයේ පහසුභාවය හා සහනශීලීත්වය ඔබට දැනෙනවා ද? | | | | |



## සිව්වන ඒකකය

# ඉස්ලාමීය නීතිරීති







# ඒකකයේ අන්තර්ගත පාඩම්

1. ඇඳුම් පැළඳුම්
2. ආහාරපාන
3. මූල්‍ය ගනුදෙනු
4. සාරධර්ම







# පළමු පාඩම

# ඇඳුම් පැළඳුම්

## හැඳින්වීම

මිනිසුන් අඳින පළඳින ඇඳුම් පැළඳුම් යනු උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගෙන් වූ ඉමහත් දායාදයකි. මේ බැව් උතුම් අල් කුර්ආනයෙහි මෙසේ සඳහන් වේ. “ආදම්ගේ දරුවනි! නුඹලාගේ රහස්‍ය පෙදෙස් ආවරණය කරන වස්ත්‍ර ද අලංකාරය ද සැබැවින්ම අපි නුඹලා වෙත පහළ කර ඇත්තෙමු. එනමුත් දේව බැතිමත්භාවයේ වස්ත්‍රය වනාහි එයමය ශ්‍රේෂ්ඨ වනුයේ. එය අල්ලාහ්ගේ සංඥාවන් අතරිනි. (මෙමගින්) ජනයා උපදෙස් ලැබිය හැකිය.” (සූරා අල් අඃරාෆ්, 7:26).

## මෙම පාඩමෙන් අපි ඇඳුම් පැළඳුම් හා සම්බන්ධ නීතිරීති කිහිපයක් පිළිබඳ අවබෝධ කරගනිමු.

ඇඳුම් පැළඳුම් හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය වන්නේ ඒවා සියල්ල පොදුවේ අනුමත යන්න ය. උතුම් අල් කුර්ආනයේ හෝ සුන්නාවේ පැහැදිලි සාධකයක් නොමැති ව ඉන් කිසිවක් තහනම් නොවේ.

ඇඳුම් පැළඳුම් ඇතුළු එදිනෙදා කටයුතු හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය වන්නේ ඒ සියල්ල පොදුවේ අනුමත යන්න ය. එබැවින්, සාධකයක් නොමැති ව ඉන් කිසිවක් තහනම් නොවේ. මෙහි සඳහන් තහනම් කරන ලද ඇඳුම් පැළඳුම් සියල්ල සම්බන්ධයෙන් උතුම් අල් කුර්ආනයේ හෝ සුන්නාවෙහි පැහැදිලි තහනමක් සඳහන් වී ඇත.

## සාකච්ඡා කරන්න

ඇඳුම් පැළඳුම් මඟින් ඉටු වන අවශ්‍යතා මොනවා ද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

## තහනම් කරන ලද ඇඳුම් පැළඳුම්

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් සමහර වර්ගයේ ඇඳුම් පැළඳුම් තහනම් කර ඇත. එයින් කිහිපයක් මෙසේ සඳහන් කරමු.

පිරිමි පුද්ගලයෙකුගේ අව්රතයේ සීමාව වන්නේ පෙකණියේ සිට දණහිස දක්වා වේ. කාන්තාවකගේ අව්රතය ගත් කළ, අන්‍ය පිරිමින් ඉදිරියේ දී ඇගේ මුළු ශරීරය ම අව්රත් වන අතර, පියා, පුතා හා සහෝදරයා වැනි මහ්රම් (විවාහ වීමට අනුමැතිය නොමැති) උදවිය ඉදිරියේ දී සාමාන්‍යයෙන් කාන්තාවන් ඉදිරියේ සිටින අයුරින් ම සිටිය හැක.

- අව්රතය (ශරීරයේ අනිවාර්යයෙන් ආවරණය කළ යුතු පෙදෙස) හෙළි වන අයුරින් ඇති කාන්තා හෝ පිරිමි ඇඳුම්.
- පිරමියෙකු කාන්තාවකගේ ඇඳුම් ඇඳීම හෝ කාන්තාවක පිරිමියෙකුගේ ඇඳුම් ඇඳීම වැනි විරුද්ධ ලිංගිකයාගේ ඇඳුම්වලට සමාන ඇඳුම්.
- මමත්වය හා උඩගුකම ඇති කරන්නා වූ ඇඳුම්.
- අනවශ්‍ය මුදල් නාස්තියක් ඇති කරන්නා වූ ඇඳුම්.
- පිරිමි පාර්ශවයට පට රෙදි ඇඳීම හා රත්තරං ආභරණ පැළඳීම තහනම් වේ.
- පූජ්‍ය පක්ෂය භාවිත කරන ඇඳුම් වැනි අන්‍යාගමිකයන්ට ආවේණික ඇඳුම්වලට සමාන ඇඳුම් ඇඳීම තහනම් වේ.

ඉස්ලාමයේ සමහර ඇඳුම් පැළඳුම් තහනම් කරනු ලැබීමට අදාළ හේතු පිළිබඳ ඔබේ සගයින් සමග සාකච්ඡා කරන්න.



දේව දූත මුහම්මද්තුමාණන් පිරිමියෙකු කාන්තාවක අනුකරණය කිරීමත් කාන්තාවක පිරිමියෙකු අනුකරණය කිරීමත් තහනම් කොට ඇත. මෙම තහනමට ඇඳුම් පැළඳුම් හා කතා කරන ශෛලිය ද අන්තර්ගත වේ. මෙලෙස විරුද්ධ ලිංගයා අනුකරණය කිරීම, උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ දඬුවමට භාජනය වන මහා පාපයක් ලෙස සලකනු ලැබේ. පිරිමියෙකුගේ ස්වභාවය හා බාහිර පෙනුම කාන්තාවකගේ ස්වභාවය හා බාහිර පෙනුමට වෙනස් ව පැවතිය යුතු යැයි ඉස්ලාමය බලාපොරොත්තු වන අතර, කාන්තාවකගේ ස්වභාවය හා බාහිර පෙනුම ද පිරිමියෙකුගේ ස්වභාවය හා බාහිර පෙනුමට වෙනස් ව පැවතිය යුතු යැයි බලාපොරොත්තු වේ. එය මිනිස් ස්වභාවය හා විචාර බුද්ධියට පටහැනි නොවන පැහැදිලි සාධකයක් ද වේ.

## පැවරුම

පිරිමින්ට පමණක් තහනම් කරනු ලැබ ඇති ඇඳුම් පැළඳුම් වර්ග හා පිරිමි හා කාන්තා යන දෙපාර්ශවයට ම තහනම් කරනු ලැබ ඇති ඇඳුම් පැළඳුම් වර්ග වෙන් කර දක්වන්න.

- විරුද්ධ ලිංගිකයාට සමාන වන ඇඳුම්
- අව්රතය හෙළි වන ඇඳුම්
- අනවශ්‍ය නාස්තියක් ඇති කරන ඇඳුම්
- මමත්වය හා උඩගුකම ඇති කරන ඇඳුම්
- අන්‍යාගමිකයින්ට ආවේණික ඇඳුම්
- පට රෙදි හා රත්තරං





## සාකච්ඡා කරන්න

කාන්තාවට හා පිරිමියාට ගැළපෙන ඇඳුම් පැළඳුම් කුමක් දැයි තීරණය කිරීමේ දී විලාසිතා, චාරිත්‍ර වාරිත්‍ර, සම්ප්‍රදා හෝ නිල නීතිරීති යනාදිය පදනම් කරගත හැකි ද?

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

## ඇගයුම් ප්‍රශ්න

**1** යම් යම් ඇඳුම් පැළඳුම් ඉස්ලාමයේ තහනම් කරනු ලැබීමට හේතු වූ කරුණු පිළිබඳ කල්පනා කර බලන්න.

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

.............................................................................................................................................................

**2** නිවැරදි පිළිතුර තෝරන්න.

■ රත්තරං පැළඳීම තහනම් වනුයේ,

- ◯ අ- පිරිමියාට ය.
- ◯ආ- කාන්තාවට ය.
- ◯ ඇ- කුඩා දරුවන්ට ය.

■ පිරිමියාට තහනම් කරුණක් වන්නේ,

- ◯ අ- ලොම් ඇඳුම් ඇඳීම ය.
- ◯ ආ- පට රෙදි ඇඳීම ය.
- ◯ ඇ- ඒ දෙක ම ඇඳීම ය.



# දෙවන පාඩම

# ආහාර පාන

## හැඳින්වීම

ආහාර පාන යනු වැඩි වැඩියෙන් උත්තරීතර අල්ලාහ් දෙවිඳුන්ට කෘතගුණ දැක්විය යුතු උන්වහන්සේගේ අසීමිත දායාදයක් ලෙස මුස්ලිම්වරයෙක් සලකයි. නැමඳුම් ඉටු කිරීමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීමේ චේතනාවෙන් යුතු ව අහාරපාන ලබා ගැනීම ද උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ට කරන්නා වූ ඉබාදත් හෙවත් නැමඳුමක් වේ. මෙම පාඩමේ දී ආහාර පාන හා සම්බන්ධ නීතිරීති හා ආචාරධර්ම කිහිපයක් පිළිබඳ දැනගනිමු. එවගේ ම, මුස්ලිම්වරයෙකු වැලකී සිටිය යුතු තහනම් කරන ලද ආහාර පාන පිළිබඳ ද දැනගනිමු.

## ආහාරපාන හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය

ආහාර පාන හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය වන්නේ ඒ සියල්ල අනුමත යන්න ය. උතුම් අල් කුර්ආනයේ හා සුන්නාවෙහි තහනම් යැයි සඳහන් ආහාර පාන හැර අන් සියල්ල අනුමත වේ. මේ පිළිබඳ ව උතුම් අල් කුර්ආනයේ මෙසේ සඳහන් ය. "අහෝ ජනයිනි! මහපොළොවේ ඇති දැයින් අනුමත පිවිතුරු දෑ අනුභව කරනු." (සූරා අල් බකරා, 2:168).

## තහනම් කරන ලද ආහාර පාන

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් ආහාර පාන වර්ග කිහිපයක් තහනම් කොට ඇත. ඒවායින් කිහිපයක් මෙසේ සඳහන් කළ හැක.

- මත්පැන් - මෙමගින් මිනිස් බුද්ධිය විකල් වේ. මිනිස් බුද්ධිය ආරක්ෂා කරගැනීම යනු මකාසිදුස් ශරීආ හෙවත් ඉස්ලාමීය නීතිරීතිවලට අදාළ අරමුණු අතුරින් එකකි.
- මත්ද්‍රව්‍ය - මෙය මිනිස් බුද්ධිය මෙන් ම ශරීරය ද දුබල කරයි.
- ඉස්ලාමීය නීතිරීතිවලට අනුකූල ව ගෙල නොසිඳ හෝ ඒ අවස්ථාවේ දී උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමය සඳහන් නොකර මරණයට පත් කුකුළන්, එළුවන්, හරකුන් හා ඔටුවන් වැනි පශු වර්ගයේ සත්තු.
- සූකර මාංශ - මන්ද යත් එය ආහාරයට ගනු පිණිස අනුමැතිය නොමැති අපිරිසිදු මාංශ වර්ගයකි.
- සිංහයා, කොටියා, රාජාලියා හා උකුස්සා වැනි දඩයම් සත්තු
- පිළිම, ගින්දර වැනි අසත්‍ය ලෙස නමඳිනු ලබන දෑ වෙනුවෙන් කැප කරනු ලැබූ සත්තු.

මකාසිදුස් ශරීආ හෙවත් ඉස්ලාමීය නීතිරීතිවලට අදාළ අරමුණු යනු ඉස්ලාමීය දැනුම් ක්ෂේත්‍ර අතුරින් එකක් වේ. එමගින් උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මෙම නීතිරීති පනවා ඇත්තේ මන් ද? කුමක් සඳහා ද? වැනි ඉස්ලාමීය නීතිරීතිවලට අදාළ අරමුණු හා අපේක්ෂා පිළිබඳ දැනගත හැක.

## ඉස්ලාමීය සත්ත්ව ඝාතනය හෙවත් දබහ් කර්තව්‍යයට අදාළ කොන්දේසි

ඉස්ලාමයට අනුව සත්ත්ව ඝාතනයක් සිදු කරනු පිණිස පහත කොන්දේසි සම්පූර්ණ විය යුතු ය.

1. මෙම කර්තව්‍යය ඉටු කරන්නා විචාර බුද්ධිය ඇති, ඉස්ලාමයට අනුකූල ව සත්ත්ව ඝාතනය සිදු කිරීමේ චේතනාවෙන් යුක්ත මුස්ලිම්වරයෙකු හෝ කිතුනුවෙකු හෝ යුදෙව්වෙකු විය යුතු ය.
2. මේ සඳහා භාවිතා කරන ආයුධය ඊට සුදුසු, රුධිරය ගලා යෑමට සලස්වන ආකාරයේ හා පිහිය වැනි හොඳින් මුවහත් ආයුධයක් විය යුතු ය. අධික බර මඟින් සත්ත්වයා ඝාතනයට ලක් කරන යමක් භාවිතා කිරීම හෝ සත්ත්වයාගේ හිස යමක වැද්දීමෙන් හෝ විද්‍යුත් කම්පන මඟින් සත්ත්ව ඝාතනය සිදු කිරීම සපුරා තහනම් වේ.
3. සත්ත්වයා ඝාතනය කරන අවස්ථාවේ දී "බිස්මිල්ලාහ්" (උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමයෙන්) යනුවෙන් පැවසිය යුතු ය.
4. ඉස්ලාමීය සත්ත්ව ඝාතනයක දී කපනු ලැබිය යුතු දෑ සියල්ල කැපිය යුතු ය. ඒවා නම් අන්නනාලිකාව, උගුරු දණ්ඩ හා බෙල්ලෙහි ඇති කණ්ඨරික ශිරා දෙක වේ. මේවායින් තුනක් කපනු ලැබීම ප්‍රමාණවත් ය.

## මුහුදු සත්ත්වයින් ආහාරයට ගැනීම හා සම්බන්ධ ඉස්ලාමීය නීතිය කුමක් ද?

ජලයේ හැර ජීවත් නොවන මත්සයින් හා ඉස්සන් වැනි ජලජ ජීවීන් මුහුදෙහි හෝ ගංගාවන්හි ජීවත් වුව ද එම ජීවීන් මරණයට පත් වූ පසුත් ආහාරයට ගැනීම අනුමත ය.



කොන්දේසි දෙකක් මත දඩයම් සතුන් නොවන ගොඩබිම වෙසෙන අනෙකුත් සතුන් දඩයම් කිරීම හා අනුභව කිරීම අනුමත ය. එම කොන්දේසිය නම් සත්ත්වයා ව දඩයම් කරන අවස්ථාවේ දී බිස්මිල්ලාහ් (උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමයෙන්) යනුවෙන් පැවසීම හා එම සත්ත්වයා පණපිටින් අල්ලා ගනු ලැබුවේ නම් ඉස්ලාමයට අනුකූල ව ඝාතනය කිරීම වේ.

## අවන්හල් හා වෙළඳසැල්හි විකිණීමට ඇති මාංශ පිළිබඳ ඉස්ලාමීය නීතිය

1. නිරාගමික වැනි මුස්ලිම් හෝ පුස්තක ලත් උදවිය (කිතුනු හා යුදෙව්) නොවන පුද්ගලයෙකු විසින් ඝාතනය කරන ලද සත්ත්වයෙකුගේ මාංශ ආහාරයට ගැනීම සපුරා තහනම් ය. බහුතරය මුස්ලිම් හෝ පුස්තක ලත් උදවිය නොවන රටවල්හි ඇති අවන්හල් හා වෙළඳසැල්හි විකිණීමට ඇති මාංශවලට ද මෙය අදාළ වේ.

2. උතුම් අල් කුර්ආනයට අනුව මුස්ලිම් හෝ පුස්තක ලත් උදවිය විසින් ඉස්ලාමයට අනුකූල ව ඝාතනය කරනු ලබන සතුන්ගේ මාංශ ආහාරයට ගැනීම අනුමත ය.

3. මුස්ලිම් හෝ පුස්තක ලත් උදවිය විසින් විද්‍යුත් කම්පන හෝ දියෙහි ගිල්වීම වැනි ඉස්ලාමයට පටහැනි අයුරින් ඝාතනය කරනු ලබන සත්ත්වයින්ගේ මාංශ ආහාරයට ගැනීම සපුරා තහනම් ය.

4. පුස්තක ලද උදවිය විසින් ඝාතනය කරන ලද හා ඔවුන්ගේ අවන්හල් හා වෙළඳසැල්හි ඇති මාංශ පොදුවේ අනුමත වේ. එබැවින් එම සත්ත්වයින් ඝාතනය කරන ලද ක්‍රමවේදය තහවුරු කරගැනීමට නොහැකි වුව ද “බිස්මිල්ලාහ්” (උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමයෙන්) යනුවෙන් පවසා ආහාර ගැනීම අනුමත ය. නමුත්, ඉස්ලාමයට අනුකූල ව ඝාතනය කරන ලද බව තහවුරු වූ සතුන්ගේ මාංශ ආහාරයට ගැනීම මුස්ලිම්වරයෙකුට වඩාත් සුදුසු වේ.

### සාකච්ඡා කරන්න

ඔබගේ මිතුරන් සමඟ ඔබේ රටේ ඉස්ලාමයේ අනුමත ආහාරවලට අදාළ විස්තර ඇතුළත් වෙබ් අඩවි පිළිබඳ අන්තර්ජාලයේ සොයාබැලීමක් සිදු කරන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................



අවන්හල් හා වෙළඳසැල්හි විකිණීමට ඇති සත්ත්ව මාංශ පිළිබඳ ඉස්ලාමීය නීතිය එම සතුන් ඝාතනය කළ පුද්ගලයාගේ දහම හෝ චින්තනය අනුව වෙනස් වේ.

## ඇගයුම් ප්‍රශ්න

**1** තහනම් කරන ලද ආහාර පාන වර්ග පිළිබඳ අවධානය යොමු කොට, ඒවා තහනම් වීමට අදාළ හේතුව හා අරමුණ කුමක් දැයි සිතා බලන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

**2** යුදෙව් හෝ කිතුනු භක්තිකයෙකු සත්ත්වයෙකු ඝාතනය කරන අවස්ථාවේ දී බිස්මිල්ලාහ් (උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන්ගේ නාමයෙන්) යැයි නොපැවසුව ද එම සත්ත්වයාගේ මාංශ අනුභව කිරීමට අනුමැතිය ඇත.

◯ නිවැරදි ය ◯ වැරදි ය

විදුලි සැර හෝ විද්‍යුත් කම්පන මඟින් මරණයට පත් සත්ත්වයින්ගේ මාංශ අනුභව කිරීම තහනම් ය.

◯ නිවැරදි ය ◯ වැරදි ය



# නෙවන පාඩම

# මූල්‍යමය ගනුදෙනු

## හැඳින්වීම

ඉස්ලාම් දහමේ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කරන තවත් එක් සුවිශේෂී කරුණක් වන්නේ මිනිසුන් අතර සිදු වන ගනුදෙනු නිවැරදි ව සිදු කිරීම, මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා කිසිවෙකුටත් අසාධාරණයක් සිදු නොවීමට වගබලා ගැනීම යනාදි කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් ඉස්ලාමීය ඉගැන්වීම් මිනිස් ජීවිතයේ සෑම පැතිකඩක් ම ආවරණය කර තිබීම ය. මෙලෙස අවධානය යොමු කරන මූලික කරුණක් වන්නේ මූල්‍යමය ගනුදෙනු හසුරුවන නීතිරීති හා නිර්ණායක පැනවීම ය. මෙම පාඩමේ දී අපි මූල්‍යමය ගනුදෙනු හා සම්බන්ධ නීතිරීති හා සමහර ගනුදෙනු තහනම් කරනු ලැබීමට අදාළ හේතු කාරණා පිළිබඳ දැනගනිමු.

## මූල්‍යමය ගනුදෙනු යනු කුමක් ද?

වෙළඳාම හා ව්‍යාපාරය වැනි වටිනාකමකින් යුත් යමක් තවත් වටිනාකමකින් යුත් දෙයක් වෙනුවෙන් හෝ කුළියට දීම වැනි යම් ප්‍රයෝජනයක් වෙනුවෙන් හෝ තෑගි වැනි කිසිදෙයක් වෙනුවෙන් නොවන වටිනාකමකින් යුත් දෑ හුවමාරු කරගනු ලබන සෑම ගනුදෙනුවක් ම මූල්‍යමය ගනුදෙනු ලෙස හැඳින් වේ.

## මූල්‍යමය ගනුදෙනු හා සම්බන්ධ පොදු ඉස්ලාමීය නීතිය

උතුම් අල් කුර්ආනයේ හෝ සුන්නාවේ තහනම් කරන ලද දෑ හැර අනෙකුත් සියලු ම ආකාරයේ මූල්‍යමය ගනුදෙනු සිදු කිරීමට පූර්ණ අනුමැතිය ඇත.

මූල්‍යමය ගනුදෙනු ද ඇතුළත් පොදුවේ ගනුදෙනු සම්බන්ධයෙන් පොදු ඉස්ලාමීය නීතිය වන්නේ ඒ සියල්ල අනුමත යන්න ය. ඒ අනුව පැහැදිලි සාධකයකින් තොර ව කිසිවක් තහනම් නොවේ. නමුත්, ඉබාදත් හෙවත් නැමදුම් කටයුතුවල දී තත්ත්වය මීට හාත්පසින් ම වෙනස් ය. එනම් පැහැදිලි සාධකයකින් තොර ව කිසිදු ඉබාදතයක් ඉටු කළ නොහැකි ය.

## තහනම් කරන ලද මූල්‍යමය ගනුදෙනු

උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් මූල්‍යමය ගනුදෙනු සමහරක් තහනම් කොට ඇත. ඒවායින් කිහිපයක් මෙසේ සඳහන් කළ හැකි ය.

- වංචා කිරීම් හා බල කිරීම් වැනි අයුතු ආකාරයෙන් මුදල් ඉපැයීම.
- කෙනෙකුට තමන් අකැමති ගනුදෙනුවක් සිදු කරන මෙන් බල කිරීම.
- මත් පැන් හා මත් ද්‍රව්‍ය වැනි මිනිස් සිරුරට හානි පමුණුවන දේවල්වලට අදාළ ගනුදෙනු.
- පොලියට දීම - එනම් ණය මුදලක් ලබා දීමේ දී සියයට පහක් හෝ එවැනි යම් ප්‍රතිශතයක් පොළියක් ලෙස වැඩිපුර අය කිරීම.
- නොදන්නා යමක් විකිණීම. නිදසුනක් ලෙස යම් පෙට්ටියක් තුළ කුමක් තිබෙන්නේ දැයි නොදැන එය විකිණීම දැක්විය හැක.
- අයුක්තිසහගත ලෙස ජයග්‍රාහකයා පරාජිතයාගේ මුදල් සියල්ල ලබා ගන්නා වූ සූදුව හා ඔට්ටු ඇල්ලීම.

## සමහර මූල්‍යමය ගනුදෙනු තහනම් වීමට අදාළ හේතු

මෙලෙස යම් යම් මූල්‍යමය ගනුදෙනු තහනම් වීමට අදාළ ප්‍රධානතම හේතු ලෙස පහත කරුණු දැක්විය හැක.




### සාකච්ඡා කරන්න



එදිනෙදා ජීවිතයේ මුස්ලිම්වරයෙකු මූල්‍යමය ගනුදෙනු බොහෝමයක් සිදු කරන හෙයින් එම ගනුදෙනු ඉස්ලාමයේ අනුමත (හලාල්) ද තහනම් (හරාම්) ද යන්න පිළිබඳ සැලකිලිමත් වන්නේ කෙසේ ද?

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

## පැවරුම

පහතත දැක්වෙන කරුණු ඊට අදාළ මාතෘකාව යටතේ සඳහන් කරන්න.

- අල්ලස් දීම
- මත්පැන් අලෙවිය
- මිනිස් සිරුරට හානි පමුණුවන දෑ අලෙවි කිරීම
- අන්තර්ජාලය හරහා ඇඳුම් මිලදී ගැනීම
- ජලය විකිණීම
- සියයට දහයක ප්‍රතිශතයක් වැඩිපුර ලබා දිය යුතු යන කොන්දේසිය යටතේ ණය ලබා දීම
- රත්තරං යොදා නිෂ්පාදනය කරන ලද ආහාර භාජන අලෙවි කිරීම

**අනුමත මූල්‍යමය ගනුදෙනු**

**තහනම් කරන ලද මූල්‍යමය ගනුදෙනු**



පොලියෙහි ඇති හානිකර තත්ත්වයන් හේතුවෙන් ඉස්ලාමය දැඩි ව තහනම් කරන ලද මූල්‍යමය ගනුදෙනු අතුරින් එය ප්‍රධානතම එකක් වේ. තව ද පොලිය, උත්තරීතර අල්ලාහ් දෙවිඳාණන් දැඩි දඬුවම් ඇති බවට අනතුරු අඟවා ඇති මහා පාපකර්මයන්ගෙන් එකක් වේ.

## ඇගයුම් ප්‍රශ්න

**1** ඉස්ලාමයේ තහනම් කරන ලද මූල්‍යමය ගනුදෙනු කෙරෙහි අවධානය යොමු කොට, ඒවා එලෙස තහනම් වීමට අදාළ හේතු කාරණා පිළිබඳ හොඳින් සිතා බලන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

**2** සූදුවට සම්බන්ධ දෙපාර්ශවය ම ස්ව කැමැත්තෙන් ම එහි නියැලෙන්නේ නම් එය ඉස්ලාමයේ අනුමත ගනුදෙනුවක් ලෙස සැලකේ.

◯ නිවැරදි ය ◯ වැරදි ය

මුස්ලිම්වරයෙකු දැඩි මුදල් අවශ්‍යතාවකින් පසු වන විට පොලියට ණයක් ලබා ගැනීම අනුමත ය.

◯ නිවැරදි ය ◯ වැරදි ය



# සිව්වන පාඩම

# යහගුණාංග හා යහපත් සාරධර්ම

## හැඳින්වීම

යහපත් සාරධර්ම සිය ජීවිතයට එකතු කර ගන්නා මෙන් ඉස්ලාමය සිය අනුගාමිකයින් ව දිරිගන්වයි. බොහෝ හදීස් මගින් යහපත් සාරධර්මවල වැදගත්කම පිළිබඳ නබිතුමාණන් මගපෙන්වා දී ඇත. එමෙන් ම නබිතුමාණන් මුස්ලිම්වරුන් ඉටු කරන බොහෝ නැමඳුම් සමග යහපත් සාරධර්ම බද්ධ කොට ඇත. යහපත් සාරධර්මවලින් හෙබි මුස්ලිම්වරයෙකුට මෙලොව හා පරලොව උතුම් ආනිශංස හිමිවන බවට සහතික කරනු ලැබුවෙක් වන්නේය. මෙම පාඩම හරහා ඉස්ලාමයෙහි යහපත් සාරධර්මවල වැදගත්කම ඒවාහි ශ්‍රේෂ්ඨත්වයන් කිහිපයක විග්‍රහයන් මගින් හඳුනා ගනිමු.

## ඉස්ලාමීය දැක්මෙන් යහපත් සාරධර්ම

- යහපත් සාරධර්මවලට ඉස්ලාමය තුළ ඉමහත් ස්ථානයක් හිමි ය. එමෙන් ම යහපත් සාරධර්ම ඉස්ලාමීය ශරීඅතයේ අරමුණුවලින් ප්‍රධාන අරමුණක් ද වේ. එමෙන් ම නබිතුමාණන්ගේ මෙලොව සම්ප්‍රාප්තියේ අරමුණු අතුරින් එක් අරමුණක් ලෙස ද යහපත් සාරධර්ම ඇත.
- ඊමානයෙන් (මුස්ලිම්වරයෙකුගේ විශ්වාස පද්ධතිය) වඩාත් සම්පූර්ණ මුස්ලිම්වරයා වඩාත් යහපත් සාරධර්ම ඇත්තා යැයි පවසන තරමට යහපත් සාරධර්ම හා ඊමානය අතර ශක්තිමත් බැඳීමක් ඇත.
- මුස්ලිම්වරයෙකුට සලාතය උපවාසය වැනි නැමඳුම් හරහා ආනිශංස හිමිවනවා මෙන් ම ඔහුගේ යහපත් සාරධර්මවලට ද ආනිශංස හිමි වේ.

## සාකච්ඡා කරන්න



සෙසු පුද්ගලයින් සමග මුස්ලිම්වරයෙකුගේ සාරධර්ම කෙසේ පැවතිය යුතු ද? එම සාරධර්ම ඔවුන් ඉස්ලාමය පිළිබඳ ස්ථාවරයට බලපෑමක් ද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

## යහපත් සාරධර්මවල ශ්‍රේෂ්ඨත්වය

- මිනිසුන් ව වැඩියෙන් ස්වර්ගයට ඇතුළත් කරවනුයේ 'දේව බියබැතිමත්භාවය හා යහපත් සාරධර්ම' බව නබිතුමාණෝ වදාළහ.
- අවසන් දිනයේ මීසාන් තුලාවේ යහපත් දෑ අතුරින් බර වැඩි ම යහපත වන්නේ යහපත් සාරධර්ම බව නබිතුමාණෝ වදාළහ
- මළවුන් කෙරෙන් නැගිටුවන දිනයේ තමාට සමීපතම විශ්වාසවන්තයින් වන්නේ යහපත් සදාචාරාත්මක ස්වභාවයක් ඇති අය බව ඔහු වැඩිදුරටත් පවසයි.

මෙය අවසන් දිනයේ දී මිනිසාගේ යහපත් හා අයහපත් කර්ම මැන බලන සුවිශේෂී තරාදියකි. කවරෙකුගේ යහපත් කර්ම පුරවා ඇති තැටිය බර වැඩි වන්නේ ද ඔහු ස්වර්ගස්ථ වන අතර කවරෙකුගේ අයහපත් කර්ම පුරවා ඇති තැටිය බරින් අධික වන්නේ ද ඔහු අපාගත වන්නේය.

### පැවරුම

පහත දැක්වෙන පද හෝ වාක්‍ය සුදුසු මාතෘකා යටතට යොදන්න.

- සෙසු මුස්ලිම්වරයා දෙස සිනාමුසු මුහුණින් යුතු ව බැලීම
- අල් නුහුද
- අවංකත්වය
- හානිදායක දෑ විදිවලින් ඉවත් කිරීම
- පරෝපකාරීත්වය
- අපේක්ෂාව
- යහපතක් දෑ කිරීම සඳහා අනුන්ට උපකාරී වීම

යහපත් සාරධර්ම

චෛතසික නැමදුම්

## ඉස්ලාමයෙහි යහපත් සාරධර්මවල ක්ෂේත්‍ර

ඉස්ලාමයෙහි සාරධර්ම එක් ක්ෂේත්‍රයකට සීමා නොවී විවිධ ක්ෂේත්‍රවලට විහිදේ.

- අල්ලාහ් කෙරෙහි වූ බියබැතිමත්භාවය හා සද්භාවය වැනි අල්ලාහ් දෙවිඳුන් හා බැඳි සාරධර්ම
- නබිතුමාණන්ට ආදර කිරීම ගරුකිරීම හා මානසික ව හා මිලමුදල්වලින් ඔහුට උදව් කිරීම වැනි නබිතුමාණන් හා බැඳි සාරධර්ම
- ඉස්ලාමීය නීතිරීතිවලට අවනතවීම ගරුකිරීම වැනි ඉස්ලාමීය නීතිරීති හා බැඳි සාරධර්ම
- ඉවසීම හා දරාගැනීම වැනි තම ආත්මය හා බැඳි සාරධර්ම
- අවංකත්වය හා විශ්වාසනීයත්වය වැනි සෙසු උදවිය හා බැඳි සාරධර්ම
- සත්ත්වයින් රැකබලා ගැනීම උන්ට හිංසා නොකිරීම වැනි සත්ත්වයින් හා බැඳි සාරධර්ම
- පරිසරය දූෂණයට ඉඩ නොදී එය සංරක්ෂණය කිරීම රුක් රෝපණය හා පාරිසරික සම්පත් අවභාවිතා නොකිරීම වැනි පරිසරය හා බැඳි සාරධර්ම

අමතර කියවීම

**ඉස්ලාමයේ යහපත් සදාචාරාත්මක ස්වභාවය සහ එහි ගුණාංග මෙන්ම මිනිසුන් කෙරෙහි එහි ධනාත්මක බලපෑම පිළිබඳව වැඩිදුර දැන ගැනීමට, ජාත්‍යන්තර භාෂා කිහිපයකින් උසුල් වෙබ් අඩවියේ ඇති "ඉස්ලාමය සාමයේ ආගමයි" යන පොත කියවන්න.**

පොත භාගත (Download) කිරීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.



**ඉස්ලාමයේ යහපත් සදාචාරාත්මක ස්වභාවය මිනිසුන් සමග ගනුදෙනු කිරීමට සීමා නොවී, සතුන් හා පරිසරය සමග ගනුදෙනු කිරීම දක්වා විහිදේ.**

# ඇගයුම් ප්‍රශ්න

**1** මෙම වීඩියෝ පටය නරඹා මිනිසෙකුගේ ආධ්‍යාත්මික හා සදාචාරාත්මක අවශ්‍යතාවය ඉස්ලාමය කෙතරම් දුරට සපුරන්නේ දැයි විස්තර කරන්න.

වීඩියෝ පටය නැරඹීමට තීරු කේතය (QR Code) පරිලෝකනය (Scan) කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

**2** යහපත් සාරධර්මවල වටිනාකම තහවුරු කරන නබිවදනක් සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

**3** මිනිසුන් සමග කටයුතු කිරීම හා සබැඳි යහපත් සාරධර්මවලට පමණක් සීමා නොවී ඉස්ලාමය සත්ත්වයින් හා පරිසරය හා සබැඳි සාරධර්ම ද පෙන්වා දී ඇත. මෙම ප්‍රකාශය

◯ නිවැරදි ය ◯ වැරදි ය

# ස්වයං ඇගයීම

| | ඉගැන්වීමේ අරමුණු | තක්සේරු අගය | | | |
|---|---|---|---|---|---|
| | | නැත | දුර්වලයි | හොඳයි | ඉතා හොඳයි |
| 1 | ඇඳුම් පිළිබඳ ඉස්ලාමීය මූලික ඉගැන්වීම් කුමක් දැයි ඔබට පැහැදිලි කළ හැකි ද? | | | | |
| 2 | තහනම් වස්ත්‍ර පිළිබඳ ඔබ දන්නෙහි ද? | | | | |
| 3 | ආහාර පානවල මූලික ඉගැන්වීම් කුමක් දැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 4 | තහනම් ආහාර කුමක් දැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 5 | තහනම් පාන වර්ග කුමක් දැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 6 | මූල්‍ය ගනුදෙනුවල මූලික ඉගැන්වීම් පිළිබඳ ඔබ දැනුවත් ද? | | | | |
| 7 | අනුමත නොවන මූල්‍ය ගනුදෙනු කුමක් දැයි ඔබ දන්නෙහි ද? | | | | |
| 8 | ඔබට ඉස්ලාමයේ සැහැල්ලුභාවය හා සහනශීලීත්වය දැනෙන්නේ ද? | | | | |

# අවසානය

අවසානයේ දී අපි අභිනව මුස්ලිම්වරුන්ට පහත මෙසේ අනුශාසනා කරන්නෙමු.

- ධර්මය පිළිබඳ යමක් හැදෑරීමට අවශ්‍ය නම් එය පිළිගත් මූලාශ්‍ර හරහා ම හැදෑරීමට කටයුතු කරන්න. ඒ විද්වතුන් මගින් හෝ ධර්ම දේශකයින් මගින් හෝ කෘති හරහා හෝ හඬපට හෝ වීඩියෝ පට මගින් හෝ විය හැකි ය.
- උගත් දෑ ක්‍රියාවට නංවන්න. මන් ද තමන් උගත් ප්‍රයෝජනවත් දැනුම ක්‍රියාවට නැංවීම මුස්ලිම්වරයෙකුට අනිවාර්ය වන්නේය.
- ඉගෙනගැනීම හා ක්‍රියාවට නැංවීම ක්‍රමානුකූල ව සිදු කිරීම. මන් ද අධ්‍යාපනය හැදෑරීම හෝ යහපත් සාරධර්ම ජීවිතයට මුසු කර ගැනීම හෝ මූලික නැමඳුම් ඉටු කිරීම යනාදිය මිනිසෙකුට එකවර දිනාගත හැකි දේවල් නොවේ. ඒවා එකින් එක හිමි කරගත යුතු දෑ ය.
- ඊමානයට අහිතකර බලපෑම් එල්ල කරනසියලු (අයහපත්) දේවල්වලින් දුරස් වී සිටීම. එය සැක හෝ තෘෂ්ණාව වැනි කරුණු හෝ විය හැකි ය.
- අඛණ්ඩ ව අල්ලාහ් දෙවියන්ගෙන් සත්‍ය මග හා අසත්‍ය අතුරින් සත්‍ය වෙන්කර හඳුනා ගැනීමේ හැකියාව (ප්‍රඥාව) අයැදීම.
- ඉස්ලාමීය තීන්දු රඳා පවතින්නේ ඒවා මත ක්‍රියා කිරීමට කෙනෙකුගේ හැකියාව මතය. එමනිසා, මුස්ලිම්වරයෙකු තමාට දරාගත හැකි ප්‍රමාණයට ඔහුට කළ හැකි ඕනෑම දෙයක් කරයි.
- තම ඊමානය හා සාමය ප්‍රගුණ කරවන යහපත් මුස්ලිම්වරුන් ව ඇසුරු කිරීමට හා තෘෂ්ණාව හා කුකුස ඇති උදවිය සමග වූ ඇසුරෙන් දුරස් වීමට කටයුතු කිරීම.

# අවසන් පරීක්ෂණය

නම:

අවසන් ප්‍රතිඵලය : /ලකුණු 40

අ. පහත පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරන්න. ලකුණු - 15

**1** අල්ලාහ් මිනිසුන් තුළ .......... හා සමානතා ඇති කර ඇත.

- මලාඉකාවරු
- ශයිතාන්වරු
- සත්ත්වයෝ
- මේ සියල්ල

**2** මිනිස් නිර්මාණයේ මූලද්‍රව්‍යය වන්නේ ............. ය.

- ජලය
- පස්
- ගින්දර
- ගල්

**3** ඉස්ලාමයට අනුව සමස්ත මානව වර්ගයා පැවත එනුයේ .............. නම් පියාගෙන් ය.

- ඉබ්‍රාහීම්
- ඊසා
- ආදම්
- මුහම්මද් (සල්)

**4** මිනිසා මිය යාමෙන් අනතුරුව ඔහුගේ ඊලඟ අදියර

- ක්‍රියා හා පරීක්ෂාව
- විනිශ්චය හා ප්‍රතිඵල
- පූර්ණ වියැකීම හා ශූන්‍යවීම
- මේ සියල්ලම

**5** මුහම්මද් නබිතුමාණන්ගේ සම්ප්‍රාප්තියෙන් අනතුරු ව මිනිසුන්ගෙන්.......... හැර අන් කිසිදු ආගමක් අල්ලාහ් දෙවිඳාණෝ පිළිනොගන්නෝය.

- යුදෙව් දහම
- කිතුනු දහම
- ඉස්ලාම් දහම
- හින්දු දහම

**6** ඉස්ලාමයෙහි මූලික කුළුණු සංඛ්‍යාව වන්නේ.............. කි.

- 3
- 4
- 5
- 6

7 ............. හැර ඕනෑ ම පාපයක් තමා අභිමත වූයේ නම් කමා කරන මෙන් අල්ලාහ් දෙවිඳාණෝ අල්-කුර්ආනයේ පවසති.

- සාතනය
- සොරකම
- ශිර්කය
- බොරු කීම

8 අල්කුර්ආනයේ කියවනු ලබන සෑම අක්ෂරයකට ම අල්ලාහ් දෙවිඳාණෝ ...........පිරිනමති.

- එක් පිනක්
- පින් දෙකක්
- පින් හතක්
- පින් දහයක්

9 ............යනු අල්කුර්ආනයට ඇති තවත් නමකි.

- අද්දික්ර්
- අල්ෆුර්කාන්
- අල්කිතාබ්
- මේ සියල්ල

10 'වලම් යකුල්ලහූ කුෆුවන් අහද්' යන අල්කුර්ආන් පාඨයේ 'කුෆුවන්' යන්නෙහි අර්ථය වන්නේ ..........යන්නයි.

- පූර්ණ
- නැමඳුමට පාත්‍රවන්නා
- සමාන
- එක්කෙනෙක්

11 'කුල් අඌදු බිරබ්බිල් ෆලක්' යන අල්කුර්ආන් පාඨයේ 'අල්ෆලක්' යන්නෙහි අර්ථය වන්නේ ....... යන්නයි.

- රාත්‍රී අඳුර
- හිරු උදාව
- අරුණෝදය
- සූර්ය අස්තය

12 'කුල් අඌදු බිරබ්බින් නාස්' යන අල්කුර්ආන් පාඨයේ 'අඌදු' යන්නෙහි අර්ථය වන්නේ ......... යන්නයි.

- මම පිහිට හා රැකවරණය පතමි
- මම නමදිමි තවද සමීප වෙමි
- ප්‍රශංසා හා ආවර්ජනය කරමි
- අවනත හා යටත් වෙමි

13 'මින් ශර්රිල් වස්වාසිල් හන්නාස්' යන අල්කුර්ආන් පාඨයේ 'අල්හන්නාස්' යන්නෙහි අර්ථය වන්නේ ......... යන්නයි.

- හුනියම්කරු
- ඊර්ෂ්‍යාකරු
- ශයිතාන්
- ප්‍රතික්ෂේප කරන්නා

**14** ‘ඉන්න ශානිඅක හුවල් අබ්තර්’ යන අල්කුර්ආන් පාඨයේ ‘ශානිඅක’ යන්නෙහි අර්ථය වන්නේ ......... යන්නයි.

- ඔබ ව රිදවන්නා
- ඔබට ආදරය කරන්නා
- ඔබ ව විශ්වාස කරන්නා
- ඔබ ව ප්‍රතික්ෂේප කරන්නා

**15** කායික නැමඳුමක් වන්නේ

- ආදරය
- අපේක්ෂාව
- සලාතය
- මේ සියල්ල

## අ. පහත දැක්වෙන පද නිවැරදි ගොඩට යොදන්න

ලකුණු -08

තවාෆ් කිරීම

සලාතය

අහාර ගැනීම

කිබ්ලාවට මුහුණ ලා සිටීම

මුත්‍රා පිට කිරීම

වැසිය යුතු ශරීරාංග ආවරණය කිරීම

යමක් පානය කිරීම

නින්දට යාම

වුළුහි අනිවාර්ය දෑ

සලාතයේ කොන්දේසි

පවිත්‍රතාවයට හානිකරවන දෑ

උපවාසය නිශ්ඵල කරවන දෑ

**ඇ. වුළූහි පහත පියවරයන් නිවැරදි ව ආරම්භයේ සිට පෙළගස්වන්න.** **ලකුණු - 6**

| හිසකෙස් ජලයෙන් පිරිමැදීම | දැත් සේදිම | මුහුණ සේදීම | දෙපා සේදීම | දෙසවන් ජලයෙන් පිරිමැදීම | මුව ජලයෙන් කලතා සේදීම හා නාස්පුඩු ජලයෙන් සේදිම |
|---|---|---|---|---|---|

1. 
2. 
3. 
4. 
5. 
6. 

**ඈ. සලාතයෙහි පහත පියවරයන් නිවැරදි ව ආරම්භයේ සිට පෙළගස්වන්න.** **ලකුණු - 6**

| සූරා ෆාතිහා පාරායණය කිරීම | රුකූඋ කිරිම | ආරම්භක තක්බීරය | සලාම් දීම | අත්තහියාත් පාරායණය කිරීම | සුජූද් කිරීම |
|---|---|---|---|---|---|

1. 
2. 
3. 
4. 
5. 
6. 

**ඉ. නිවැරදි වාක්‍ය ඉදිරියෙහි (√) ලකුණ ද වැරදි වාක්‍ය ඉදිරියෙහි (X) ලකුණ ද යොදන්න.** **ලකුණු - 5**

1. මුස්ලිම්වරු රමළාන් මාසයේ දී හජ් වන්දනය ඉටු කරති. ◯
2. මුස්ලිම් පුරුෂ පාර්ශ්වයට රත්‍රන් පැළඳීම තහනම් ය. ◯
3. සූකර මාංශ අනුභවය මුස්ලිම්වරුන් සුදුසු ය. ◯
4. මූල්‍ය ගනුදෙනුවල මූලික සිද්ධාන්තය හලාල් හා අනුමතය යන්නයි. ◯
5. අවසන් දිනයේ නබිතුමාට සමීපතම මූඃමින්වරයා වන්නේ වඩාත් යහපත් සාරධර්ම ඇත්තාය. ◯

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

Sinhala - السنهالية

ඉස්ලාමීය ඉගැන්වීම් අවබෝධ කරගැනීමටත් ප්‍රයෝගික ව පිළිපැදීමටත් රුකුලක් වශයෙන්, සත්‍ය දහම වන ඉස්ලාමය පිළිබඳ හඳුන්වා දෙන්නා වූ හා එහි මූලික ඉගැන්වීම් හා ප්‍රයෝගික කරුණු පහදා දෙන්නා වූ මෙම විෂය නිර්දේශය ඔබ වෙත ඉතා සතුටින් පිළිගන්වන්නෙමු. මෙම විෂය නිර්දේෂයෙහි පහත කරුණු ඇතුළත් වේ:

1- ඉස්ලාමය හා එහි ප්‍රධාන මාතෘකා පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.

2- උතුම් අල් කුර්ආනයේ සමහර කෙටි සූරාවන් පිළිබඳ අර්ථ විවරණය හා පොදුවේ උතුම් අල් කුර්ආනය පිළිබඳ දළ සමාලෝචනය.

3- අනිවාර්ය නැමඳුම්වලට අදාළ නීතිරීති පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.

4- ඉස්ලාමයේ සාරධර්ම, චාරිත්‍ර වාරිත්‍ර හා ගනුදෙනුවලට අදාළ නීතිරීති පිළිබඳ කෙටි පැහැදිලි කිරීම.

පාඨමාලා ඒකක අධ්‍යාපන සැලැස්මකට අනුව බෙදා ඇති අතර එක් එක් පාඩමේ කාලසීමාව නියම කර ඇත. නවක මුස්ලිම්වරුන්ට නව තොරතුරු කටපාඩම් කිරීමට සහ අවබෝධ කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සහ අභ්‍යාස ගණනාවක් ඇතුළත් අධ්‍යාපනික ආකාරයෙන් පාඨමාලාව සැලසුම් කර ඇත, ඊට අමතරව එක් එක් ඒකකය අවසානයේ ඇගයුම් ප්‍රශ්නවලට අමතරව ඉගෙන ගන්නන්ට ඔවුන්ගේ පාඨමාලාව පිළිබඳ අවබෝධයේ මට්ටම තක්සේරු කළ හැකිය.


osoulcenter

www.osoulcontent.org.sa

භාෂා කිහිපයකින් මෙම පොත සහ වෙනත් පොත් බාගත කිරීම සඳහා

OSOUL STORE

osoulstore.com